# දහම් ගැටළු සහ පිළිතුරු

## ඕස්ට්‍රේලියානු භික්ෂුන් වහන්සේ කෙනෙකු විසිනි

පූජ්‍ය එස්. ධම්මික හිමි

# පෙරවදන

දහම් ගැටළු පොතේ නව සංස්කරණයන් සහිතව වඩා විශාල සංස්කරණයක් ලෙස නිකුත් කිරීමට හැකිවීම මට මහත් සතුටකි. එසේම මම සමන්ත තැන්නගේ මහතාට මුළු සංස්කරණයේ පරිවර්තනය කිරීම සම්බන්ධව අතිශය කෘතවේදිව ස්තුතිය පිරිනමමි.  එසේම නර්මදා මහත්මිය අතිරේක ප්‍රශ්න හා උත්තර පරිවර්තනය කරන ලදී.  නව ප්‍රශ්න හා මග හැරුණු කොටස් කිහිපයක් පූජ්‍ය බැරගම පියරතන හිමි පරිවර්තනය කරන ලද අතර, එම මහත්මියට හා උන්වහන්සේට ද ස්තුතිවන්ත වෙමි.  අවසන් පිටපත සකස් කළ පූජ්‍ය කඹුරුපිටියේ අනෝම හිමි , ෆොන්සේකා මහත්මාට හා ෆොන්සේකා මහත්මියට ස්තුතිවන්ත වෙමි. මෙම පොතෙහි සෝදු පත් කියවා නිවැරදි කරන ලද ශ්‍රී ලංකා විද්‍යාලයේ පරිවේණාධිපති ශාස්ත්‍රපති මඩවල ධම්මික ජිනවංශ හිමිපාණන් වහන්සේට කෘතඥතා පූර්වක ස්තූතිය පුද කරමි. ඒ හැම දෙනාටම මම කෘතඥවෙමි.  මෙම පුණ්‍ය කර්මයෙන් ඒ සෑම දෙනාට ප්‍රතිලාභ හා නිවන් සුව ලැබේත්වායි ප්‍රාර්ථනා කරමි.

එස් ධම්මික හිමි
සිංගප්පූරුව
දෙසැම්බර් 2012

# පටුන

1. බුදු දහම යනු කුමක්ද?..............................................4

2. බුදු දහමේ මූලික සංකල්ප........................................15

3. බුදු දහම සහ දේව සංකල්ප....................................19

4. පන්සිල්.............................................................24

5. නැවත ඉපදීම....................................................30

6. භාවනාව ..........................................................40

7. ප්‍රඥාව සහ කරුණාව............................................46

8. නිර්මාංශ ආහාරය...............................................51

9. වාසනාව සහ දෛවය ...........................................54

10. භික්ෂු භික්ෂුණී දෙපිරිස........................................56

11. බෞද්ධ ධර්ම ග්‍රන්ථ .............................................59

12. ඉතිහාසය සහ සංවර්ධනය...................................64

13. බෞද්ධයෙකු බවට පත් වීම..................................69

14. දහම පිළිබඳ බුදුන් වහන්සේගේ කියමන්...................73

# 1. බුදු දහම යනු කුමක්ද?

## ප්‍රශ්නය - බුදු දහම යනු කුමක්ද?

**පිළිතුර** - බුද්ධාගම නැතහොත් බුද්ධ යන වචනය ''බුධි'' යන වචනයෙන් බිඳී ආවකි. එහි තේරුම අවදිව සිටීම යනුයි. එබැවින් බුදු දහම යනු අවදිව සිටීමේ නැතහොත් සිහියෙන් යුක්තව කල් ගෙවීමේ දර්ශනයයි. සිද්ධාර්ථ ගෞතම හෙවත් බුදුන් වහන්සේ විසින් එතුමාට වයස අවුරුදු 35 ක් පිරීමේදී අවබෝධ කරගත් දහම බුදු දහමයි. වසර 2500 වඩා පැරණි බුදු දහම අද ලොව පුරා මිලියන තුන්සිය අසූවකට අධික පිරිසක් අනුගමනය කරති. වසර සියයකට පමණ පෙර නම් ආසියානු රටවල් කිහිපයකට බුදු දහම සීමා වී පැවතුන ද ඉන් පසුව යුරෝපීය රටවලත්, ඇමරිකාවේත් බුද්ධ ධර්මය වේගයෙන් පැතිරී යමින් පවතීයි.

## ප්‍රශ්නය - ඒ අනුව බුදු දහම හුදෙක් දර්ශනයක්ම පමණක්ද?

**පිළිතුර** - දර්ශනය යන්නට ඉංග්‍රීසි භාෂාවෙන් Philosophy යන වචනය යෙදේ. එය Philo යන වචනයේත් sophy යන වචනයේත් එකතුවකි. Philo යන්නෙන් ආදරය හැඳින්වෙන අතර sophy යන්නෙන් බුද්ධිය හැඳින්වේ. Philosophy යන්න බුද්ධියෙත්, ආදරයේත් (දයාවේත්) එක්වීම ලෙස විග්‍රහ කළ විට එමඟින් බුද දහම පිළිබඳ මනා අර්ථ දැක්වීමක් ලැබේ.

බදු දහම ප්‍රඥාව උපරිම ලෙස දියුණු කිරීමටත්, සියලු සත්වයින්ට කරුණාව සහ මෛත්‍රිය දැක්වීමටත් උගන්වයි. ඒ අනුව සලකා බලන කල බුද දහම දර්ශනයකි. සැබැවින්ම උතුම් දර්ශනයකි.

## ප්‍රශ්නය - බුදුන් වහන්සේ යනු කවරෙක්ද?

**පිළිතුර** - ක්‍රි.පූ. 563 දී ඊසාන දිග ඉන්දියාවේ ශාක්‍ය රජ පවුලකට දාව සිදුහත් නමින් දරුවෙක් උපන්නේය. ඉතාමත් සුඛෝපභෝගී ජිවිතයක් ගත කළද සුඛෝපභෝගී ජීවිතයකින් නියම සතුට නොලැබෙන බව ඔහු විසින් අවබෝධ කර ගන්නා ලදි. තමා අවට අත්දකින දුක නැමැති සංසිද්ධියෙන් ඔහු දැඩි සේ සසළ විය. ඒ අනුව මනුෂ්‍ය වර්ගයාට සදාකාලික විමුක්තිය ළගා කර දීමට අධිෂ්ඨාන කර ගත්තේය. වයස අවුරුදු 29 දී ඔහු තම එකම දරුවාත්, බිරිඳත් හැරදා එකල ප්‍රසිද්ධව සිටි ගුරුවරුන් කරා එළඹ ඔවුන්ගේ ඉගැන්වීම් හැදෑරුවේය. එමඟින් බොහෝ කරුණු ඉගෙන ගත් නමුත් සදාකාලික විමුක්තිය පිළිබඳ සත්‍යය දැනගත නොහැකි විය. අවසානයේදී නොයෙකුත් ක්‍රම සහ භාවනා පුහුණුවෙන් පසුව අවිද්‍යාව අතික්‍රමණය කොට සැබෑ විමුක්තිය ඔහු විසින් අවබෝධ කරගන්නා ලදි. එදා පටන් උන්වහන්සේ ''බුදුන්'' නමින් හැඳින්වූහ. ඉන් අනතුරුව තවත් අවුරුදු

45 ක් පුරා තමන් වහන්සේ අවබෝධ කර ගත් ධර්මය උතුරු ඉන්දියාව පුරා ඇවිදිමින් දේශනා කරමින් අති විශාල අනුගාමික පිරිසක් ඇති කළහ. වයස අවුරුදු 80 දී වියපත්ව, රෝගාතුරව නමුත් සතුටින් සහ සාමයෙන් උන් වහන්සේ පිරිනිවනට වැඩියහ.

## ප්‍රශ්නය - එතුමා බුද්ධත්වයට පත් වූ පසු පමණක් බුදුන් නමින් හඳුන්වන ලද්දේ නම් ඊට පෙර කවර නමකින් හැදුන්වුණේ ද?

**පිළිතුර** - බුදුන්ගේ පවුල් නම ගෞතම ය. එයින් අදහස් වන්නේ උසස් ම ගවයා නොහොත් එළදෙන යන්න ය.  ඒ කාලයේ ගවසම්පත ධනයත් බලයත් පළ කරන ලක්ෂණ විය. ඔහුට තබන ලද නම වූයේ සිද්ධාර්ථ ය. එහි අදහස ඉෂ්ටාර්ථ සිද්ධ කරන්නා නොහොත් අරමුණ ඉටු කරන්නා යන්නය. එය රජකු විසින් තම පුතුට දිය යුතු ආකාරයේ නමකි.

## ප්‍රශ්නය - ඔබ වහන්සේ කථා කරන්නේ බුදු රජාණන් වහන්සේ සත්‍ය පුද්ගලයකු ලෙසයි. නමුත් මම බුදුරජාණන් වහන්සේගේ ජීවිත කථාව කියවා තිබෙනවා. එහි ප්‍රාතිහාර්යයන් එමටයි. එහි සඳහන්ව් තිබෙනවා ඔහු ඉපදුනු විට පියවර හතක් ඇවිද්ද බවත් තැබූ සෑම පියවරකට නෙළුම් මලක් පොළවෙන් මතු වී ආ බවත් එහෙම දේවල් සත්‍ය වන්නේ කෙසේ ද ?

**පිළිතුර** - අපි අද චරිත කථා ලියනවාට හා තේරුම් ගන්නා ආකාරයට වඩා වෙනස් ආකාරයකට පැරණි ඉන්දියාවේ චාරිතාපදාන ලියූහ. බුදුරජාණන් වහන්සේගේ ජීවිත කථාව තුළ ප්‍රාතිහාර්ය ඇත. ඒවා වචනාර්ථයෙන් නොව සංකේතාත්මක අර්ථයෙන් සත්‍ය වේ. එමනිසා උදාහරණ ලෙස පියවර හත සංකේතවත් කරන්නේ සප්ත බොඣඡංගයයි. (සතිය,ධම්මවිචය,විරිය, ප්‍රීති, පස්සද්ධි, සමාධි සහ උපේක්ෂාය.) අපට බුදු වීමට,නිවන අවබෝධයට අවශ්‍ය නම් මෙම සප්ත බොජ්ඣංගය දියුණු කළ යුතුයි. නෙළුම් මල් සංකේතවත් කරන්නේ පවිත්‍ර භාවයයි. නෙළුම් මල් මඩ සහිත අපිරිසිඳු වතුරේ හැදී වැඩී පිපුණත් එය වතුරෙන් උඩට මතු වී නිකලැල්ව පිහිටයි. මෙම කථාවෙන් සිද්ධාර්ථ කුමාරයා බුද්ධත්වයට පත්වීම දෛවය කොට උපත ලබා ඇති බව යන අදහස දැක්වීමට යොදා ගෙන ඇත. සමහර විට සාමාන්‍ය භාෂාව යොදා ගෙන කරන අදහස් හුවමාරුවට වඩා සංකේත යොදා ගෙන වඩාත් ඵලදායීවත් ලස්සනටත් අදහස් හුවමාරු කළ හැකියි.

## ප්‍රශ්නය - සිදුහත් කුමරා තම බිරිඳ සහ දරුවා අතහැරයාම යුතුකම් පැහැර හැරීමක් නොවන්නේද?

**පිළිතුර** - සිදුහත් කුමරාට තම බිරිඳත්, දරුවාත් අතහැර යාම ලෙහෙසි පහසු කර්තව්‍යයක් නොවිය. සත්‍ය වශයෙන්ම මේ ගැන සිතමින් ඔහු දීර්ඝ කාලයක්

සිටින්නට ඇත. නමුත් ඔහුට තම පුද්ගලික අභිමතාර්ථයන් කරා එළඹෙන්නේද නැතිනම් සකල ලෝක සත්වයාගේ හිතසුව පිණිස කටයුතු කරනවාද යනුවෙන් තෝරා ගත යුතු මාර්ග දෙකක් තිබිණි. එතුමා කළ පරිත්‍යාගයේ ප්‍රතිඵල වශයෙන් අදත් ලෝකයට වන්නේ මහත් අර්ථයකි. "මහා අභිනිෂ්ක්‍රමණය" යනු යුතුකම් පැහැර හැරීමක් නොව මනුෂ්‍ය ඉතිහාසයේ මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් තවත් මනුෂ්‍යයෙකු විසින් කරන ලද උතුම් කර්තව්‍යයකි.

## ප්‍රශ්නය - බුදුන් වහන්සේ පිරිනිවන් පා ඇති බැවින් උන් වහන්සේ අපට සරණ වන්නේ කෙසේද?

**පිළිතුර** - විදුලි බලය සොයා ගත් මයිකල් පැරඩේ මිය ගියද අදත් අපි ඔහුගේ සොයා ගැනීම්වල ප්‍රතිඵල ලබමු. ලූවි පාස්චර් මිය ගියද අදත් බොහෝ දෙනා ඔහුගේ සොයා ගැනීම් නිසා රෝග බොහෝ ගණනකින් දිවි ගලවා ගනිති. කලාව වෙනුවෙන් මහඟු සේවයක් කළ ලියනාඩෝ ඩාවින්චි මිය ගියද, අදත් රසිකයෝ ඔහුගේ නිර්මාණවලින් සතුටු වෙති. බොහෝ උසස් පුද්ගලයන් සහ වීරයන් මිය ගියද, අදත් අපි ඔවුන්ගේ ජයග්‍රහණවලින් උදම් වෙමු. එසේම බුදුන් වහන්සේගේ ඉගැන්වීම් අදටත් මිනිස් ජීවිත වෙනස් කරයි. වසර 2500 කට පසුවද මිනිස් ජීවිත වෙනස් කළ හැකි වෙනත් කෙනෙකු නොමැතිය.

## ප්‍රශ්නය - බුදුන් වහන්සේ දෙවියෙක්ද?

**පිළිතුර** - කිසිසේත්ම නැත. උන් වහන්සේ තමා දෙවියෙකු, දේව දූතයෙකු හෝ දිව්‍ය පුත්‍රයෙකු ලෙස හඳුන්වා දුන්නේ නැත. බුදුන් වහන්සේ යනු තමන් වහන්සේ විසින්ම ශ්‍රේෂ්ඨත්වයට පත් වූ මනුෂ්‍යයෙකු වන අතර උන් වහන්සේගේ ඉගැන්වීම වූයේද තමන් දෙසූ ධර්මය පිළිපදින ඕනෑම කෙනෙකුට ශ්‍රේෂ්ඨත්වයට පත්විය හැකි බවය.

## ප්‍රශ්නය - බුදුන් වහන්සේ දෙවියෙක් නොවේ නම් මිනිසුන් උන්වහන්සේට වැඳුම් පිදුම් කරන්නේ ඇයි?

**පිළිතුර** - විවිධ හේතූන් නිසා කරන විවිධාකාරයේ වැඳීම් ක්‍රම ඇත. බලවත් විශ්වාසයෙන් දෙවියන් උදෙසා ස්තෝත්‍ර ගයමින්, යටහත්ව, පුද පූජා පවත්වමින් එම යාතිකා සහ පුද පඬුරු නිසා දෙවියන් තමන්ට ප්‍රතිඋපකාර කරතැයි විශ්වාසයෙන් ඇතැම්හු දෙවියන් වඳිති. බෞද්ධයෝ එවැනි අභිලාශයකින් කරනු ලබන වැඳුම් පිදුම් ප්‍රතික්ෂේප කරති.

යම් දෙයකට හෝ යම් කෙනෙකුට දක්වන ගරුබුහුමන් වශයෙන්ද වැඳීම් කරති. ගුරුවරයෙකු පන්ති කාමරයට එන විට අපි නැගී සිටිමු. උසස් නිලධාරීන්ට අපි ආචාර කරමු. ජාතික ගීය වයන විට අපි නැගී සිටිමු. මේ සියල්ලම කිසියම්

දෙයකට හෝ පුද්ගලයෙකුට අපගේ සිතේ පවතින හැඟීම් දනවන ක්‍රියාවෝය. බෞද්ධයන් විසින් කරනු ලබන්නේද මෙවැනි ආකාරයේ වැඳීමකි. කරුණා චරිත සිනාවකින් යුක්තව, පද්මාසනයෙන්, භාවනායෝගීව වැඩ සිටින බුද්ධ ප්‍රතිමාවක් අප තුළ ඇති කරන්නේද, මහත් පරිශ්‍රමයක් දරා හෝ අප සිත් සතන්හිද කරුණාවත්, සාමයත් ඇති කර ගැනීමට අනුබලයකි. දසත පැතිරී යන සුවඳ දුම් සදාචාරාත්මක ගුණ හාත්පස පතුරුවා හැරීමට අනුබල දෙයි. ප්‍රඥාවේ ආලෝකය ගැන මෙනෙහි කිරීමට දැල්වෙන පහන් අපට උපකාරී වේ. සැනෙකින් පරවී යන මල් අනිත්‍යතාව පිළිබඳ පාඩම අපට මතක් කර දෙයි. බුදුන් වහන්සේට වන්දනා කරන කල්හි උන්වහන්සේගේ ඉගැන්වීම්වලින් අපි ලද දැනුමටත්, ශාන්ත ස්වභාවයටත් ආචාර කරමු. බෞද්ධයන්ගේ වන්දනාමානවල ස්වභාවය මෙවැනිය.

## ප්‍රශ්නය - නමුත් බෞද්ධයන් ප්‍රතිමා වන්දනා කරන බව මම අසා ඇත්තෙමි.

**පිළිතුර** - මෙවැනි ප්‍රකාශ ඒවා නගන්නා තුළ වූ වරදවා වටහා ගැනීම පෙන්නුම් කරයි. ප්‍රතිමාව යන වචනයට ඉංග්‍රීසි ශබ්ද කෝෂයේ දැක්වෙන අර්ථය මෙබඳුය. කිසියම් ප්‍රතිරූපයක් හෝ පිළිරුවක් දෙවියන් යැයි සිතා වැඳීම් කරන්නේද එය ප්‍රතිමාවකි. ඉහත සඳහන් කළ පරිදි බෞද්ධයෝ කිසි විටකත් බුදුන් වහන්සේ දෙවි කෙනෙකු ලෙස නොසලකති. එබැවින් ලී කැබැල්ලක් හෝ ගල් කැබැල්ලක් හෝ ලෝහ කැබැල්ලක් දෙවියන් වන්නේ කෙසේද? සෑම ආගමක්ම විවිධ සංකේත, විවිධ සංකල්ප නිරූපණය සඳහා භාවිතා කරයි. ක්‍රිස්තු ධර්මයේ හැටියට මාළුවා යනු ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම නිරූපණය කරන්නෙකි. කුරුසය උන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය සිහි කිරීමට භාවිතා කරයි. බෞද්ධාගමේ බුද්ධ ප්‍රතිමාව යොදා ගනුයේ මිනිසාගේ උත්තරීතර භාවය නිරූපණය කිරීම උදෙසාය. බෞද්ධාගම දෙවියන් කේන්ද්‍ර කොටගත් ආගමක් නොව මනුෂ්‍යයා කේන්ද්‍ර කොට ගත් ආගමකි. එබැවින් බුද්ධ ප්‍රතිමා අපට මතක් කර දෙන තවත් කරුණක් නම් තමන්ට තමාවම පිහිට කොට ගෙන ශ්‍රේෂ්ඨත්වයට පත් වීමට ඇති හැකියාවය. එබැවින් නියම බෞද්ධයන් ප්‍රතිමා වන්දනා කරන්නේය යන්න නිවැරදි නොවේ.

## ප්‍රශ්නය - බෞද්ධයෝ පන්සල්වලදී අරුම පුදුම දේ සිදු කරන්නේ ඇයි?

**පිළිතුර** - බොහෝ දේවල් අපව පුදුමයට පත් කරනුයේ ඒවා පිළිබඳව අපට නිවැරදි අවබෝධයක් නොමැති කල්හිය. අප උත්සාහ ගත යුත්තේ ඒ ගැන අවබෝධ කරගැනීමටයි. කෙසේ වෙතත් යම් යම් දේවල් බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට පටහැනිව මිථ්‍යාවන් මත පදනම් වෙමින් පැවත එන බවද සැබෑය. එවැනි දේවල් බුදු දහමට පමණක් සීමා වී නැත. බුදුන් වහන්සේ පැහැදිලිවත්,

සවිස්තරවත් ධර්ම දේශනා කර ඇති අතර එය වටහා ගැනීමට මිනිසුන්ට නොහැකි වීම බුදුන් වහන්සේගේවත්, ධර්මයේවත් වරද නොවේ.

*"රෝගයකින් පීඩා විඳින කෙනෙක් වෛද්‍යවරයෙක් ළඟ සිටියද, ප්‍රතිකාර ප්‍රතික්ෂේප කරන්නේ නම් එය වෛද්‍යවරයාගේ වරද නොවේ."*

*එසේම, "ක්ලේශයන් හේතුවෙන් යමෙක් කායිකව සහ මානසිකව වද වේදනාවන් විඳින කල්හිත් බුදුන් වහන්සේගේ පිහිට නොපතා සිටීම බුදුන් වහන්සේගේ වරදක් නොවේ." ජා.නි. 28-9*

බෞද්ධාගම හෝ වෙනත් ආගමක් නිවැරදිව පිළිනොපදින අය එය විනිශ්චය නොකළ යුතුය. ඔබට බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ගැන නිවැරදිව දැන ගැනීමට අවශ්‍ය නම්, ඒවා කියවන්න. එය නිවැරදිව දන්නා අයගෙන් අසා දැගන්න.

## ප්‍රශ්නය - නත්තලට සමාන බෞද්ධ උත්සවයක් තිබේද?

**පිළිතුර** - බෞද්ධ සම්ප්‍රදායට අනුව සිදුහත් කුමරුගේ උපත, බුදු බව ලැබීම හා පරිනිර්වානය සිදුව ඇත්තේ වෙසක් මස පුර පසළොස්වක දිනවලය. ඉන්දියානු ක්‍රමයට අනුව වසරේ දෙවන මාසය වෙසක් මාසය වන අතර බටහිර දින දර්ශනයට අනුව එය අප්‍රේල් හා මැයි යන මාස අතර යෙදී ඇත.

ලෝක වාසී සියලු බෞද්ධයන් සෑම වසරකම වෙසක් පොහෝ දිනයේ පන්සල් යෑම, විවිධ උත්සව පැවැත්වීම හෝ පෙහෙවස් සමාදන් වීම හා භාවනාවේ යෙදීම වැනි විවිධ අයුරින් මේ තෙමඟුල සමරනු ලැබේ.

## ප්‍රශ්නය - බෞද්ධ රටවල් මෙතරම් දුප්පත් වීමට හේතුව කුමක්ද?

**පිළිතුර** - දුප්පත් යන්නෙන් ඔබ අදහස් කරන්නේ ආර්ථිකමය පක්ෂය නම් බෞද්ධ රටවල් දුප්පත් බව සැබෑය. නමුත් දුප්පත් යන්නෙන් ඔබ අදහස් කරන්නේ ජීවන රටාව නම් බොහෝ බෞද්ධ රටවල් පොහොසත්ය. උදාහරණයක් ලෙස ආර්ථික වශයෙන් බොහෝ දියුණු ඇමරිකාව ගනිමු. එහි අපරාධ ප්‍රමාණය ලොව ඉහළම අගයක් ගනී. දස ලක්ෂ ගණන් මහලු මිනිස්සු වැඩිහිටි නිවාසවලදී පාළුවෙන්, තනිකමෙන් මියයති. ගෘහාශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා සහ ළමා අපචාර ප්‍රධාන ප්‍රශ්න බවට පත්ව තිබේ. විවාහයන් තුනෙන් එකක් දික්කසාදයෙන් කෙළවර වේ. කාමය ඇවිස්සෙන දේ ඉතා සුලභය. මුදල් අතින් පොහොසත් නමුත් ජීවන රටාව අතින් දුප්පත්ය.

දැන් බුරුමය වැනි ආර්ථික අතින් පසුගාමී රටක් ගනිමු. එහි වැඩිහිටියන්ට තම දරුවෝ ගෞරවයෙන් සළකති. අපරාධ ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් ඉතා අඩුය. දික් කසාද හෝ ගෘහාශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ළමා අපචාරවල තත්ත්වයද ඉතා

අඩුය. සිය දිවි හානි කර ගැනීම් ගැන නොඇසෙන තරම්ය. ආර්ථික අතින් පසුගාමී වුවද ජීවන වට පිටාව ඇමරිකාවට වඩා බොහෝ ඉදිරියෙන් ඇත. ඒ අතරම සියයට 95 ක් බෞද්ධ යැයි කියා ගන්නා ජපානයද ආර්ථික අතින් පොහොසත්ය.

## ප්‍රශ්නය - බෞද්ධයන් පුණ්‍යාධාර කටයුතු කරන අවස්ථා දකින්නට නොලැබෙන්නේ ඇයි?

**පිළිතුර** - සාමාන්‍යයෙන් බෞද්ධයන් තමන් කරන හොඳ වැඩ ගැන කතා කරන්නේ නැත. අවුරුදු ගණනකට පෙර ජපානයේ බෞද්ධ නායකයකු වන නිකියෝ නිර්වානෝට(Nikkyo Nirwano) Templeton ත්‍යාගය පිරිනමන ලද්දේ අන්තර් සාමයික සබඳතා ගැන කටයුතු කිරීම වෙනුවෙනුයි. මෑතදී තායි භික්ෂුවකට මැග්සේසේ ත්‍යාගය ලැබුණේ මත් ද්‍රව්‍ය භාවිතයට එරෙහිව කටයුතු කිරීම නිසා ය. 1987 දී නොර්වේ ළමා සාම ත්‍යාගය කාන්තයපිවට්(Kantayapiwat) නම් තායි භික්ෂුවට හිමි වුණේ අනාථ දරුවන් වෙනුවෙන් කළ සේවය අගය කිරීමටයි. ඒ හැරන්නට තවත් බොහෝ විශාල ප්‍රමාණයේ සමාජ කටයුතු සිදු වන බව කිව යුතුයි. ආරෝග්‍ය ශාලා, ළමා නිවාස, සුළු කර්මාන්ත, ආදී බොහෝ දේ සිදු කරනු ලබයි. ඒ සියල්ලක් ම තමන්ගේ ම යහපත සඳහා කරන දේ වශයෙන් ඔවුහු සලකති.

## ප්‍රශ්නය - බොහෝ බෞද්ධ නිකායන් ඇත්තේ ඇයි?

**පිළිතුර** - රතු සීනි, සුදු සීනි, කැට සීනි, කුඩු සීනි, දියර සීනි යනාදී වශයෙන් නොයෙක් වර්ගවල සීනි ඇත. නමුත් රසවත් බව ඒ හැමටම පොදු ලක්ෂණයකි. විවිධ ස්වරූපයන්ගෙන් අනුගමනය කිරීම සඳහා විවිධ ක්‍රම ඇත. බුදු දහමද එසේමය. ථේරවාද, මහායාන, යෝගචාර, වජ්‍රායන යනාදී වශයෙන් විවිධ නිකාය ඇතත් ඒ හැමටම පොදු ලක්ෂණය නම් සියල්ලෙන්ම නිදහස් වීමයි. අනෙක් අතට නොයෙක් සංස්කෘතීන්ට අනුව හැඩ ගැසීමටද බුදු දහමට හැකිය. විවිධ නිකාය අතර බොහෝ වෙනස්කම් ඇතත් මූලික කරුණ වන චතුරාර්ය්‍ය සත්‍යය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැනි කරුණු අතින් සියලුම නිකායන් එකඟය. සෑම ආගමක් ම විවිධ කොටස්වලට බිඳී ගොස් ඇත. නමුත් අදවන තුරු බෞද්ධ නිකායන් අතර බෞද්ධ ධර්මය පතුරුවා හැරීමට කිසිදු ආකාරයක යුද්ධයක් කෙරී නොමැතිය. එසේම බේදයකින් තොරව බෞද්ධයෝ සෑම පන්සලකටම ගොස් වන්දනාමාන කරති. මෙවැනි සහයෝගයක් සහ අවබෝධයක් සෑම විට ම දුර්ලභ දෙයකි.

## ප්‍රශ්නය - බුදු දහම නිවැරදි බවත් අනෙක් ආගම් වැරදි බවත් ඔබ කියන්නෙහිද?

**පිළිතුර** - බුදුන් වහන්සේගේ ඉගැන්වීම් අවබෝධ කරගත් අයෙක් නම් එසේ නොසිතනු ඇත. අන්‍ය ආගම් පිළිබඳව විවෘත මනසකින් පරීක්ෂා කර බලන

කිසිවෙකුද එසේ නොකියනු ඇත. මෙහිදී ඔබ පළමුව දකිනු ඇත්තේ අන්‍ය ආගම් සහ තම ආගමට පොදු කාරණා පිළිබඳවය. සෑම ආගමක් ම මිනිසාගේ වත්මන් පැවැත්ම අසතුටුදායක බව පිළිගනියි. හැමෝම විශ්වාස කරන්නේ ආකල්ප හා හැසිරීම් රටාව වෙනස් කිරීමෙන් මිනිසාගේ තත්ත්වය උසස් කළ හැකි බවය. සෑම ආගමකින් ම උගන්වන ආචාර විද්‍යාව තුළ ආදරය, කරුණාව, ඉවසීම, ත්‍යාගශීලීභාවය සහ සමාජමය වගකීම් උගන්වන අතර යම් ආකාරයක උත්තරීතර ස්වභාවයක්ද පිළිගනියි.

විවිධ භාෂාවෙන්, විවිධ නම්, විවිධ සංකේත භාවිතා කරමින් ඔවුන් මෙම අදහස් ප්‍රකාශ කරන අතර යමෙක් පටු මනසකින් යුතු නම් තමා අදහන දේවලම පමණක් එල්බ ගතහොත්, අන්‍ය ආගම් නොඉවසීමත්, මානය සහ මමත්වය වැඩීමත් සිදුවේ. ඉංග්‍රීසි, ප්‍රංශ, චීන සහ සිංහල ජාතිකයන් හතර දෙනෙක් තමන් ඉදිරියේ ඇති කෝප්පයක් තමන්ගේ භාෂාවෙන් හඳුන්වන වචනය පමණක්ම නිවැරදි යැයි කියන තර්කයක පැටලී ඇතැයි සිතන්න. ඔවුන් වාද කරමින්, දබර කරමින් ඉන්නා අතර එතැනට පැමිණෙන බෞද්ධයෙකු මෙසේ කියනු ඇත. "කුමන නමකින් හැඳින්වුවද අප මෙයින් ලබා ගන්නේ එකම ප්‍රයෝජනයකි. වාද කිරීම නවතා, දබර කිරීම නවතා ඔබේ පිපාසය සංසිඳුවා ගන්න." බෞද්ධයන් අන්‍ය ආගම් පිළිබඳව දක්වන මතයද මෙබඳුය.

## ප්‍රශ්නය - සමහර පුද්ගලයන් "සියලු ආගම් සමානයි" යැයි කියයි. ඔබ ඔවුන් හා එකඟ වෙනවාද?

**පිළිතුර** - විවිධ ආගමික දර්ශනයන් ඉතා සංකීර්ණ හා විවිධාකාර වන අතර එවැනි කදිම ප්‍රකාශයක් මඟින් සංක්ෂිප්ත කිරීම අපහසුය.

බෞද්ධයෙකුට එම ප්‍රකාශයේ සත්‍යතාවයක් මෙන්ම අසත්‍යතාවයක්ද ඇති බව කිව හැක. එනම් බුද්ධාගමෙහි සර්ව බලධාරී දෙවි කෙනෙකු නැති බව උගන්වන නමුත් ක්‍රිස්තියානි ආගමේ එසේ ඇතැයි උගන්වයි. බුද්ධාගමෙහි චිත්ත පාරිශුද්ධිය ඇති කර ගැනීමෙන් හැම දෙනාටම නිර්වානය අවබෝධ කරගත හැකි බව පැවසුවත්, ක්‍රිස්තියානි ආගමේ ස්ථිර වශයෙන්ම කියන්නේ මෝක්ෂය ළඟාකරගත හැකි වන්නේ ජේසුස් වහන්සේ අදහන අයට පමණක් බවය. මා හිතන්නේ මෙම කරුණු සැලකිය යුතු වෙනස්කම් ලෙසයි. කෙසේ වුවත්, බයිබලයේ ඇති එක්තරා ඉතා විචිත්‍ර කියමනක් මෙසේ දැක්විය හැකිය.

*"මා සුර දූතයන්ගේ හා මිනිසුන්ගේ භාෂාව කතාකරතත්, මා තුළ ආදරය නැතිනම්, මම නාදවන සීනුවක් හෝ ගැටෙන තාලම්පටක් පමණයි. මා තුළ අනාවැකි කීමේ සහ සියලුම අභිරහස් හා විද්‍යාවන් අවබෝධ කර ගැනීමේ හැකියාවත්, කඳු පවා සෙලවිය හැකි ශ්‍රද්ධාවත් ඇතිමුත් මා තුළ ආදරය නැතිනම්, මා හිස් පුද්ගලයෙකි.*

*මා සතු සියලු දෙය දිළින්දන්ට දුන්නත්, මාගේ මුළු සිරුරම ගිනි අවුලා ගත්තත් මා තුළ ආදරය නැති නම් මා ලබා ගත් කිසිවක් නැත. ආදරය ඉවසිලිමත්ය, ආදරය කරුණාවන්තය, ආදරයේ ඊර්ෂ්‍යාව නැත, ආදරයේ ආත්ම වර්ණනාව නැත, ආදරයේ උඩඟුකම නැත, ආදරයේ පරුෂ බව නැත, ආදරයේ ආත්මාර්ථය නැත, ආදරයට ඉක්මනින් තරහ යන්නේ නැත. ආදරය සිදුවූ වැරදි මතක තබා ගන්නේ නැත. ආදරය පාපය හමුවේ සතුටු නොවන නමුත් සත්‍යය හමුවේ සතුටු වෙයි. ආදරය හැම විටම රැක බලාගනියි, සැම විටම විශ්වාස කරයි. එසේම නොපසුබට වීර්යයෙන් යුක්තයි." I Cor* **13-7**

මෙය සම්පූර්ණයෙන් බුද්ධාගමෙහි උගන්වයි. එනම් අපගේ හදවතේ ඇති ගුණවත් බව, අප තුළ පවතින සියලුම අති සාමාන්‍ය බලයන් වලටත්, අනාගතය පැවසීමේ හැකියාවටත්, ශ්‍රද්ධාවේ බලයටත් හෝ අප විසින් කරනා අති මහත් පිළිවෙත්වලටත් වඩා වැදගත් වේ. මේ අනුව බලන විට මූලික ඉගැන්වීම් අතින් බුද්ධාගම හා ක්‍රිස්තියානි ආගම බොහෝ සෙයින් වෙනස්ය. නමුත් ගුණවත් බව, සදාචාරක බව හා හැසිරීම් රටාව අනුව බොහෝ සමානකම් තිබේ.

## ප්‍රශ්නය - බුදු දහම විද්‍යානුකූලද?

**පිළිතුර** - ශබ්ද කෝෂයට අනුව විද්‍යාව යනු පරීක්ෂා කර බලා යම්කිසි සිද්ධාන්තයකට නැතිනම් සොබා දහමේ නියමයකට හෝ නිගමනයකට එළඹිය හැකි දැනුමක්, එහි අතුරු එලයක් හෝ සපුරා අධ්‍යයනය කළ හැකි ඕනෑම විෂයකි.

මෙම අදහස බුදු දහමේ අරමුණ හා නොගැළපෙතත් බුදු දහමේ හදවත බඳු චතුරාර්ය සත්‍යය මෙම අර්ථ දැක්වීමට ගැළපෙන බව පෙනේ.

පළමුවෙනි ආර්ය සත්‍යය වන දුක පිළිබඳව අපට අත්දැකිය හැකිය. එනම් නිවැරදිව පරීක්ෂා කර බලා නිගමනයකට එළඹිය හැකිය.

දෙවන ආර්ය සත්‍යය වන දුකට හේතුව තෘෂ්ණාවයි. ඒ පිළිබඳව අපට පරීක්ෂා කර බලා නිගමනයකට එළඹිය හැකිය. මෙහිදී දුක ඇති වීමේ හේතුව පාර භෞතික සංකල්පවලට හෝ මිත්‍යා මතවලට යොමු කර නිහඬ වීමේ ප්‍රතිපත්තියක් බුදු දහමේ නොමැතිය.

තුන්වන ආර්යය සත්‍යයට අනුව දුක නැති කළ හැක්කේ සර්ව බලධාරී දෙවි කෙනෙක් කෙරෙහි විශ්වාසයක් තබා නොව ඉතාමත් සරල ලෙස දුකට හේතුව නැති කිරීමෙනි. මෙය ප්‍රත්‍යක්ෂ සත්‍යයකි.

සතරවන සත්‍ය වන දුක නැති කිරීමේ මාර්ගය වුවද නැවතත් පාරභෞතික සිද්ධාන්ත මත රඳා නොපවතින නමුත්, කිසියම් නියමිත ප්‍රතිපදාවක් මත රඳා පවතී. නැවතත් මෙම ප්‍රතිපදාව පරීක්ෂාවකට භාජනය කොට නිගමනයකට බැසිය

හැකිය. බුදුදහමද විද්‍යාව මෙන්ම සර්ව බලධාරී දෙවි කෙනෙකු පිළිබඳ සංකල්පයක අවශ්‍යතාවයක් නොදකියි. නමුත් විශ්වයේ ආරම්භයත්, පැවැත්මත් රඳා පවතින ස්වභාවික නියාම විස්තර කරයි. බුදුන් වහන්සේගේ නිරන්තර අවවාදය වූයේ අප අන්ධ ලෙස විශ්වාස නොකළ යුතු බවයි. ප්‍රශ්න කර, පරීක්ෂා කර බලා අපගේම පුද්ගලික අත්දැකීම් මත විශ්වාසය තබා ගන්නා ලෙසයි. විද්‍යානුකූල පදනමක් එහිම අඩංගු නොවේද? උන් වහන්සේ මෙසේ කීහ.

*"ආගමික පොත් පත්වල සඳහන් නිසා හෝ පාරම්පරිකව පැවත එන නිසා හෝ ශුද්ධ වූ ලියවිලිවල සඳහන් නිසා හෝ කටකතා හෝ හුදෙක් තර්කය මත පිහිටා සිට හෝ ගුරුවරයෙකුට ඇති ළැදියාව මත හෝ යමක් විශ්වාස නොකරන්න. නමුත් යමක් ඔබටම හොඳ බව පසක් වේ නම්, අයහපත පිණිස නොපවතී නම්, බුද්ධිමතුන් විසින් පසසනා ලද්දේ නම්, එය පුහුණුවෙන් සැනසීම ලැබේ නම්, එය අනුගමනය කරන්න." (අ.නි 118)*

බුදු දහම සපුරාම විද්‍යාත්මක මත නොපිළිගත්තද, අනෙක් කිසිදු ආගමකට වඩා ශක්තිමත් විද්‍යාත්මක පදනමක් මත ගොඩ නැගී ඇත. විසිවන ශත වර්ෂයේ සිටි මහා විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් බුදු දහම සම්බන්ධව කරන ලද පහත ප්‍රකාශය මේ බව තහවුරු කරයි.

*"අනාගත ආගමක් විය යුත්තේ ලෝක විෂය පිළිබඳව වූ ආගමකි. එමගින් සර්ව බලධාරී දෙවියෙකු පිළිබඳ සංකල්පය ඉක්මවා යාමකුත්, චිරන්තන දෘෂ්ඨිය පිළිබඳ සහ දේව වාක්‍යයන් ප්‍රතික්ෂේප විමකුත් විය යුතුයි. ආගමික හැඟීමක් මත පදනම් වෙමින් සියලු කරුණු කැටිකොට අර්ථාන්විතව විග්‍රහ කරන්නක් විය යුතුයි. බුදු දහම මීට පිළිතුරු සපයයි. නූතන විද්‍යාත්මක අවශ්‍යතාවයන් සමග එක්ව ගමන් කළ හැකි ආගමක් වේද, එය බුදු දහමයි."*

## ප්‍රශ්නය - මා සමහර විට අසා ඇත්තේ බුදු දහම මැද පිළිවෙත නමිනුත් හැඳින්වෙන බවයි. එයින් අදහස් කරන්නේ කුමක් ද?

**පිළිතුර** - බුදුන් වහන්සේ දේශනා කළ ආර්ය අෂ්ටාංගික මාර්ගය මැදුම් මග නමිනුත් හඳුන්වනු ලැබේ. එහි වැදගත් අර්ථයක් ඇත. මාර්ගය අනුගමනය කිරීමේ දී නිසි පරිදි එය කළ යුතුයි. කිසිවක දී අන්තයට නොයා පරිස්සමින් ක්‍රියා කිරීම අවශ්‍ය යි. සමබරතාව රැක ගෙන තමාගේ චරියාව පවත්වා ගෙන යාමට බෞද්ධයා කල්පනා කරයි. පුරාණ රෝමවාසීන්ගේ කියමනක් මතක් කළ හැකියි. හැම දෙයකදී ම මධ්‍යස්ථ විය යුතුයි කියා ඔවුන් කී කතාව බෞද්ධයනුත් පිළිගනු ඇත.

## ප්‍රශ්නය - බුද්ධාගම යනු හින්දු ආගමේ තවත් ප්‍රභේදයක් යැයි මම කියවා ඇත. එහි සත්‍යයක් තිබේද?

**පිළිතුර** - ඇත්ත වශයෙන්ම නැත. බුද්ධාගමට හා හින්දු ආගමට පොදු වූ බොහෝ සදාචාරාත්මක අදහස් පවතියි. එසේම කර්මය, සමාධිය හා නිර්වානයට ආදී පොදු වාග් මාලාවක් ඇති අතර මෙම ආගම් දෙකෙහිම ආරම්භය සිදු වූයේ ඉන්දියාවෙහිය. මෙවැනි සමාන කරුණු නිසා සමහරුන් මෙම ආගම් දෙක එකම හෝ බොහෝ සෙයින් සමාන හෝ යැයි සිතයි. නමුත් අප මේ මතු පිටින් පෙනෙනා සමාන යැයි හැඟෙනා කරුණුවලින් ඔබ්බට බැලූ විට ආගම් දෙකෙහි ඇති වෙනස්කම් පැහැදිලිව දැකිය හැකිය. උදාහරණයක් වශයෙන්, හින්දු ආගමේ උත්තරීතර දෙවිකෙනෙක් ඇතැයි විශ්වාස කරන නමුත් බුද්ධාගමේ එවැනි විශ්වාසයක් නැත. හින්දු ආගමේ කේන්ද්‍රීය ඉගැන්වීමක් වන කුල භේදය බුද්ධාගම විසින් තදින් ප්‍රතික්ෂේප කරයි. ආගමික වත්පිළිවෙත් මඟින් ආධ්‍යාත්මික පිරිසිදු බව ලබා ගැනීම හින්දු ආගමේ වැදගත් ස්ථානයක් ගන්නා නමුත් බුද්ධාගමේ එවැන්කට කිසිම ඉඩක් නැත.

බුදුන් වහන්සේ හින්දු පූජකවරුන් වන බ්‍රාහ්මණයන්ගේ ඉගැන්වීම් විවේචනය කර ඇති බොහෝ අවස්ථා අපට ත්‍රිපිටකයේ දැකිය හැකි අතර එසේම ඔවුන්ද සමහර අවස්ථාවල බුදුන් වහන්සේව තදින් විවේචනය කර තිබේ. බුද්ධාගම හා හින්දු ආගම එකම නම් මෙය සිදු විය නොහැකි දෙයකි.

## ප්‍රශ්නය - නමුත් බුදුන් වහන්සේ හින්දු ආගමේ එන කර්ම සංකල්පය අනුකරණය කරනවා නේද?

**පිළිතුර** - හින්දු ආගමේ කර්ම සංකල්පය මෙන්ම පුනර්භවය පිළිබඳවත් උගන්වනු ලැබේ. නමුත් මේ පිළිබඳව ඔවුන්ගේ ඉගැන්වීම්, බෞද්ධ ඉගැන්වීමට වඩා බොහෝ සෙයින් වෙනස්ය. උදාහරණයක් ලෙස, හින්දු ආගමට අනුව කර්මය විසින් අපගේ අනාගතය නිශ්චිත කර ඇති අතර බුද්ධාගමට අනුව කර්මය යනු අපට බලපාන හේතු භූත තත්වයකි.

හින්දු ආගමට අනුව භවයෙන් භවයට ගමන් කරන සදාතනික ආත්මයක් තිබේ. නමුත් බුද්ධාගමට අනුව පුනර්භවය සිදුවන්නේ නිරන්තරයෙන් වෙනස් වෙමින් ගලායන චිත්ත ශක්තියෙන් (විඥානය) වන අතර එවැනි සදාතනික ආත්මයක් තදින් ප්‍රතික්ෂේප කරයි.

ඉහත දක්වා ඇත්තේ කර්ම සංකල්පය හා පුනරුප්පත්තිය පිළිබඳව ආගම් දෙකෙහි ඇති බොහෝ වෙනස්කම්වලින් කිහිපයක් පමණි. කෙසේ වෙතත් බුද්ධාගම හා හින්දු ආගම සර්ව සම ලෙස සැලකුවත් බුදුන් වහන්සේ කිසිදු සලකා බැලීමකින්

තොරව අන්‍යන්ගේ අදහස් අනුකරණය කෙරූ බව මෙයින් පෙන්වා දීමට නුපුළුවන. දෙදෙනෙකු විසින් වෙන් වෙන්ව එකම දෙයක් සොයා ගත් අවස්ථා තිබේ. මෙයට හොඳම උදාහරණයක් ලෙස 1858 දී සිදුවූ පරිණාමවාදය සොයා ගැනීම සැලකිය හැක. චාල්ස් ඩාවින් ඔහුගේ "ජීවයේ සම්භවය" (Origin of Species) නැමැති ප්‍රසිද්ධ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමට සුළු කාලයකට පෙර ඔහුට පරිණාමවාදය පිළිබඳ ඔහුගේ එම මතයම පරිකල්පනය කළ ඇල්ෆ්‍රඩ් රසල් නැමැත්තෙකු හමුවිය. ඩාවින් සහ රසල් එකිනෙකාගේ අදහස් අනුකරණය නොකළ අතර, එකම සංසිද්ධි වෙන වෙනම අධ්‍යයනය කිරීමෙන් එකම නිගමනයකට පැමිණ තිබේ. එලෙස සත්‍ය වශයෙන් එකම නොවූවත්, හින්දු ආගමේ හා බුද්ධාගමේ එන කර්මය හා පුනරුප්පත්තිය පිළිබඳ සංකල්ප එකක්ම ලෙස සැලකුවත්, බුදුන් වහන්සේ එසේ අනුකරණය කළායැයි කීමට සාධකයන් නොමැත.

සත්‍යය නම් හින්දු සෘෂිවරුන් භාවනාව මගින් දියුණු කළ චිත්ත ශක්තියෙන් කර්මය හා පුනර්භවය පිළිබඳව දළ අදහසක් ලබාගත් අතර පසුව බුදුන් වහන්සේ විසින් මේ කරුණු පිළිබඳව පරිපූර්ණ අර්ථදැක්වීමක් කිරීමයි.

# 2. බුදු දහමේ මූලික සංකල්ප

## ප්‍රශ්නය - බුදු දහමේ මූලික සංකල්ප මොනවාද?

**පිළිතුර** - කරත්ත රෝදයක පිටත වළල්ල සහ ගරාදි වැට එහි කේන්ද්‍රයට සවි වන්නාක් මෙන් බුදුන් වහන්සේගේ බොහෝ ඉගැන්වීම් චතුරාර්ය සත්‍යය කේන්ද්‍ර කොට ගෙන පවතී. ''චතු'' යනු සතරයි. ''ආර්ය'' යනු ශ්‍රේෂ්ඨ උතුමන් අවබෝධ කරගත් දේ යන්නයි. ''සත්‍ය'' යනු පරමාර්ථ වශයෙන් පවතින ධර්මතා යනුයි.

## ප්‍රශ්නය - පළමුවෙනි ආර්ය සත්‍යය කුමක්ද?

**පිළිතුර** - පළමුවෙනි ආර්ය්‍ය සත්‍යය ජීවිතය දුක් සහගත බව පිළිගැනීමයි. ජීවත් වීම වෙනුවෙන් අප දුක් විඳිය යුතුයි. කිසිදු දුකක් නොවිඳ ජීවත් විය නොහැකිය. ලෙඩ රෝග, අනතුරු, වෙහෙස, මහලු අවධිය සහ අවසානයේ සිදුවන මරණය ද නිසා අපට කායිකව දුක් දරාගත යුතුව ඇත. තනිකම, අසහනය, භය, ව්‍යාකූලත්වය, බලාපොරොත්තු සුන් වීම, තරහ වැනි කරුණු නිසා මානසික දුක්ද දරා ගත යුතුය.

## ප්‍රශ්නය - මෙම අදහස අශුභවාදී නොවන්නේද?

**පිළිතුර** - අශුභවාදී යන්නෙහි තේරුම නම් කුමක් සිදු වුවද එහි නරක අංශයම සිතීමේ ස්වභාවය හෝ යහපතට වඩා අයහපතම සිදු වන බව සිතීමයි. බුදු දහම මෙම අන්ත දෙකම බැහැර කරයි. එසේම සැප යනුවෙන් යමක් නැතැයි කියා ප්‍රතික්ෂේප කරන්නේද නැත. ඉතා සරල ලෙස බුදු දහමේ උගන්වන්නේ ජීවත් වීමේදී ශාරීරික හා මානසික දුක් විඳීම ස්වභාවික බවය. එය හුදෙක් ප්‍රකාශයකට වඩා ප්‍රතික්ෂේප කළ නොහැක්කකි. බෝහෝ ආගම්වල මූලික පදනම මිත්‍යා ප්‍රබන්ධයක් හෝ විශ්වාසයන් මත ගොඩ නැගී ඇත්තේ විශ්වාස කළ නොහැකි හෝ පිළිගැනීමට අසීරු අයුරිනි. නමුත් බුදු දහම හැම කෙනෙකුම හොඳින් දන්නා, අත්දකින එසේම ජය ගැනීමට මහත් පරිශ්‍රමයක් දරන, බිඳලිය නොහැකි, අත්දැකීමෙන් දැනගත හැකි කරුණක් මතින් ආරම්භ වී ඇත. එබැවින් බුදු දහම යනු සෑම පුද්ගලයෙකුගේම සන්තානය සමග බැඳී පවතින දුක තේරුම් ගෙන එය නැති කිරීමට මාර්ගය පහදා දෙන එකම විශ්ව ආගමයි.

## ප්‍රශ්නය - දෙවන ආර්ය සත්‍යය කුමක්ද?

**පිළිතුර** - දෙවන ආර්ය සත්‍යය යනු තණ්හාව නිසා සියලුම දුක් ඇති වන බව තේරුම් ගැනීමයි. මානසික දුක් ගැන සිතන විට තණ්හාව නැති නම් දැඩිව අල්ලා ගැනීම දුක්වලට කෙතරම් හේතුවක්ද යන්න පැහැදිළිය. අපට යමක් අවශ්‍යය. නමුත් එය නොලැබුණු විට අපි අසහනයට පත් වෙමු. අන් අය අප පතන අයුරින්

ජීවත් වනවාට අප කැමති වන අතර ඔවුන් එසේ නොකරන කල්හි අපි කම්පා වෙමු. එපමණක් නොව අප කැමති දෙයක් අපේක්ෂිත පරිදි ලැබුණද එයද නියම සතුටක් ලබා නොදෙයි. අනතුරුව අපි ලැබූ දේ පිළිබඳව වෙහෙසට පත් වී වෙනස් ආකාරයක දෙයක් පතමු.

ඉතා සරල ලෙස මෙසේ කිව හැකිය. එනම් දෙවැනි ආර්ය සත්‍යයට අනුව ඔබ කැමති දේ ලැබීම නියම සතුට සහතික නොකරයි. අවශ්‍ය දේවල් පිළිබඳව කරදර වනවාට වඩා නිරන්තරයෙන්ම අවශ්‍ය දේ පිළිබඳව අදහස් වෙනස් වෙමින් යයි. ආශාව අපගේ සංතෘෂ්ඨිය පැහැර ගනී.

**ප්‍රශ්නය - ආශාව සහ තෘෂ්ණාව කායික දුකට මුල් වන්නේ කෙසේද?**

**පිළිතුර** - කෙනෙකුගේ ජීවිත කාලය තුළදී ඒ ඒ දේවල් ලබා ගැනීමට ඇති දැඩි ආශාව බලගතු ශක්තියකි. එයින් පුද්ගලයා නැවත නැවත උපදියි. නැවත ඉපදුනු කෙනෙකුට ශරීරයක් ඇතත්, එම ශරීරය අනතුරුවලටත්, ලෙඩ රෝගවලටත්, වැඩ කිරීමෙන් වෙහෙසටත් පත් වී වයසට යාමෙන් අවසානයේ මරණයටත් භාජනය වූවකි. ඒ අයුරින් තෘෂ්ණාව නැවත උප්පත්තියට මග පාදයි.

**ප්‍රශ්නය - එය එසේ නම් හොඳය. ආශාව සපුරා ප්‍රහීණ කළ විට අප නැවත යමක් ලබා ගන්නේ හෝ ඒ කරා ළං වන්නේ නැත.**

**පිළිතුර** - එය සත්‍යයකි. නමුත් බුදුන් වහන්සේ විසින් කියන ලද්දේ අප තුළ ඇති ආශාවන් තණ්හාව (නිරන්තර අසන්තෝෂය), නොසෑහීම, නිත්‍යව පවතින දැඩි ආශාව වඩ වඩාත් දුක ඇති කිරීමට හේතු වන බවයි. එබැවින් අප එය නැති කළ යුතුයි. අවශ්‍ය සෑම දේම අත්‍යවශ්‍ය නොවන බැවින් මහත් පරිශ්‍රමයක් දරා හෝ ඒ තත්ත්වයට අනුව අත්‍යවශ්‍ය දේ පමණක් ලබා ගැනීමට උත්සුක විය යුතුයි. උන්වහන්සේ දේශනා කරන ලද්දේ අපට අත්‍යවශ්‍ය දේවල සීමාවක් ඇතත් අවශ්‍ය දේවල සීමාවක් නොමැති බවය. එය පතුළ නොපෙනෙන ආගාධයක් වැනි බවය. අත්‍යවශ්‍ය දේවලත් මූලික අවශ්‍යතාවයන් ඇති අතර ඒවා සපුරා ගැනීම වෙනුවෙන් පමණක් වෙහෙසීම සෑහේ. ආශාවන් ක්‍රමයෙන් අවම කර ගත යුතුය. අවසානයේදී ජීවිතයේ අර්ථය කුමක්ද? එනම් සතුට ළඟා කර ගැනීමයි.

**ප්‍රශ්නය - පුනරුප්පත්තිය සනාථ කළ හැකි සාධක ඇත්ද?**

**පිළිතුර** - මේ සඳහා සෑහෙන තරම් සාක්ෂි ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව සළකා බලමු.

**ප්‍රශ්නය - තුන්වැනි ආර්ය සත්‍යය කුමක්ද?**

**පිළිතුර** - මෙමගින් දුක නැති කළ හැකි බවත් සැනසීම ළඟා ගරගත හැකි බවත් කියවේ. සමහර විට චතුරාර්ය්‍ය සත්‍යයට අයත් වැදගත්ම කාරණයද මෙය විය හැකිය. මක්නිසාද යත් බුදුන් වහන්සේ පෙන්වන මාර්ගයේ සැබෑ සතුටත්, සංතෘෂ්ඨියත් ලද හැකි බැවිනි. වැදගත් කමක් නැති තණ්හාව අතහැර දමා දිනක් පාසා මොහොතින් මොහොත අසහනයෙන් තොරව ඉවසීමෙන් බය, ක්‍රෝධය, තරහව නිසා එළඹෙන ප්‍රශ්නවලට මුහුණ දෙමින් සැබෑ සතුටකින් සහ නිදහසකින් විසිය හැකිය. අප සැබෑ ලෙසින් ජීවත් වූවා වන්නේ එවිට පමණය. මක්නිසාද යත් එවිට අපි අපගේ ආත්මාර්ථකාමී අවශ්‍යතා ඉටුකර ගැනීමට ගොස් සිතට මහත් පීඩාවක් ඇතිකර නොගෙන අන් අයට උදව් උපකාර කිරීමටත් වේලාව යොදනු ඇත. මෙසේ කොට යමෙක් සියලුම දුක්වලින් මිදුණේද, හේ නිර්වාණය අවබෝධ කර ගත්තා වෙයි.

## ප්‍රශ්නය - නිවන යනු කුමක්ද?

**පිළිතුර** - නිවන යනු කාලය හා අවකාශය ඉක්මවූවක් බැවින් ඒ ගැන කතා කිරීමට තබා සිතීමටත් අපහසු කාරණයකි. වචන සහ සිතිවිලි ප්‍රමාණවත් වන්නේ කාලය සහ අවකාශය යන මානයන් තුළ කරන විග්‍රහයන්ට පමණි. නමුත් නිවන මෙම මතයන්ට වඩා බොහෝ ඉදිරියෙන් වූවක් බැවින් එහි චලනයන්, වයසට යාම්, මරණයට පත්වීම් නොමැතිය. එබැවින් නිවන ලෝකෝත්තරය. මක්නිසාද යත් නිවනට අවකාශයක බලපෑමක් නොමැති නිසාය. නිවනට කර්ම ශක්තියක් නොමැතිය. සීමාවක් නැත.

මමත්වය සහ මමත්වය වන කිසිවක් එහි නොමැත. එබැවින් අනන්තය. බුදුන් වහන්සේ සහතික ලෙස ප්‍රකාශ කළේ නිවන යනු ලෝකෝත්තර සුවයක් බවයි. උන්වහන්සේ මෙසේ කීහ.

*"නිවන උතුම්ම සැපතයි" (ධ.ප 204)*

## ප්‍රශ්නය - නිවන ඇති බවට සාධක තිබේද?

**පිළිතුර** - නිවන ඇති බවට සාධක නොමැතිය. නමුත් නිවන ඇති බව අනුමානයෙන් තේරුම් ගත හැකිය. කාලය සහ අවකාශය යන මානයන්ගේ බලපෑමට යටත් අප අත්දකින ස්වභාවයක් (ලෝකය වැනි) තිබෙන නිසා එවැනි මානයන්ගේ බලපෑමට යටත් නොවූ තත්ත්වයකුත් තිබිය හැකියි. අනෙක් අතට නිවන අපට ඔප්පු කර පෙන්විය නොහැකි දෙයක් වුවද බුදුන් වහන්සේ කේවට්ට ගෘහපතියාට නිවන මෙසේ හඳුන්වා දුන්හ.

"පටන් ගැනීම්, අවසන් වීම්, ආදී කොන් නැත්තා වූ හැම කර්මස්ථාන මාර්ගයකින්ම යා හැකි බැවින් හැම පැත්තෙන්ම බැස ගැනීමට තොට ඇත්තා වූ ඇසට

නොපෙනෙන්නා වූ ඥානයෙන්ම දත යුතු වූ තැනක් ඇත. හැම තැනම ඇත්තා වූ ආපෝ, පඨවි, තේජෝ, වායෝ යන මේ ධාතූහු එහි නැත. හැම තැනම ඇත්තා වූච, දික් වූද, කොට වූද, කුඩා වූද, මහත් වූද, හොඳ වූද, නොහොඳ වූද, වස්තූහු එහි නැත. එයට පැමිණ නාම රූප දෙක ඉතිරි නැතිවම නිරුද්ධ වෙයි..."

අප එම තත්ත්වයට පැමිණි දිනක ඒ පිළිබඳව දැනගනු ඇත. එතෙක් අපට කළ හැක්කේ නිරන්තර පුහුණුවේ යෙදීමම පමණෙකි.

## ප්‍රශ්නය - හතරවෙනි ආර්ය සත්‍යය කුමක්ද?

**පිළිතුර** - හතරවෙනි ආර්ය සත්‍යය දුක් නැති කිරීමේ මාර්ගයයි. මෙය ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වේ. එනම්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් වායාමය, සම්‍යක් සතිය සහ සම්‍යක් සමාධියයි.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය බෞද්ධයන් නිරන්තරයෙන් පුහුණු විය යුතු මාර්ගයයි. බුද්ධිමය, සදාචාරාත්මක, සමාජීය, ආර්ථික සහ මනෝ විද්‍යාත්මක ආදී වශයෙන් ජීවිතයේ සෑම පැත්තක්ම මෙමගින් ආවරණය කරනු ලබන බවත් විශේෂයෙන් පෙනෙනු ඇත. මේවා පුද්ගලයෙකුගේ ජීවිතයත්, ආධ්‍යාත්මයත් දියුණු කිරීමට මග පාදන කරුණුය.

# 3. බුදු දහම සහ දේව සංකල්පය

## ප්‍රශ්නය - බෞද්ධයෝ දෙවියන් කෙරෙහි විශ්වාසය තබත්ද?

**පිළිතුර** - බෞද්ධයෝ දේව සංකල්පය විශ්වාස නොකරති. වර්තමාන සමාජ සහ මනෝ විද්‍යාඥයන් මෙන්ම බුදුන් වහන්සේද ආගමික අදහස් විශේෂයෙන් දෙවියන් පිළිබඳ අදහස බිහි වී ඇත්තේ බය මුල් කරගෙන බව කීහ.

*"බියෙන් තැති ගත් මිනිස්සු පර්වතද, වන, ආරාමද, වෘක්ෂද, චෛත්‍යයද බොහෝ සේ සරණ යෙත්" (ධ.ප 118)*

ආදි මිනිසාට තමා අවට ලෝකය අනතුරු සහගත සහ තමාට විරුද්ධ සහගත ලෙසින් පෙනින. වන සතුන්ට ඇති බිය, අවශ්‍ය පමණට ආහාර නොලැබීම, අනතුරු සහ ලෙඩ රෝගද, අකුණු සහ හෙණ හඬ, ගිනි කඳු වැනි ස්වභාවික හේතූන්ද නිරන්තරවම ඔවුන්ගේ ජීවිත සමග බැඳී පැවතුණි. තමාට කිසිදු සහනයක් නොලැබුණු බැවින් ඔවුන් විසින් දෙවියන් පිළිබඳ අදහස නිර්මාණය කර ගන්නා ලදි. එමගින් හොඳ කාලවල සහනයත්, නරක කාලවලදී ධෛර්යයත් උපදවා ගැනීමට හැකි විය. අද පවා සමාජයේ ඉතා අවදානම් අවස්ථාවන්හිදී මිනිසුන් වඩ වඩාත් ආගමට නැඹුරු වීමක් දක්නට ලැබේ. එසේම එම කාලවලදී දෙවියන් පිළිබඳ විශ්වාසය ඔවුනට මහත් ශක්තියක් ලබා දෙන බවකුත් කියනු ඇසේ. සමහරෙක් එකම දෙවි කෙනෙකුට යාඥා කරමින් එම යාඥාවන් නිසා තමනට අවශ්‍ය අවස්ථාවන්හිදී පිළිසරණක් ලැබූ බවත් කියති. මේ සෑම කරුණයකින්ම බුදුන් වහන්සේ දේව සංකල්පය ගැන කියූ කරුණු තහවුරු වෙයි. එනම් මිනිසුන් දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය භීතිය පදනම් කර ගත්තක් බවය. බුදුන් වහන්සේ වදාරන ලද්දේ අපගේ බිය හඳුනා ගැනීමට උත්සාහ දරා, ආශාවන් තුනී කරගෙන, නිහඬව, අපට වෙනස් කළ නොහැකි දේට මුහුණ දෙන ලෙසිනි. උන් වහන්සේ බිය පළවා හැරියේ යථාර්ථවාදී නොවූ බියකින් නොව සත්‍යය වටහා ගැනීමෙනි.

දේව සංකල්පය සාධනය කළ හැකි සාක්ෂි නොවීමද බුදුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කිරීමට හේතු වන්නට ඇත. ආගම් බොහෝ ගණනක් තමන්ගේ දෙවියන් එකම දෙවියන් බවත් අන්‍ය දෙවියන් නොමැති බවත් ශුද්ධ වූ ග්‍රන්ථ අනුසාරයෙන් පෙන්වයි. සමහරු දෙවියන් වහන්සේ පුරුෂ ලිංග බවත් තවත් අය උන් වහන්සේ ස්ත්‍රී ලිංග බවත් තවත් සමහරු උන් වහන්සේ මේ දෙකටම අයත් නැති බවත් කියති. තම දෙවියන් ඉන්නා බවට අවශ්‍ය තරම් සාක්ෂි ඇතැයි පවසන අතරතුර අන්‍ය අනුගාමිකයන් ඔවුන්ගේ දෙවියන් ඉන්නා බව කියන විට සරදම් කරති. සත්‍ය බවට පත් නොවුණු, යථාභූත වශයෙන් පිළිනොගැනුණු, විද්‍යාමාන නොවූ, බිඳලිය නොහැකි සාක්ෂි නැති මෙම මතය වෙනුවෙන් ආගම් බොහෝ ගණනක් සියවස්

ගණනාවක් ගත කොට ඇත්තේද නැති සාක්ෂි ගොඩනැගීම උදෙසාය. බෞද්ධයෝ පිළිගත හැකි සාක්ෂි ලැබෙනතුරු මේ ගැන පිළිනොගනිති.

බුදුන් වහන්සේ දේව සංකල්පය පිළිනොගැනීමට අදාළ තුන්වෙනි කරුණ නම් විශ්වාසය යනු අත්‍යවශ්‍ය කරුණක් ලෙස නොසළකනු ලැබීමයි. විශ්වයේ ආරම්භය විස්තර කිරීම සඳහා දේව සංකල්පය අත්‍යවශ්‍ය බව යම් යම් අය සිතති. මෙය වැරදි මතයකි. දේව සංකල්පයෙන් තොරව විශ්වය නිර්මාණය වී ඇති අන්දම අද විද්‍යාව මගින් ඉතා පැහැදිලිව පහදා දී තිබේ. අර්ථාන්විතව තෘප්තිමත් ජීවිතයක් ගතකළ හැකි බව පැහැදැළිව පහදා දී තිබේ. අර්ථාන්විතව තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා දෙවියන් පිළිබඳ විශ්වාස නොකරන දස ලක්ෂ ගණන් නිදහස් චින්තකයන්ද, බොහෝ බෞද්ධයෝද සිටින අතර ඉතා ප්‍රයෝජනවත්, තෘප්තිමත් සහ අර්ථවත් ජීවිත ගත කරන අය අනන්තවත් සිටිති. තවත් සමහරු දෙවියන්ගේ බලය පිළිබඳ විශ්වාසය වැදගත් බව කියනුයේ මිනිසුන්ට තනිව නැගී සිටීමේ ශක්තියක් නැතැයි සිතමිනි. තවත් වරක් කිව යුත්තේ සත්‍යය මීට පටහැනි බවය. අති විශාල බාධාවන්, දුබලතා මහත් වාසි සහ අමාරුකම් දෙවියන් පිළිබඳ විශ්වාසයකින් තොරව ජයගත් අය පිළිබඳව අපට නිරන්තරයෙන්ම අසන්නට ලැබේ. තවත් පිරිසකගේ මතය නම් දෙවියන් කෙරෙහි විශ්වාසයකින් තොරව විමුක්තියක් ලැබිය නොහැකි බවය. නමුත් බෞද්ධයෝ එම සංකල්පය පිළිනොගනිති. බුදුන් වහන්සේ තම අත්දැකීම් පදනම් කරගෙන දේශනා කළේ මනුෂ්‍යයාට තම මනස පිරිසිදු කරගනිමින්, දයාව, මෛත්‍රිය, කරුණාව, බුද්ධිමත්ව පතුරුවා හැරිය හැකි බවය. බුදුන් වහන්සේ අපගේ අවධානය ස්වර්ගයෙන් හදවතට මාරු කොට සත්‍ය අවබෝධය තුළින්ම අපේ ප්‍රශ්න විසඳා ගැනීමට යොමු කළහ.

## ප්‍රශ්නය - දෙවියන් නොමැතිනම් විශ්වය මෙසේ පවතින්නේ මන්ද?

**පිළිතුර** - මෙම ප්‍රශ්නය විසඳීමට සෑම ආගමකම මිත්‍යා කතන්දර මගින් උත්සාහයක් ගෙන තිබේ. මනුෂ්‍යයන් බොහෝ දේ නොදැන සිටි අතීතයේදී මිත්‍යා කතන්දරවලින් එම අවශ්‍යතාවය සපුරා ගත හැකි විය. නමුත් භෞතික විද්‍යාව, අභ්‍යවකාශ විද්‍යාව, භූගෝල විද්‍යාව දියුණු විසි එක් වෙනි සියවසේදී එම උවමනාවන් ප්‍රතික්ෂේප වී හමාරය. වර්තමානයේදී විද්‍යාව මගින් දෙවි කෙනෙකුගේ බලපෑමෙන් තොරව විශ්වය නිර්මාණය වී ඇති අයුරු පහදා දීමට සමත් වී තිබේ.

## ප්‍රශ්නය - විශ්වයේ ආරම්භය ගැන බුදුන් වහන්සේ කීවේ කුමක්ද?

**පිළිතුර** - නවීන විද්‍යානුකූල මතයට අනුරූප වන අයුරු බුදුන් වහන්සේ විශ්වයේ ආරම්භය ගැන කිවූ දේ පුදුම සහගතය. අග්ගඤ්ඤ සූත්‍රයේදී විශ්වය විනාශ වී ගණනය කළ නොහැකි වසර මිළියන ගණනක ඇවෑමෙන් නැවතත් වර්තමානයේ

තිබෙන අයුරින් නිර්මාණය වන බව කීහ. පළමු ජීවියා ජලයේ ඉපදින, තවත් ගිණිය නොහැකි කාල සීමාවකදී සරල සංසිද්ධි සංකීර්ණ බවට පත්වීමෙන් සත්වයා නිර්මාණය වී ඇත. මෙම සියලු දේම සිදු වන්නේ ආරම්භයක් හෝ අවසානයකින් තොරව ස්වභාවික හේතු මත සිදුවන වෙනස් වීමෙනි.

## ප්‍රශ්නය - දෙවියන් පිළිබඳ සාක්ෂි නැති බව ඔබ විසින් කියන ලදි. එසේ නම්, අද්භූත දේ සිදු වන්නේ කෙසේද?

**පිළිතුර** - බොහෝ දෙනෙකු අද්භූත සිදුවීම් දෙවියන් විසින් කරනු ලබන බවට සළකති. යාඥාවන් මගින් රෝග සුව වෙන බව අපි අසා ඇත්තෙමු. නමුත් රෝහලකින් හෝ වෛද්‍යවරයෙකුගෙන් ඒ පිළිබඳව එක සාක්ෂියකදු අසා නැත්තෙමු. අද්භූත ලෙස සමහරුන් අනතුරුවලින් බේරුණු බවද අසා ඇත්තෙමු. නමුත් එවැනි දේ පිළිබඳව පවා ඇසින් දුටු සාක්ෂි නොමැතිය. යාඥාවෙන් අන්ධයන්ට ඇස් පෙනීම ලබා දීම්, කොරුන් ඇවිද්ද වීම් කළ බවට දුෂ්‍යමාන ආරංචි පැතිරුනද එවැනි අද්භූත දේ පිළිබඳව ඇති සත්‍ය භාවය සැක සහිතය. කෙසේ වෙතත් යම් විටෙක නොසිතූ දේ සිදුවෙයි. නමුත් ඒවා විග්‍රහ කිරීමට අපට ඇති නොහැකියාව නිසා දෙවියෝ එවැනි දේ කරතැයි සිතීම නිවැරදි නොවේ. එමගින් සත්‍ය වශයෙන් ඔප්පු වන්නේ අපගේ දැනුම අසම්පූර්ණ බවම පමණකි. නූතන විද්‍යාව දියුණුවට පෙර ලෙඩ රෝගවල සැබෑ හේතුව නොදත් බැවින් ඒවාද දෙවියන් විසින් දඬුවම් ලෙසින් පනවන ලදැයි සිතූහ. දැන් අපි ලෙඩ රෝග ගැන දන්නා බැවින් ලෙඩ වූ කළ බෙහෙත් ගනිමු. රෝගයකට අදාළ හේතුව මෙන් ලෝකය පිළිබඳවද අපගේ දැනුම දියුණු වන විට දැනට නොවිසැඳී ඇති ප්‍රශ්න විසඳෙනු නොඅනුමානය.

## ප්‍රශ්නය - බොහෝ දෙනෙකු කුමන ආකාරයක හෝ දෙවිකෙනෙකු ඇතැයි සිතන බැවින් එම මතය සත්‍ය විය නොහැකිද?

**පිළිතුර** - එසේ විය නොහැකිය. බොහෝ කලකට පෙර ලෝකය පැතලි යයි බෝහෝ දෙනෙක් සිතූහ. නමුත් එය නිවැරදි නොවිණ. යම් කිසි දෙයක් විශ්වාස කරන පිරිසගේ ප්‍රමාණය මගින් එම මතයේ වැරදි හෝ නිවැරදි භාවය පිළිබිඹු නොවේ. යමක් වැරදි හෝ නිවැරදි බව කිව හැකි එකම ක්‍රමය නම් ඊට අදාළ සාධක සහ සාක්ෂි පරීක්ෂා කර බැලීමෙනි.

## ප්‍රශ්නය - සාක්ෂි හැම තැනක ම ඇතැයි සමහරු කියති. එනම් ස්වභාව ධර්මයේ අලංකාරයත් මනුෂ්‍ය ශරීරයේ සංකීර්ණතාවත් පළ කරනුයේ සුපිරි බුද්ධි මහිමයක් හා ප්‍රේමණීය නිර්මාතෘ කෙනකු නොවේ ද ?

**පිළිතුර** - අවාසනාවකට වාගේ ස්වභාව ධර්මයේ අනෙක් පැත්ත දෙස බැලූ

හැටියේ ම ඔය අදහස බිඳ වැටෙන්නේය. ලාදුරු බැක්ටීරියා, පිළිකා සෙල, පරපෝෂිත පණුවෝ, ලේ උරා බොන කෘමීහු සහ මහමාරිය පතුරුවන මීයෝ ද මෙයට සාක්ෂි දරන්නෝය. මේ තරම් ව්‍යසන හා දුකක් ගෙන එන දේවල් සැලසුම් කිරීමට සුපිරි බුද්ධි මහිමයක් කල්පනා කරන්නේ ඇයි? එසේ කිරීමෙන් අනතුරුව භූමිකම්පාවලින්, ගංවතුරෙන් හා සුනාමිවලින් කී දෙනෙක් නම් මැරෙද්ද? තුවාල ලබද්ද? යන්න බලා ගෙන සිටිනු ඇද්ද? ජීවමාන නිර්මාතෘ කෙනෙක් සිටිත් නම් ඔහු එබඳු දේ නිර්මාණය කරන්නේ හෝ සිදු වන්නට ඉඩ දෙන්නේ ඇයි ?

**ප්‍රශ්නය - මා බෞද්ධයෙකු වන්නේ නම් මට විශ්වයේ තනියෙන් සිටින්නට සිදුවේවිද? යම් ආකාරයක දෙවියෙක් ගැන අදහන අයට ඔවුන්ට ගැටළුවක් පැන නැගුන විට ඒවාට උදව් කරන ලෙස හා ආරක්‍ෂා කරන ලෙස ආරාධනා කළ හැකිය. එමනිසා දේවවාදි ආගම් විශ්වාසයන් ඇති අයට ගොඩක් සැනසිල්ලක් ඇත.**

**පිළිතුර -** සර්ව බලධාරි දෙවියකු පිළිබඳ විශ්වාස කරන අය ඔවුන්ට දෙවියන් උදව් කරන්නේ යැයි හා ආරක්‍ෂා කරන්නේ යැයි සිතනු ලැබේ. නමුත් ඇත්තටම එසේ නොවේ. එම පහසුව හා විශ්වාසය ඔවුන්ට දැනෙන්නේ මනස තුළිනි. දෙවියකු කිසිදෙයක් කල නිසා නොවේ. දෙවියන් විස්වාස කරන මිනිසුන්ට අඩු වශයෙන් අනතුරු, දීර්ඝායුෂ. විභාග වලට හොඳ ප්‍රතිඵල දෙවියන් විස්වාස කරන මිනිසුන් අතර වෙනසක් ඇති බව සාක්ෂි නොමැත. විශාලම ගුවන් යානාවලට මගීන් 500 කට වඩා ගුවනින් ගෙන යා හැකිය. ඇතැම් විට සිදුවන ආකාරයට එවා කඩා වැටේ. කඩා වැටුනු විට මගීන් 500 යම මිය යති. දෙවියන් ගැන විස්වාස කරන අයට උදව් ලැබෙන්නේ නොවේ. අපි සැම දෙනාටම බුද්ධිය හා මනෝ විද්‍යාත්මක සම්පත ජිවිතයේ ගැටළුවලට මුහුණ දීමට අප සතුවෙමු. නමුත් පදනම් නැති අන්ධ විශ්වාස මත නොරැඳී සිට අපි මෙම සම්පත් අධ්‍යාත්මික ශක්තින් සංවර්ධනය කරන්නට වඩාත් උත්සාහවත් විය යුතුය.

**ප්‍රශ්නය - බෞද්ධයෝ දෙවියන් විශ්වාස නොකරන්නේ නම් අන් කුමක් කෙරෙහි විශ්වාසය තබත්ද?**

**පිළිතුර -** අපි දෙවියන් කෙරෙහි විශ්වාසය නොතබතත් මිනිසුන් කෙරෙහි විශ්වාසය තබමු. සෑම මනුෂ්‍යයෙකුම වැදගත් සහ වටිනා පුද්ගලයෙකු ලෙස අපි දකිමු. බුදුන් වහන්සේ දේශනා කළ පරිදි සෑම මනුෂ්‍යයෙකුටම සර්ව සම්පූර්ණ මනුෂ්‍යයෙකු බවට පත්වීමට හැකි බව අපි පිළිගනිමු. එසේම මිනිසාට අවිද්‍යාව සහ අහිතකර හැඟීම් පරාජය කොට ලෝකය දෙස යථා පරිදි බැලීමට හැකි බව අපි විශ්වාස කරමු. ක්‍රෝධය, තරහව, ඊර්ෂ්‍යාව සහ එදිරිවාදිකම් යන කරුණු ආදරය, ඉවසීම, ත්‍යාගශීලීභාවය සහ කරුණාවෙන් ප්‍රතිස්ථාපනය කළ හැකි බව අපි විශ්වාස කරමු.

**අප විශ්වාස කරන්නේ මේ කරුණු එක් එක් පුද්ගලයාගේ උනන්දුව, උත්සාහය, අන්‍ය බෞද්ධයන්ගේ සහයෝගය සහ බුදුන් වහන්සේගේ දේශනාවලින් තමන්ටම ප්‍රබෝධමත් කර ගැනීමෙන් ළඟා කර ගත හැකි බවය.**

***" තෙමේමය තමහට පිහිට, තමාගෙන් පිටත කවර නම් පිහිටක්ද? තෙමේ මොනවාට දැමුණු තමා ගෙන්ම තමා දුර්ලභ වූ පිහිට ලබයි." (ධ.ප 160)***

# 4. පන්සිල්

**ප්‍රශ්නය - අන්‍ය ආගම්වල වැරදි සහ නිවැරදි දේ පිළිබඳව විග්‍රහ කරන්නේ පනත් හෝ දේව වාක්‍යවලිනි. බෞද්ධයන් වශයෙන් ඔබ දෙවියන් කෙරෙහි විශ්වාසයක් නොමැති නම් වැරදි සහ නිවැරදි දේ කෙසේ අර්ථ දක්වන්නේද?**

**පිළිතුර** - ලෝභය, ද්වේශය, මෝහය යන අකුසල් මුල් හේතුවෙන් කයින් වචනයෙන්, සිතින් සිදුවන මොනයම් හෝ ක්‍රියාවක් නිවන් මග අහුරයි නම්, ඒවා අකුසල් හෙවත් වැරදිය. එසේම අලෝභ, අදෝශ, අමෝහ මුල් කරගෙන කයින්, වචනයෙන්, සිතින් සිදුවන මොනයම් හෝ ක්‍රියාවක් නිවන් මගට උපකාර කරයි නම්, ඒවා කුසල් හෙවත් නිවැරදි ක්‍රියාය.

දෙවියන් මුල් කරගත් ආගම්වලදී නම් වරද නිවරද දැන ගැනීමට ඔබ කළ යුත්තේ ඔබට අනුමත කරන ලද දේ කිරීමම පමණෙකි. නමුත් බුදු දහම වැනි පුද්ගල කේන්ද්‍රිය ආගමකදී නම් වරද නිවරද දැන ගැනීමට ඔබට ඔබ පිළිබඳවම මනා පදනම් වූ සදාචාරය සැමතින්ම පනතකට යටත් වූවකට වඩා ශක්තිමත්ය. වරද නිවරද දැන ගැනීමට බෞද්ධයෝ කරුණු තුනක් සළකා බලති. එනම් චේතනාව, ක්‍රියාව සහ ප්‍රතිඵලයයි. මෙහි ක්‍රියාව තමා වෙනුවෙන්ම පවතින අතර ප්‍රතිඵලය අන් අය කෙරෙහිද බලපායි. චේතනාව හොඳ නම් (කුසල මූල නම් ්‍ අලෝභය, අදෝෂය, අමෝහය වැඩි දියුණු වේ නම්) යහපත් ප්‍රතිඵල ගෙන දේ නම්, ඔහුගේ ක්‍රියාව කුසල සහගත හොඳ ක්‍රියාවක් වේ. නමුත් ඇත්ත වශයෙන්ම මෙම අදහසේ බොහෝ පැති ඇත. සමහර විට අප ඉතා හොඳ චේතනාවෙන් වැඩ කරන නමුත් ඉන් තමාටත් අන් අයටත් යහපතක් නොවීමට ඉඩ ඇත. සමහර විට අදහස හොඳ නොවිය හැකිය. නමුත් අන් අයට යහපතක් වීමට ඉඩ ඇත. සමහර විට යහපත් අරමුණකින් මා කරන දෙයකින් මට යහපතක් වුවද අන් අයගේ අසහනයට හේතු විය හැකිය. මෙවැනි අවස්ථාවලදී මාගේ ක්‍රියාවේ හොඳ සහ නරක මිශ්‍රව පවතී. අරමුණ නරක නම්, ක්‍රියාව මටත් අනුන්ටත් අයහපත පිණිස පවතී නම්, ඒවා අකුසල්ය. එසේම චේතනාව හොඳ නම්, ක්‍රියාව මඟින් මටත්, අනුන්ටත් යහපතක් කරයි නම් ඒවා කුසල කර්මයි.

**ප්‍රශ්නය - එසේම බුදු දහමේ සදාචාරාත්මක වටිනාකම ඇත්ද?**

**පිළිතුර** - ඔව්. බෞද්ධ සදාචාරයේ පදනම පංච සීලයයි. පංච සීලය මගින් කිසිදාක පණ ඇති සතෙකුට හිංසා කිරීම හෝ මැරීම වළක්වයි. හොරකම් කිරීමත්, කාමයෙහි වරදවා හැසිරීමත්, බොරු කීමත්, මදයට සහ ප්‍රමාදයට හේතු වන සුරාව ප්‍රතික්ෂේප කිරීමත් එමගින් සිදු කරයි.

**ප්‍රශ්නය - රෝග බෝ කරන කෘමීන් මැරීම හෝ ඔබව ඝාතනය කිරීමට එන අයෙකු මැරීමත් වරදක්ද?**

**පිළිතුර -** එය ඔබට හොඳ විය හැකියි. නමුත් කෘමීන් හෝ අනෙක් පුද්ගලයන් පිළිබඳ තත්ත්වය කෙබඳුද? ඔවුන්ද ඔබ මෙන්ම ජීවත් විමට කැමතිය. ඔබ රෝග බෝ කරන කෘමීන් මැරීමට සිතන විට රෝග පැතිරීම වැළැක්වීමේ හොඳ චේතනාවකුත්, සත්ව ඝාතනය පිළිබඳ නරක චේතනාවකුත් යන දෙකෙහි මිශ්‍රනයක් දැකිය හැකිය. සමහර අවස්ථාවන්හිදී මැරීම අත්‍යවශ්‍ය වුවද එය සපුරාම හොඳ ක්‍රියාවක් නම් නොවේ.

**ප්‍රශ්නය - බෞද්ධයන් කුඹින් සහ මකුණන් වැනි සතුන් කෙරෙහි පවා විශාල සැළකිල්ලක් දක්වනවා නේද?**

**පිළිතුර -** කිසිවෙකුට වෙනසක් නොදක්වා මෛත්‍රිය පතුරුවා හැරීමට බෞද්ධයෝ මහත් පරිශ්‍රමයක් දරති. ඔවුහු ලෝකය ම එකට ගෙන සෑම ජීවියෙකුට ම හා ද්‍රව්‍යයකට ම ඒවාට හිමි තැනක් සහ ක්‍රියාවලියක් ඇති බව පිළිගනිති. ඔවුහු ස්වභාව ධර්මයේ සියුම් සමතුළිතතාවයන් විනාශ කිරීම හෝ වෙනස් කිරීම ඉතා ප්‍රවේශමෙන් කළ යුතු බව සිතති. ස්වභාව ධර්මයේ නිර්මාණ දෙස මඳක් නෙත් යොමන්න. ස්වභාව ධර්මයේ අවශ්‍යතාවයන් පරිදි නිර්මිත දේ පරදවා අභිබවනය කිරීමට යාමේදී සොබා දහම ඊට එරෙහිව නැගී සිටිනු ඇති. මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා වාතය, ජලය යනාදිය දූෂණය වෙයි. ලස්සන වන සතුන් විනාශ වෙමින් යයි. කඳු නිම්න නිසරු වෙමින් යයි. මිනිසුන් තුළ තරමක හෝ හැඟීමක් තිබුණා නම් මෙවැනි තත්ත්වයක් උදා නොවීමට ඉඩ තිබුණි. අප සියලු දෙනාම මහත් පරිශ්‍රමයක් දරා හෝ ජීවිත කෙරෙහි ගරුත්වයක් ඇති කර ගත යුතුය. පළවෙනි සිල් පදයෙන් කියන්නේ මෙයයි.

**ප්‍රශ්නය - ගබ්සාව පිළිබඳව බුදු දහමේ අදහස කුමක්ද?**

**පිළිතුර** බුදු දහමට අනුව ප්‍රතිසන්ධියත් සමගම ජීවිතයේ ආරම්භය ඇතිවන බැවින් කළලයක් ගබ්සා කිරීම ප්‍රාණඝාතයකි.

**ප්‍රශ්නය - නමුත් දූෂණයකට ලක්වීමෙන් සිදු වූ ගැබ්ගැනීමක් හෝ අංගවිකල යැයි දන්නා ගර්භණී තත්ත්වයක් නැවැත්වීම සුදුසුයි නේද?**

**පිළිතුර -** දූෂණය කිරීමක ප්‍රතිඵලයක් ලෙස හටගත් දරුවෙකුටත් අනෙක් ඕනෑම දරුවෙකුට මෙන්ම ජීවත් වීමටත්, ආදරය ලැබීමටත් අයිතියක් තිබේ. තමා ලොවට ජාතක කළ පියා විසින් කළ අපරාධයකට දරුවෙකුගේ ජීවිතය නැති කිරීම සුදුසු නැත. අංග විකල හෝ මන්ද බුද්ධික දරුවෙකු බිහි කිරීම දෙමව්පියන්ට

තදබල කම්පනයක් වුවත් එවැනි කළලයක් නැති කිරීම වරදක් නොවේ නම්, උපත ලබා ඇති අංග විකල දරුවන් හා අංගවිකල වැඩිහිටියන් මරා නොදමන්නේ ඇයි?

මවකගේ ජීවිතය බේරා ගැනීම වැනි මානුෂික හේතු මත කළලයක් ගබ්සා කිරීම වැනි අවස්ථා කලාතුරකින් සිදු විය හැක. නමුත් අවංකවම බැලූ විට, බොහෝ ගබ්සා සිදු වන්නේ ගර්භණී වීම කරදරයක් ලෙස සැලකීම, ලැජ්ජාවෙන් ගැලවීම, දරුවෙකු ලබා ගැනීම කල් දැමීමට ඇති අවශ්‍යතාවය ආදී හේතූන් නිසාය. බෞද්ධයන්ට මෙවැනි අර්ථහීන හේතූන් ජීවිතයක් නැති කිරීමට ප්‍රමාණවත් නොවේ.

## ප්‍රශ්නය - කිසියම් පුද්ගලයෙකු සියදිවි හානිකර ගැනීම පළමු ශික්ෂා පදය බිඳීමක් ලෙස සැලකේද?

**පිළිතුර** - කෙනෙකු විසින් තවෙකෙකුගේ ජිවිතය නැති කිරීමට බොහෝ විට බිය, තරහා, ක්‍රෝධය හෝ වෙනයම් පව්ටු චේතනාවක් හේතුවේ. එසේම සියදිවි හානි කරගැනීමකටත් බොහෝ විට එවැනිම හේතුවක්, නැතිනම් බලාපොරොත්තු බිඳ වැටීමක් හෝ ඉච්ඡාභංගත්වයක් වැනි අනෙකුත් කාරණාවක් හේතු වේ. එසේම ප්‍රාණ ඝාතය අන් අයකු කෙරේ යොමු කළ පව්ටු චිත්ත වේගයක් ලෙසත්, සියදිවි හානි කරගැනීම තමන් වෙතම යොමුකරගත් පව්ටු චිත්ත වේගයක් ලෙසත් සැලකිය හැකිය. එසේ ගත්කල සිය දිවි හානිකර ගැනීම පළමු ශික්ෂා පදය කැඩීමක් වේ. සියදිවි හානිකර ගැනීමට උත්සාහ කරන හෝ කළ අයෙකුට එහි වැරැද්ද පෙන්වීමෙන් වැඩක් නැත. ඔවුනට අවශ්‍ය වන්නේ අපගේ අවබෝධය සහ සහයෝගයයි. අප විසින් කළ යුතුව ඇත්තේ ජීවිතය නැති කර ගැනීම ප්‍රශ්නවලට විසඳුමක් නොව ඒවා තව දික්කර ගැනීමක් බව ඔවුනට වටහා දීමයි.

## ප්‍රශ්නය - දෙවැනි ශික්ෂා පදය මට පැහැදිලි කර දෙන්න.

**පිළිතුර** - ඒ සිල් පදයෙන් අප පොරොන්දු වන්නේ අනෙකකුට අයත් කිසිවක් නො ගන්නට ය. එය අපගේ ලෝභය පාලනය කර ගැනීමටත් අනෙක් අයගේ දේපළ වලට ගරු කිරීමටත් පුහුණු වීමකි.

## ප්‍රශ්නය - තෙවැනි සිල් පදයෙන් කියවෙන කාමයෙහි වරදවා හැසිරීම නම් කුමක්ද?

**පිළිතුර** - යමෙක් උපාය මාර්ගයෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ බලහත්කාරයෙන් හෝ තව කෙනෙකුව ලිංගික ක්‍රියාවලියකට පොළඹවා ගැනීම කාමයෙහි වරදවා හැසිරීමයි. පරදාර සේවනයද එවැනි දෙයකි. මක්නිසාද යත් විවාහයේදී එකිනෙකා නීතියෙන් සහකරුවන් ලෙස පිළිගැනීමයි. පරදාර සේවනයේදී එම විශ්වාසය පළුදු

වෙයි. ලිංගික ක්‍රියාවලිය දෙදෙනා අතර ආදරයේත්, දෘඪ මිත්‍රත්වයේත් ප්‍රකාශයක් බඳු විය යුතු අතර එමගින් මානසික එකගතාවක් ඇතිවේ.

## ප්‍රශ්නය - විවාහයට පෙර ලිංගිකව හැසිරීම කාමයෙහි වරදවා හැසිරීමක් නොවන්නේද?

**පිළිතුර** - ආදරයෙන් සහ අන්‍යෝන්‍ය අවබෝධයෙන් කෙරෙන එවැන්නක් එසේ විය නොහැකිය. කෙසේ වෙතත් ලිංගික ක්‍රියාවලියේ ජීව විද්‍යාත්මක අංශය නම් වර්ගයාගේ බිහි කිරීමයි. එබැවින් විවාහ නොවුණු කාන්තාවන්ගේ ගැබ් ගැනීමක් සමාජයට විශාල ප්‍රශ්නයක් බැවින් ලිංගික ක්‍රියාවලිය විවාහය තෙක් පසුකිරීම වැදගත් වනු ඇත.

## ප්‍රශ්නය - උපත් පාලනය පිළිබඳව බුද්ධාගමේ අදහස කුමක්ද?

**පිළිතුර** - සමහර ආගම්වලට අනුව දරුවෙකු ලබා ගැනීමේ අරමුණින් තොරව ලිංගික ක්‍රියාවේ යෙදීම දුරාචාරයක් ලෙස සැලකේ. බුද්ධාගමට අනුව ලිංගික ක්‍රියාවලියේ යෙදීම දරුවෙකු ලබා ගැනීම, ආශ්වාදය පිණිස හා දෙදෙනෙකු අතර ඇති ආදර බැඳීම ප්‍රකාශය කිරීම ආදී විවිධ කාරණා මත සිදුවන බව සැලකේ. මේ අනුව බලන විට ගබ්සා කිරීම හැර අනෙක් කිසිදු උපත්පාලන ක්‍රමයක වරදක් දැකිය නොහැක. අධික ජනගහනය දැඩි ප්‍රශ්නයක්ව පවතින නූතන සමාජයට, උපත් පාලන ක්‍රම ආශිර්වාදයක් ලෙස සැලකිය හැක.

## ප්‍රශ්නය - බොරු නොකියා ජීවත් විය හැකිද?

**පිළිතුර** - බොරු නොකියා සමාජයක් හෝ ව්‍යාපාරක යෙදිය නොහැකි බවට සමාජයේ තිබෙන මතය වෙනස් විය යුතුය. බෞද්ධයෙකු යනු කිසියම් ප්‍රශ්නයක් පිළිබඳව ප්‍රායෝගිකව සළකා බලා සත්‍යවාදීව සහ අවංකව වෙසෙන තැනැත්තෙකි.

## ප්‍රශ්නය - ඔබ උද්‍යානයක වාඩි වී සිටියදී බියපත් පුද්ගලයෙකු එතැනින් යනවා දකියි. ඉන් ස්වල්ප වෙලාවකට පසුව පිහියක් අතේ රැඳි තවත් පුද්ගලයෙකු ඔබ වෙත පැමිණ, පළමු පුද්ගලයා ගිය දිශාව විමසුවොත්, ඔබ ඔහුට සත්‍යය පවසනවාද?

**පිළිතුර** - පසුව පැමිණි අය පළමුව ගිය පුද්ගලයාට හානියක් කිරීමට යන බවට සැක කිරීමට මට වැදගත් සාධක තිබේ නම්, බුද්ධිමත් හා කරුණාවන්ත බෞද්ධයෙකු ලෙස, බොරුවක් පැවසීමට පසු බට නොවෙමි. කලින් පවසා ඇති පරිදි, යම් කිසි ක්‍රියාවක් හොඳ හෝ නරක දැයි තීරණය කිරීමට චේතනාව එක් කරුණක් වේ. මෙවැනි දුෂ්කර අවස්ථාවක ජීවිතයක් බේරා ගැනීම, බොරුවක්

කීමට වඩා බොහෝ ඵලදායී වේ. ජීවිතයක් බේරා ගැනීමේ අරමුණින් බොරුවක් කීමට, සුරා පානය කිරීමට හෝ සොරකමක් කිරීමට පවා සිදුවූවොත් මම එසේ කරන්නෙමි. මන්ද, මෙම ශික්ෂා පද බිඳීමෙන් සිදුවන වරද පසුව නිවැරදි කරගැනීමට හැකි නමුත් ජීවිතයක් නැති වුවහොත්, කිසිම අයුරකින් එය නැවත ලබාගත නොහැක. නමුත් කලින් පැවසූ පරිදි, අවශ්‍ය වන විටදී ශික්ෂා පද කඩ කිරීමට මෙය උපයෝගී කර නොගන්න. ඉතා වගකීමෙන් යුතුව ශික්ෂාවන් රැකිය යුතු අතර ඉතාම දුෂ්කර අවස්ථාවක හැර ඒවා බිඳීම නොකරන්න.

## ප්‍රශ්නය - මත්ද්‍රව්‍ය පිළිබඳ තත්ත්වය කුමක්ද? මත් ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් ගැනීමත් නුසුදුසුද?

**පිළිතුර** - මිනිසුන් මත්පැන් ගන්නේ රස විඳීම සඳහා නොව මානසික ආතතීන්ගෙන් මිදීමේ ක්‍රමයක් වශයෙනි. ප්‍රිය සම්භාෂණයන්හිදී සමාජ ආශ්‍රය පිණිස සුළු ප්‍රමාණයක් ගැනීමට පෙළඹීමෙන් එය සනාථ වේ. මත්පැන් සුළු ප්‍රමාණයක් ගැනීමෙන් පවා මනස විකෘති වේ. සිහිය අවුල් වේ. වැඩි ප්‍රමාණයක් ගැනීමෙන් තත්ත්වය වඩාත් විනාශකාරී වේ.

## ප්‍රශ්නය - නමුත් සුළු ප්‍රමාණයක් ගැනීම සුළු කරුණක් නොවන්නේද?

**පිළිතුර** - ඔව්. එය ඉතා සුළු කාරණයක් විය හැකියි. නමුත් ඔබට එම සුළු කාරණය පවා නොකර ඉඳීමට කැපවීමක් හෝ අධිෂ්ඨානයක් නොමැති වීම ම විශාල කරුණක් නේද?

## ප්‍රශ්නය - බුදු දහම යනු අන්තයන් අතර මධ්‍යම ප්‍රතිපදාව ලෙස කලින් පවසා සිටියා. එම නිසා මත්පැන් බීලා අතිශයින් මත් වීම එක් අන්තයකි.සම්පූර්ණයෙන් නොබීම තවත් අන්තයකි. සාදයකදී යහළුවන් සමග මත් පැන් බීම වීදුරු කිහිපයක් බීම මධ්‍යම ප්‍රතිපදාව වේ.

පිළිතුරු - ඇත්ත වශයෙන්ම ඔබට බුදු රජාණන් වහන්සේ ඒ අතට මේ අතට හරවමින් උන් වහන්සේ දේශනා නොකළ දෙයක් දේශනා කළා යයි පැවසීමට හැකිය. නමුත් ඔබ ධර්මානුකූලව ජීවත් නොවන බව පැවසීම වඩාත් අවංක පිළි ගැනීම වේ. එසේම කුහකයෙක් ලෙස ජීවත් වීමට වඩා නරක බෞද්ධයකු ලෙස තමා හඳුන්වා දීම වඩා හොඳයි. අපි මත්පැනින් සහ මත් ද්‍රව්‍ය වලින් වැළකිය යුත්තේ ඒවා අපගේ මනස අවුල් කරන නිසා බව බුදු රජාණන්වහන්සේ පැවසූ සේක. මෙසේ වැලකී සිටීම ඉතාම පහසුවෙන් කළ හැකි දෙයකි. එයින් වැලකීමට කිසිඳු වියදමක් නොයයි. එයින් වැලකීම සෞඛ්‍යයටද ඉතාම හොඳයි. එයින් වැලකීම ඔබේ දරුවන්ට යහපත් ආදර්ශයක් සපයයි. එයින් වැලකීම ධර්මයට ද

එකඟයි. මත් පැනින් වැලකීම නිසා අවාසි සිදු නොවේ. මත් පැන් පානයෙන් විවිධ හා විශාල වූ අවාසි රාශියක් ඇතිවේ.

## ප්‍රශ්නය - දුම්පානය පස් වන ශික්ෂා පදය බිඳීමක්ද?

**පිළිතුර -** දුම්පානයෙන් සිරුරට හානි වන නමුත්, ඉන් මනසට සිදුවන හානිය ඉතා සුළුය. දුම්පානය කරන අයෙකුට හොඳ සිහි බුද්ධියෙන්, සැලකිලිමත්ව හා ශාන්තව සිටිය හැක. මේ නිසා දුම්පානය හොඳ දෙයක් යැයි පැවසිය නොහැකි වුවත් එය පස්වන ශික්ෂා පදය බිඳීමක් සේ සැලකිය නොහැක.

## ප්‍රශ්නය - පන්සිල් යනු අශුභවාදී දෙයක්ද? එමඟින් නොකළ යුතු දෑ මිස කළ යුතු දෑ නොකියන්නේ ඇයි?

**පිළිතුර -** පන්සිල් යනු බෞද්ධ සදාචාරය පිළිබඳ මූලික අවස්ථාවයි. නමුත් එපමණකින්ම එය අවසන් නොවේ. අපේම නරක පුරුදු හඳුනා ගෙන ඒවා නැවත නොකිරීමට අපි උත්සාහ කරමු. පන්සිල් සමාදන් වීමේ අර්ථය එබඳුය. අපි නරක දේ කිරීමෙන් වැළකෙන්නේ හොඳ දේ කිරීමටත් පෙළඹීමෙනි. උදාහරණයක් වශයෙන් වචනය සළකමු බුදුන් වහන්සේ අපට කියන ලද්දේ අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් වැළකීමෙන් ආරම්භ කොට ඉන් අනතුරුව සත්‍ය, විනීත වචන නියම වෙලාවට පමණක් කතා කළ යුතු බවය. උන් වහන්සේ මෙසේ වදාළහ.

*"බොරු කීමෙන් වැළකීමෙන්ම යමෙකු සත්‍යය කතා කරන, විශ්වාස කටයුතු, ලෝකයා මුළා නොකරන්නෙකු බවට පත්වේ. ද්වේශ සහගත කතාවෙන් වැළකීමෙන් පුද්ගලයන්ගේ විවිධත්වය දන්නා බැවින් වෙනතැනක කියූ කතාවක් මෙතැනවත්, මෙතැන කියූ කතාවක් අන් තැනකවත් නැවත කීමට නොයයි. ඔහු බෙදී වෙන් වී ගිය පුද්ගලයන් එකමුතු කරන අතර මිනිසුන් අතර මිත්‍රත්වය වැඩි දියුණු කරයි. එකමුතුකම ඔහුගේ ප්‍රීතියට හේතු වෙයි. එකමුතු කමෙන් ඔහු පිනා යයි. එකමුතුකමට ඔහු ආදරය කරයි. එකමුතුකම වැඩි දියුණු වන පරිදි ඔහු කතා කරයි. යමෙක් පරුෂ වචන කීමෙන් වැළකීමෙන් අන් අයට දොස් නොපවරන, ඇසීමට ප්‍රිය උපදවන වචන කතා කරන, අන් අයට එකඟ විය හැකි, හදවතට කා වදින ශිෂ්ඨ සම්පන්න පුද්ගලයෙක් බවට පත්වේ. හිස් වචන කීමෙන් වැළකීමෙන් අවස්ථාවට උචිත ලෙස නිවැරදි දේ පමණක් ධර්මානුකූලවත්, විනයානුකූලවත් නියමාකාරයෙන් කතාකරන්නෙකු බවට පත්වේ. ප්‍රයෝජනවත්, සාධාරණ සහ මාතෘකාවට අදාළව කතා කරන්නෙකුද වේ."*

# 5. නැවත ඉපදීම

## ප්‍රශ්නය - මිනිසා එන්නේ කොහේ සිටද? මිනිසා යන්නේ කොහාටද?

**පිළිතුර** - මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු තුනක් තිබිය හැකිය. කිසියම් දෙවි කෙනෙකු හෝ දෙවිවරුන් එතෙක් නොසිටි පුද්ගලයෙක් ඔවුන්ගේ කැමැත්ත පරිදි නිර්මාණය කර ඔහු ජීවත් වන ආකාරය මත මරණින් පසු ඔහුව ස්වර්ගය හෝ අපාය වෙත යවතැයි සිතන පිරිසක් සිටිති. විශේෂයෙන් මානවවාදීන් සහ විද්‍යාඥයන් සිතනුයේ කිසියම් ස්වභාවික සංසිද්ධියක්මත පුද්ගලයා නිර්මාණය වී ඔහුගේ මරණින් පසුව තවදුරටත් එම පුද්ගලයා නොමැති බවයි. බුදු දහම මෙම මත දෙකම නොපිළිගනියි. පළමු අදහස බොහෝ ආචාර විද්‍යාත්මක ප්‍රශ්න ඇති කිරීමට තුඩු දෙයි. යහපත් දෙවි කෙනෙකු බොහෝ විරූපී පුද්ගලයන් නිර්මාණය කර ඇත්තේ ඇයි? ළමුන් ගබ්සා වෙන්නේ ඇයි? ඊශ්වර වාදයේ ඇති අනෙක් අසාධාරණ භාවය නම් මිනිසෙකුට අවුරුදු 60 ක් 70 ක් මෙම පොළව මත සිදු කරන දේ වෙනුවෙන් සදාකාලිකව අපායේ දුක් විඳීමට සිදු වීමයි. එසේම මෙහි අවුරුදු හැට හැත්තෑවක ජීවිතයක් ස්වර්ගයේ සැපවත් ජීවිතයක් ගත කරන කාලයත් සමග සංසන්දනය කළ නොහැකි තරම්ම කුඩාය. පළමුවෙනි අර්ථ දැක්වීමට වඩා දෙවැනි අර්ථ දැක්වීම හොඳ නමුත් එමගින් පිළිතුරු නැති ප්‍රශ්න රාශියක් ඉතිරි කරයි. සරල සිදු වීමක් වන ශුක්‍රාණුවක් සහ ඩිම්බයක් එකතු වීමෙන් පුදුම සහගත ලෙස සංකීර්ණ "සිත" නැමැති ධර්මතාවය ගොඩනැගෙන්නේ කෙසේද? නමුත් දැන් අධිමානසික විද්‍යාව විද්‍යාවේම කොටසක් හැටියට සළකනු ලබන අතරම එමගින් ටෙලිපති ක්‍රමය යනාදිය භෞතික විග්‍රහයන් සමග සැසඳීමට අතිශය අසීරු බව පිළිගනියි.

බුදු දහම මිනිසා පැමිණි සහ මිනිසා යන තැන පිළිබඳ පැහැදිලි පිළිතුරක් සපයයි. අප මිය ගිය විට මේ ජීවිතයේදී දියුණු කරන ලද මනස සහ එහි සියලු හැකියාවන්, ආශාවන්, දක්ෂතාවයන් වැනි ලක්ෂණ සමගම යුක්තාණුවක් හා නැවත වර්ධනය වනු ඇත. ඒ ආකාරයෙන් තනි තනි පුද්ගලයන්ගේ වර්ධනය නැවත ඉපදීමයි. ඉන්පසු තමන් විසින් පුරුදු කරන ලද චරිත ස්වභාවයන් නව පරිසරයකට අනුව මානසික සහ චරිත ලක්ෂණයන්ගේ ස්වභාවයන් ඉදිරියට යයි. සිහි කල්පනාව වර්ධනය කර ගැනීමෙන් මෙන්ම තීරණාත්මක සාධක වන අධ්‍යාපනය, දෙමාපිය බලපෑම සහ සමාජය මගින් යමෙකුගේ චරිතය වෙනස් කිරීමට හැකිය. මරණයේදී පවතින තත්ත්වය යුක්තානුවකදී නැවතත් ස්ථාපනය වනු ඇත. මෙම මරණයට පත්වීමේ සහ නැවත ඉපදීමේ ක්‍රියාවලිය ඊට හේතුව වන තෘෂ්ණාවත්, අවිද්‍යාවත් නැති කළ කල්හි නිර්වාණය අවබෝධ කර ගත්තේ යයි කියමු. එය බුදු දහමේ අවසාන ඉලක්කයයි.

**ප්‍රශ්නය - සිත එක් ශරීරයක සිට තවත් ශරීරයකට යන්නේ කෙසේද?**

**පිළිතුර -** එය ගුවන් විදුලි තරංග මෙන් කල්පනාවට ගන්න. රේඩියෝ තරංග යනු වචන සහ සංගීතය නොව විවිධ සංඛ්‍යාතයන් අඩංගු ශක්තිය සම්ප්‍රේෂණය කිරීමකි. ඒවා අවකාශය තුළින් ගමන් කරන අතර එම තරංග ග්‍රහණය කරගත හැකි උපකරණයක් මගින් නැවතත් වචන සහ සංගීතය බවට හරවනු ලැබේ. මෙය සිතට සමානය. මරණයේදී චිත්ත ශක්තිය අවකාශය තුළින් ගමන් කරන අතර එය ග්‍රහණය කර ගැනීමට යුක්තාණුව සමත්ය. කලල රූපය වර්ධනය වීමත් සමගම මොළය කේන්ද්‍ර කොට ගෙන එය නව පුද්ගලයෙකු ලෙසින් වර්ධනය වීමක් සිදුවේ.

**ප්‍රශ්නය - පුද්ගලයකු නැවත උපදින විට එක් සිරුරකින් අනෙක් සිරුරට ගමන් කරන්නේ ආත්මය නොහොත් පුද්ගලිකත්වය නොවේ ද?**

**පිළිතුර -** බුදු වදනට අනුව එසේ නොවන්නේය. උන් වහන්සේ උගන්වා ඇත්තේ සදාකාලික ආත්මයක් පිළිබඳ අදහස මමත්වය විසින් නිර්මාණය කරන ලද්දක් බව ය. එමගින් මමත්වය තව දුරටත් වර්ධනය වන බව ය. සදාකාලික ආත්මයක් නොමැති බව වටහා ගත් විට මමත්වය පමණක් නොව ස්වරූපරාගය, අහංකාරය සහ තමා මුල් තැනට ගැනීමත් අනවශ්‍ය බව අපට වැටහෙන්නේය. පුද්ගලයා ඝන පර්වතයක් නොව ගලා යන ගංගාවකි.

**ප්‍රශ්නය - එහි පරස්පරතාවක් ඇති බව පෙනෙයි. ආත්මයක් නැත්නම් අනන්‍යතාවක් තිබෙන්නේ කෙසේ ද? අනන්‍යතාවක් නැති විට අප යළි උපදිනවා යයි කියන්නේ කෙසේ ද?**

**පිළිතුර -** එය හරියට අවුරුදු අනූ පහක් දිගට ම තිබිච්ච පාපන්දු කණ්ඩායමක් වාගෙයි. ඒ කාලය තුළ දී පාපන්දු ක්‍රීඩකයන් සිය ගණනක් කණ්ඩායමේ ක්‍රීඩා කොට ඉවත් ව යන්නටත් අලුතින් ක්‍රීඩකයන් එක් වන්නටත් ඇත. ආරම්භක ක්‍රීඩකයන් නොමැති වුවත්, සමහර විට ඔවුන් ජීවතුන් අතර පවා නොසිටියත්, ඒ කණ්ඩායම තවමත් පවතිනවා යයි කීම වලංගුය. නිරන්තර වෙනස් වීම් මධ්‍යයේ වුව එහි අනන්‍යතාව හඳුනා ගත හැකිය. ක්‍රීඩකයෝ ස්ථිර, ශක්තිමත් ඒකක වන්නාහ. එහෙත් කණ්ඩායමේ අනන්‍යතාව සැදී ඇත්තේ කුමකින් ද? එහි නාම, කලින් ලද ජයග්‍රහණ පිළිබඳ මතක, ඒ කෙරේ ක්‍රීඩකයන් හා ආධාරකරුවන් දක්වන ආකල්ප හා හැඟීම්, එහි පවතින සාමූහික හැඟීම යන මේවාය. පුද්ගලයෝත් එසේ ම වන්නාහ. කය සහ මනස යන දෙක ම නිරන්තරයෙන් වෙනස් වුවත්, උපදින පුද්ගලයා මිය ගිය පුද්ගලයාගේ ම අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ගත හැකිය. ඒ කිසියම් වෙනස් නොවන ආත්මයක් එකකින් අනෙකට ප්‍රවිෂ්ට වීම නිසා නොව,

අනන්‍යතාව රැඳී පවත්නේ ස්මරණ, ගතිගුණ, මානසිකපුරුදු සහ මනෝවිද්‍යාත්මක ප්‍රවණතා යන මේවා මත නිසා ය.

## ප්‍රශ්නය - හොඳයි. අප කවුරුනුත් කලින් ජීවත් ව සිටියා නම් අපට අතීත ජීවිත මතක නැත්තේ ඇයි?

**පිළිතුර** - සමහරුන්ට ඒ හැකියාව තිබේ. යටත් පිරිසෙයින් ඔවුන්ගේ ළමා අවදියේ වත්. වැඩි දෙනාට අමතක වන බව සැබෑ ය. එයට හේතු ගණනාවක් තිබිය හැකිය. මව් කුසයේ ගත කරන මාස නවය තුළ දී බොහෝ ස්මරණ මැකී යන්නට ඉඩ ඇත. සම්පූර්ණ සංවේදන දරිද්‍රතාවකින් යුතු කාලයකින් පසු උපතේ දී ලැබෙන නව සංවේදන ප්‍රවේශය සමග ඉතිරි ව තිබිය හැකි ස්මරණ පවා සපුරා මැකී යනු ඇත.

## ප්‍රශ්නය - මිය ගිය මිනිසෙක් හැම විටම උපදින්නේ මනුෂ්‍යයෙකු වශයෙන්මද?

**පිළිතුර** - නැත. කෙනෙකු නැවත ඉපදෙන ලෝක (භූමි) කිහිපයක් ඇත. සමහරු දිව්‍ය ලෝකවලද, සමහරු නිරයේද, සමහරු ප්‍රේත ලෝකවලද ආදී වශයෙන් තැන්වල උපදිති. දිව්‍ය ලෝක යනුද ස්ථානයකට වඩා එහි උපදින සත්වයන්ගේ ශරීර ඉතා සියුම් වන, සිත නිරන්තර ප්‍රීතිය භුක්ති විඳින ස්වභාවයකි. සමහර ආගම් දිව්‍ය ලෝකයේ (ස්වර්ගයේ) ඉපදීමට මහත් පරිශ්‍රමයක් දරන්නේ එහි ස්ථිර ස්වභාවයක් ඇතැයි වරදවා වටහා ගැනීමෙනි. එය එසේ නොවේ. හේතු ප්‍රත්‍යයන් නිසා ඇති වෙන සැම දෙයක් මෙන්ම දිව්‍ය සැපතද අනිත්‍යය. එහි ආයු කාලය නිම වී නැවත මිනිස් ලොව ඉපදිය හැකිය. එසේම නිරය යනුද කිසියම් ස්ථානයකට වඩා සියුම් සිරුරක් සහිතව සිත සාතිශය නොසන්සුන්තාවයක් සහ අසහනයට පත්වූ ස්වභාවයකි. ඒ අනුව දිව්‍ය ලෝකවල අතිශය සැප විඳින අතර නිරය සහ ප්‍රේත ලෝකවලදී අතිශය දුක් විඳිති. මිනිස්සු දුක-සැප සමව මෙන් විඳිති. ඇත්ත වශයෙන්ම මනුෂ්‍යය ලෝකයේ සහ අනෙකුත් ලෝකවල ඇති ප්‍රධාන වෙනස නම් ශරීර සහ අත්දැකීම්වල ස්වභාවයයි.

## ප්‍රශ්නය - කුමන තලයක නැවත උපදින්නේද යන්න තීරණය කරන සාධක මොනවාද?

**පිළිතුර** - කෙනෙකු නැවත උපදින ස්ථානය සහ තත්ත්වය රදා පවතින ප්‍රධාන කාරණය කර්මයයි. නමුත් එය එකම කාරණය නොවේ. කර්මය යන්නෙහි තේරුම නම්, ක්‍රියාව යන්න හෝ හිතාමතා කරනු ලබන ක්‍රියාවයි. තවත් අයුරකින් කියතහොත් අපි අතීතයේ හොඳින් හිතාමතා කරන ලද ක්‍රියාවල ප්‍රතිඵල අද අත්

විඳිමු. ඒ අයුරින්ම අප අද හිතාමතා සිදුකරන ක්‍රියාවන්හි ප්‍රතිඵලවලට අනාගතයේදී මුහුණ දීමට සිදුවනු ඇත.

ඉතා මෘදු කරුණාවන්ත පුද්ගලයෙකු දිව්‍ය ලෝකවල හෝ මනුෂ්‍ය ලෝකයේ නිරන්තර සැප විඳින්නෙකු වශයෙන් උපදිනු ඇත. එසේම නොසන්සුන්, නිතරම පසුතැවෙන, නපුරු අය නිරයේ හෝ මනුෂ්‍ය ලෝකයේ නිරන්තර දුක් විඳින්නෙකු වශයෙන් උපදිනු ඇත. යමෙකු හට හිතට මහත් පීඩාවක් ඇති කරන තෘෂ්ණාව, දරුණු ආශාවන් සහ දැවෙන අරමුණු ඇත්නම් සෑහීමකට පත් නොවන ප්‍රේතයෙකු වශයෙන් හෝ කුමකින්වත් තෘප්තිමත් නොවන මනුෂ්‍යයකු වශයෙන් නැවතත් ඉපදීමට ඉඩ ඇත. කුමන ආකාරයෙන් හෝ සිතේ ඇති කරගන්නා පුරුදු නැවත ඉපදීමෙන් පසුද බලපවත්වනු ඇත. කෙසේ වෙතත් බොහෝ අය නැවත වරක් මිනිස්සු වශයෙන්ම උපදිති.

## ප්‍රශ්නය - ඔබ නිරයේ උප්පත්තිය ගැන පැවසුවා. ඒ අනුව බෞද්ධයන් නිරය (අපාය) විශ්වාස කරනවාද?

**පිළිතුර** - ඔබ නිරය (අපාය) යනුවෙන් අදහස් කරන්නේ කුපිත වූ දෙවි කෙනෙකු විසින් ඔහුව විශ්වාස නොකරන සියල්ලම ඇද දමන සදාකාලික ස්ථානයක් නම්, එය වැරදිය. බෞද්ධයන්ගේ අදහස වන්නේ එවැනි දෙයක් ඇති විය හැක්කේ පලිගන්නා සුළු හා දූෂිත මනසක පමණක් බවය.

''නිරය'' හා ''අපාය'' යන බෞද්ධ වචන (Hell) යනුවෙන් ඉංග්‍රීසියට පරිවර්ථනය වුවත්, ඒවායේ නිවැරදි අර්ථය වන්නේ (decline) (අවනතිය) හා (loss) (හානිය) යන්නයි. මෙය ඉතා කෲර හෝ ආත්මාර්ථකාමී මිනිසුන් විසින් තමන් වෙනුවෙන්ම නිර්මාණය කරගත් දැඩි අශුභවාදී ස්වභාවයක් ලෙස සැලකේ. මේ පිළිබඳව බුදුන් වහන්සේ මෙසේ පවසා ඇත. ''අඥානයා විසින් නිරය තිබෙන්නේ මුහුදු පතුලේ යැයි පවසයි. නමුත් මා පවසන්නේ නිරය යනු පීඩාකාරී හැඟීම් බවයි.'' මෙයට උදාහරණයක් දැක්විය හැක. එනම් දැඩි මානසික ව්‍යාකූලත්වයට පත් අයෙකු, ඔහු අවට ඇති සියල්ලම අන්තරාදායක, කුමන්ත්‍රණකාරී හෝ ද්‍රෝහී ලෙස දකියි. ඔහුගේ මනෝ භාවය විසින් ඔහුව හැමවිටම සැක කරන සුලු, බියගුලු හා තැවෙන පුද්ගලයෙකු විසින් ඔහුව එම තත්ත්වයට පත්කර ඇති අතර, එය ඔහු විසින්ම මවාගත් තත්වයකි. එසේම, එවැනි පුද්ගලයන්ට ඔවුන්ගේ එම අශුභවාදී මානසික තත්ත්වයෙන් ගොඩ ඒමේ හැකියාව පවතී. එසේම බුදු දහමට අනුව නිරය සදාකාලික නොවේ. හැමවිටම අපට තවත් අවස්ථාවක් තිබේ.

## ප්‍රශ්නය - අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කිරීමෙන් කර්මය වෙනස් කරගත හැකිය.

**පිළිතුර** - සත්තකින්ම අපට එසේ කළ හැකිය. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ එක් අංගයක් ''යහපත් වෑයම'' වන්නේද ඒ නිසයි. අප අපේ විශ්වාසය මත පදනම් වී කටයුතු කළහොත් එමගින් අතිමහත් ශක්තියක් පුරුද්දක් වශයෙන් ලබාගත හැකිය. නමුත් සමහරුන් තම අතීත ජීවිතවල පුරුදු වෙනස් කර ගැනීමට උත්සාහ නොකර අහිතකර ප්‍රතිඵලවල නිරන්තර ගොදුරු බවට පත්වන බව සැබෑය. එවැනි අය තම නරක පුරුදු වෙනස් කර නොගන්නා තාක් කල් දිගින් දිගටම දුක් විඳිති. නරක පුරුදු වෙනස් කර ගැනීමට ගත වන කාලය වැඩි වන තරමට ඒවා වෙනස් කිරීමට ඇති අසීරුතාවයද වැඩිවේ. බෞද්ධයෝ මෙය වටහා ගෙන සිටිති. නරක ප්‍රතිඵල ලබා දෙන සිතිවිලිවලින් මිදීමට උත්සාහ කරති. එසේම කුසල කර්ම කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලැබෙන අයුරින් කටයුතු කරති. භාවනාව යනු කතා කිරීමට වචන නැවත නැවත පුරුදු වන්නාක් මෙන්, රඟ පෑමට පුරුදු වන්නාක් මෙන් සිත පුරුදු පුහුණු කළ හැකි එක්තරා උපක්‍රමයකි. සිත පුරුදු කිරීමත්, තැන්පත් කිරීමත් යනු බෞද්ධයන්ගේ ජීවිතයය. උදාහරණයක් වශයෙන් ඔබගේ පසුගිය ජීවිතයේදී ඔබ ඉවසීම, කරුණාව යන ගුණාංග පුහුණු කළ කෙනෙක් නම් එම ප්‍රවණතාවයන් මෙම ජීවිතයේදී ඉස්මතු වෙයි. ඒවා මෙම ජිවිතයේදී තවදුරටත් ඉස්මතු කරගතහොත් මතු ජීවිතයේදී වඩාත් තියුණුව එය ඉස්මතු වේ. යමෙක් ගොඩනගා ගත් චරිත ස්වභාවයන් විනාශ කිරීමට අපහසුය. මෙය පැහැදිලි සරළ දෙයකි.

දැනට ඔබ ඉවසිලිවන්ත සහ කරුණාවන්ත පුද්ගලයෙකු නම් අනුන්ට ඔබේ මනස පහසුවෙන් අවුල් කළ නොහැකිය. ඔබ ඊර්ෂ්‍යා නොකරයි. නිරන්තරයෙන් ඔබ සතුටු දායක අත්දැකීම් ලබයි.

දැන් අපි තවත් උදාහරණයක් ගනිමු. ඔබ පසු ගිය ජීවිතයේදී කරුණාව ඉවසීම වැනි ගුණාංග දියුණු කරගත් නමුත් දැනට ඒවා වර්ධනය කර ගැනීමට උත්සාහ නොකරන්නේ නම් එම ගුණාංග ක්‍රමයෙන් දුර්වලව ගොස් අනාගත ජීවිතයේදී සපුරාම අතුරුදහන්ව යාමට පුළුවන. මේ ආකාරයෙන් කරුණාව සහ ඉවසීම දුර්වලව ගිය කල්හි මේ ජීවිතයේදී හෝ මතු ජීවිතයේදී ඉක්මන් කේන්ති, තරහ සහ නපුරුකම් වර්ධනය වී දුක්ඛ සහගත ජීවිතයක් ලැබීමේ හැකියාවක්ද ඇත. අවසාන වශයෙන් තවත් එක් උදාහරණයක් ගනිමු. පසුගිය ජීවිතයේදී ඔබ තරහව, කෝපය දියුණු කළ පුද්ගලයෙකු වුවත් මෙම ජීවිතයේදී එම වරද වටහාගෙන ඒවා නිවැරදි කර ගැනීමට උත්සාහ දරන්නේ යැයි සිතමු. ඔබ අකුසල් සිතිවිලි කුසල් සහගත සිතිවිලිවලින් ප්‍රතිස්ථාපනය කරණු ඇත. ඔබගේ උනන්දුව මත අකුසල් සිතිවිලි සපුරාම දුරලිය හැකි නම් ඉක්මන් කෝපය හා තරහව නිසා තව දුරටත් අසහනයට පත් නොවනු ඇත. මතු ජීවිතයේදී ඔබට තව තවත් යහපත් ප්‍රතිඵල ලැබෙනු ඇත.

## ප්‍රශ්නය - බුදුරජාණන් වහන්සේ නිදහස්ව සිතිමේ සිතක් ඇතැයි උගන්වනු ලබන්නේද (ස්වඡන්දතාවයක්)

**පිළිතුර** - මානව අත්දැකීම් සම්බන්ධව වැරදි මත තුනක් ඇති බව බුදුරජාණන් වහන්සේ දේශනා කල සේක. 01. සෑම දෙයක්ම සිදුවන්නේ අහම්බෙනි. 02. සියල්ල සිදුවන්නේ සර්ව බලධාරි දෙවියකුගේ බලයෙනි සහ 03. සෑම දෙයක්ම සිදුවන්නේ අතීත කර්මයේ බලයෙනි. (අංගුත්තර නිකාය I, 173* පෙර සඳහන් කලාක් මෙන් අපගේ කර්මය අපේ ජිවිත වලට බලපාන අතර එය නියතියක් නොවේ. මානව චිත්තය අශ්වයකු පදින්න යෑම මෙනි. මට අශ්වයා එක මගක එක වේගයකින් ගමන් කිරීම අවශ්‍ය වේ. එසේ නැතහොත් මද වේගයෙන් පැන පැන යෑමට හෝ පිම්මේ යැමට අශ්වයාගේ ක්‍රමයට අවශ්‍ය විය හැකිය. මට අත්දැකීම් හා ආත්ම විශ්වාසයන් ඇත්නම් අශ්වයා ලවා අවශ්‍ය දේ කරවා ගත හැකිය. එහෙත් මම දුර්වල බව හා අත්දැකීම් අඩු බව දැනගතහොත් අශ්වයා මා ගණන් නොගැනීමටත් ඌට අවශ්‍ය දේ ඌට අවශ්‍ය විදිහට කරනු ලබයි. තවදුරටත් මගේ ප්‍රාර්ථනාවන් කෙසේ වෙතත් අශ්වයාට ඌටම ආවේනික සීමාවන් ඇත. මට අශ්වයා පැයට කිලෝමීටර 50 වේගයෙන් යෑම අවශ්‍ය වුවත් එහෙත් අශ්වයාට එම වේගයෙන් යෑමට අවශ්‍ය ශක්තියක් නැතිනම් මට කෙතරම් අවශ්‍ය වුවත් කොතරම් උනන්දු කරතත් එය සිදුනොවේ.

අශ්වයකු පිට ප්‍රසන්න ගමනක් යැමට විවිධ කරුණු කාරණා රාශියක් මත පදනම් වේ. එලෙසම මානව නිදහස් චින්තන සඳහා විවිධ කරුණු රාශියක් බලපායි. එමනිසා අපට නිදහස් සිතක් නැතැයි පැවසිය නොහැකිය. අපගේ සිතද අනෙක් සෑම දේ මෙන්ම විවිධ දේවලින් බැඳී ඇත. ඇත්ත වශයෙන්ම අපගේ හිත දියුණු කරන තරමට අපට ඉවසීම දරා සිටිමේ හැකියාව වඩා වඩා වර්ධනය විය හැකිය. එය ආර්ය අෂ්ඨාංගික මාවතේ ප්‍රධාන පරමාර්ථය වේ.

## ප්‍රශ්නය - මේ භවයේ දන්නා හඳුනන පුද්ගලයින් මතු භවවලදීත් හමුවීමේ හැකියාවක් තිබේද?

**පිළිතුර** - ඔව්, එසේ සිදුවිය හැක. දිගු කලක් සෙනෙහසින් විවාහ දිවිගෙවූ වියපත් යුවලක්, ඔවුනට ඒ අයුරින්ම මතු භවයේත් හමු විය හැකිදැයි විමසා බලන ලෙස බුදුන් වහන්සේගෙන් විමසීය. එවිට බුදුන් වහන්සේ පැවසුවේ ඔවුන්ගේ එකිනෙකා කෙරේ ඇති බැඳීම දැඩි නම් හා ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, ත්‍යාගයෙන් හා බුද්ධියෙන් ඔවුන් එක හා සමාන වේ නම්, එය එසේ සිදුවිය හැකි බවය. දෙදෙනෙකු හමුවූ විටම ක්ෂණික බැඳීමත් පසුව එය දැඩි මිත්‍රත්වයක් හෝ සෙනෙහසක් බවට පත්වීමට අවස්ථා, බෞද්ධයෙකුට පෙර භවයේ සිට පැමිණි සසර බැඳීමක් ලෙස දැකිය හැක. මෙය පුනර්භවයේ තවත් ඵලදායක අංගයක් ලෙස සැලකිය හැක.

එනම් පුද්ගලයන් අතර ඇතිවන දැඩි බැඳීම මරණින් මතුවත් නොනැසී පවත්වා ගත හැකි බවයි.

## ප්‍රශ්නය - නැවත ඉපදීම ඔප්පු කළ හැකි සාධක තිබේද?

**පිළිතුර** - මේ සඳහා ඇත්තේ විද්‍යාත්මක සාක්ෂි පමණක් නොවේ. මරණින් මතු පැවැත්ම පිළිබඳ සහතිකයක් දිය හැකි එකම න්‍යායද මෙයයි. ස්වර්ගය පිළිබඳව අල්ප මාත්‍රයක වුවද සාක්ෂියක් නොලද හැකිය. උච්ඡේදවාදී අදහස් මරණය පිළිබඳව දක්වන්නේ දුර්වල ආකල්පයකි. නමුත් පසුගිය අවුරුදු 30 ක කාලය තුළ අධිමානසික විද්‍යාඥයින් කරන ලද පරීක්‍ෂණවලට අනුව සමහර පුද්ගලයින්ට ඔවුන්ගේ අතීත භව පිළිබඳව පැහැදිලි මතකයක් ඇති බව පෙනී ගොස් ඇත. උදාහරණයක් වශයෙන් වසර පහක් වයසැති එංගලන්ත දැරියක් තමාගේ අනෙක් මව සහ පියා පිළිබඳව නිතරම කතා කළාය. ඇයගේ කතාවලින් පැහැදිලි වූයේ වෙනත් ජීවිතයක් පිළිබඳව කරනු ලබන විස්තරයකි. මෙහිදී අධි මානසික විද්‍යාඥයින්ගේ සියගණනක් ප්‍රශ්නවලට ඇය පිළිතුරු සැපයූවාය. ඇය කියන ලද පරිදි ඇය ජීවත්ව සිටියේ ස්පාඤ්ඤයේ බව පැහැදිලි විය. ඇය විසින් තමා ජීවත්ව සිටි නගරය, වීදිය සහ අසල්වැසියන්ගේ නම්ද, ඇයගේ දෛනික ජීවිතය පිළිබඳවද විස්තර කියන ලදි. ඇය ඉතා භීතියකින් යුතුව පවසා සිටියේ වාහන අනතුරකට මුහුණ දී දින දෙකකට පසු ඇය මිය ගිය සිද්ධියකි. මෙම විස්තර පරීක්‍ෂා කිරීමේදී ඒවා සත්‍ය බව හෙළි විය. ස්පාඤ්ඤයේ ඇය විසින් කියන ලද නමින් හැඳින්වූ ගමක් විය. ඇය කියන ලද වීදියේ ඇය විසින් සඳහන් කරන ලද ආකාරයේ නිවසක්ද විය. එපමණක් නොව වසර පහකට පමණ පෙරාතුව වාහන අනතුරකින් 23 න් හැවිදිරි කාන්තාවක් මිය ගිය බවද හෙළි විණි. මෙය සිදු වූයේ කෙසේද? ස්පාඤ්ඤයට කිසිදා නොගිය පස් හැවිදිරි එංගලන්ත දැරිය මෙම විස්තරය කළේ කෙසේද? සැබැවින්ම මෙම විෂය සම්බන්ධ එකම විස්තරය මෙය නොවේ. වර්ජිනියා විශ්ව විද්‍යාලයේ මානසික විද්‍යා අංශයේ මහාචාර්ය ඉයන් ස්මිත් මෙවැනි සිද්ධීන් දුසිම් ගණනක් තම පොත්වල සඳහන් කර ඇත. ඔහු වසර 30 කට වඩා පුනර්භවය පිළිබඳව බෞද්ධ මතය සනාථ කිරීම සඳහා කටයුතු කළ පිළිගත් පුද්ගලයෙකි. බලන්න - Twenty Cases Suggestive of Reincarnation and Cases of Reicarnation Type,University Press of Virginia, Charlotteville USA 1975

## ප්‍රශ්නය - සමහර පුද්ගලයන්ගේ මතය නම් ව්‍යාජ අතීත භව පිළිබඳ මතකය අමනුෂ්‍ය බලපෑම් මත සිදුවන්නක් බවයි.

**පිළිතුර** - ඔබට විශ්වාස කළ නොහැකි වූ පමණින් ඕනෑම දෙයක් අමනුෂ්‍ය බලපෑම් ලෙස නම් කිරීම සාධාරණ නොවේ. කිසියම් අදහසක් තහවුරු කිරීම උදෙසා

පදනමක් සහිත සාධක ඉදිරිපත් වන කල්හි තාර්කික සහ යථාර්ථවාදී ක්‍රම අනුගමනයෙන් තොරව පදනමක් නැති අතාර්කික මිත්‍යාවන් ගැන කතා කිරීම අනුචණය.

## ප්‍රශ්නය - අමනුෂ්‍යයන් ගැන කතා කිරීම මිත්‍යාවක් නම් නැවත ඉපදීම ගැන කතා කිරීමත් එබඳුම නොවේද?

**පිළිතුර** - ශබ්ද කෝෂයට අනුව මිත්‍යා දෘෂ්ටිය යනු හේතුවක් මත පදනම් නොවුණු කරුණක් හෝ සාධක මගින් විග්‍රහ කළ නොහැකි කරුණක් හෝ ඇස් බැන්දුම් මගින් සිදු කරන්නා වූ දෙයකි. අමනුෂ්‍යයන් පිළිබඳ අදහස මිත්‍යා දෘෂ්ටිය නොවන බවට විද්‍යාඥයින් විසින් කරන ලද අධ්‍යයනයකින් තහවුරු කරන ලද නම් මාද එය පිළිගනු ඇත. නමුත් මා දන්නා පරිදි විද්‍යාඥයින් විසින් එබඳු පරීක්ෂණයක් කර නොමැත. නමුත් මා විසින් කලින් පෙන්වා දෙන ලද පරිදි නැවත ඉපදීම තහවුරු කරන ලද සාක්ෂි ඇත. එබැවින් කිසියම්ම හෝ සාධකයක් මත පදනම්ව නැවත ඉපදීම පිළිගන්නා අයට එය තවදුරටත් ප්‍රශ්නයක් නොවේ.

## ප්‍රශ්නය - පිළිගත් විද්‍යාඥයෝ පුනර්භවය විශ්වාස කර ඇත්ද?

**පිළිතුර** - සත්තකින්ම ඇත. 19 වන සියවසේදී බ්‍රිතාන්‍ය පාසැල්වලට නූතන විද්‍යාව හඳුන්වා දුන් තෝමස් හක්ස්ලි එවැනි අයෙකි. ඔහු විසින් රචිත ප්‍රසිද්ධ ග්‍රන්ථයක් වන "Evoluton and Ethics and other Essays" හි මෙසේ සඳහන්ය.

*"පුනර්ජන්මය පිළිබඳව අදහස් දැක්වීමේදී, එහි මූලාරම්භය කුමක් වුවත්, බ්‍රාහ්මණ සහ බෞද්ධ මත විමර්ශනය කිරීම්වලදී මේ පිළිබඳව දැන ගත හැකියි. විශ්වය තේරුම් ගැනීමට උපක්‍රමයක් ලෙසද මෙම මතය වැදගත්ය. නමුත් ඉක්මනින් කිපෙන චින්තකයෝ මෙම මතය න්‍යාය විරෝධී බව හාස්‍යයෙන් යුතුව කියනු ඇත. නමුත් පරිණාම වාදයට මෙන්ම පුනර්ජන්මයටද සත්‍ය ලෝකයේ පදනමක් ඇත...."*

එසේම ශ්‍රේෂ්ඨ විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් මහතාගේ මිතුරෙකු වූ භෞතික සහ අභ්‍යවකාශ විද්‍යාඥයෙක් වූ මහාචාර්ය ගුස්තාප් ස්ට්‍රොම්බර්ග් මහතා මෙසේ කියා ඇත.

*"මිනිසා පුනරුත්පත්ති ලබන ස්ථානය පිළිබඳව ඇති මත විවිධය. 1936 දී ඉන්දියානු රජය මගින් දැඩිව පරීක්ෂා කොට බලා ඉදිරිපත් කරන ලද වාර්තාවක් මෙහිදී ඉතා වැදගත් වේ. දිල්ලි නගරයේ සිටි ශාන්ති දේවි නැමැති දැරියට ඇයගේ දෙවැනි උප්පත්තියට වසරකට පමණ පෙරාතුව අවසන් වු පෙර ජීවිතය - (දිල්ලියේ සිට සැතපුම් 500 ක් පමණ ඈත මතුරා ප්‍රදේශයේදී) - පිළිබඳව ඉතා නිවැරදි මතකයක් තිබුණි. ඇයගේ ස්වාමියාගේ සහ දරුවන්ගේ නම් ඇය විසින් නිවැරදිව පැවසුවාය. ඇයගේ නිවස ගැනත්, නෑ හිත මිතුරන් ගැනත් නිවැරදිව*

*පැවසුවාය. පරීක්ෂා කිරීමේ කමිටුව මඟින් ඇයව පූර්ව ජන්මයේ නෑ හිත මිතුරන්ට හඳුන්වා දෙන ලදි. ඔවුහු ඇයගේ කීම සනාථ කළහ. බොහෝ ඉන්දියානුවන්ගේ විශ්වාසය නම් පුනරුප්පත්තිය කිසියම් නිශ්චිත ස්ථානයක සිදුවන බවයි. ඇයගේ මතකය ඔවුන් මවිත කරවන සුළු විය. මෙය සහ මීට සමාන සිදුවීම් මතකය විනාශ කළ නොහැකි බවට ඇති න්‍යාය සනාථ කරන සාක්ෂි ලෙස ඉදිරිපත් කළ හැකියි.''*

**යුනෙස්කෝ සංවිධානයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ බ්‍රිතාන්‍යයේ පිළිගත් විද්‍යාඥයෙක් වූ ජුලියන් හක්ස්ලිට අනුව පුනර්භවය විද්‍යාත්මක සිතුම් පැතුම් සමග එක්ව ගමන් කරයි.**

*''මරණයේදී නික්මෙන ආත්මයක සදාකාලික පැවැත්මක් තිබිය නොහැකිය. එය ගුවන් විදුලි සම්ප්‍රේෂණ යන්ත්‍රයක් මගින් ගුවන් විදුලි තරංගයක් නිකුත් කළාක් වැනිය. නමුත් මෙහිදී මතක තබා ගත යුතු කරුණ නම් එම ගුවන් විදුලි තරංග නැවතත් පණිවිඩයක් බවට පත් කළ හැක්කේ ඊට අදාළ උපකරණයක් වූ රිසීවරයක් ඇත්නම් පමණි. මරණයේදී නික්මෙන් විඤ්ඤාණයද එබඳුය. එය නැවතත් කුමන අයුරකින් හෝ ශරීරයකට ඇතුළු වනතාක් කල් සිතීමත්, විඳීමත් නොකරයි. අපේ අත්දැකීම් හෝ අරමුණු ශරීරය මුල්කොට ගෙන පවතී. ශරීරයකින් තොරව සත්‍ය වශයෙන්ම නියම හැඟීම සහිත පුද්ගලයෙක් සිටිය නොහැකිය. සම්ප්‍රේෂණ යන්ත්‍රයකින් මුදාහළ තරංගයක් ගැහැණියක් හෝ මිනිසෙකුගේ අත්දැකීම්වලට තරමක් දුරට සමාන යයි කිව හැකිය. නමුත් ඒ අයුරින් සළකා බලන කල මිය ගිය තැනැත්තා නැවතත් මනසට ක්‍රියාත්මක වීමේ රිසීවරයක් මුණ ගැසෙන තුරු බොහෝ ඈත ඉබාගාතේ යන්නෙකු ලෙසින් කෙනෙකුට පෙනීමටද පුළුවන.''*

**ඉතාමත් ප්‍රායෝගික, මිනිසුන්ට සමීප ඇමෙරිකානු කර්මාන්ත කරුවෙකු වූ හෙන්රි ෆෝඩ් මහතාද පුනර්භවය පිළිගත් පුද්ගලයෙකි. ඔහු මෙම මතයට එකඟවීමට තවත් හේතුවක් වූයේ දේවවාදී (ඊශ්වරවාදී) ආගමකින් මෙන් නොව මෙමගින් කෙනෙකුට තම වැරදි නිවැරදි කරගැනීමට දෙවන අවස්ථාවක් ලැබෙන බැවිනි. ඔහු මෙසේ කීවේය.**

*''පුනර්භවය පිළිබඳ මතය අවුරුදු විසිහයේදී පිළිගත්තෙමි. ආගම කිසියම් ඉලක්කයක් ලබා දෙන්නේ නැත. එසේම ම විසින් කරන ලද වැඩවලින් මට පරිපූර්ණ තෘප්තියක් නොලැබිණ. වැඩකිරීමෙන් ලද අත්දැකීම් අපට අනෙක් ජීවිතයේදී ප්‍රයෝජනවත් නොවන්නේ නම් වැඩ කිරීම නිකරුණේ මුදාහළ වාෂ්පයක් මෙනි. පුනර්භවය ගැන දැනගැනීමට ලැබීම මට විශ්වීය න්‍යායක් සොයාගත්තාක් බඳු විය. කාලය තවදුරටත් සීමාවකට යටත් වූවක් නොවිණ. තවදුරටත් මා ඔරලෝසුවේ වහළෙකු නොවීය...අත්දැකීම් යනු උත්කෘෂ්ඨ බුද්ධිමය බව පෙණින. සමහරුන් සිතන්නේ එය දක්ෂතාවයට ලත් තෑග්ගක් බවය. නමුත් දක්ෂතාවය යනු*

*ජීවිත ගණනාවකදී ලත් අත්දැකීම්වල ප්‍රතිඵලයයි. පුනර්භවය පිළිබඳ තේරුම් ගැනීම මගේ ජීවිතය පහසු කරන්නක් විය. ඔබ මෙම සංවාදයේ මා කියූ දේ ලියා තබන්න. මක්නිසාද යත් එය බොහෝ මිනිසුන්ගේ මනසට පහසුවක් විය හැකි බැවිනි. මට බොහෝ මිනිසුන් සමග සන්සුන්ව සාකච්ඡා කිරීමට කැමැත්තක් ඇත්තේද ජීවිතය කෙරෙහි ඇත්තාවූ දීර්ඝ අත්දැකීම් නිසාමය."*

මේ අනුව පුනර්භවය පිළිබඳව ඇති බෞද්ධ මතයට තහවුරු කළ හැකි විද්‍යාත්මක පදනමක් ඇති බව පැහැදිලිය. එය තාර්කික වන අතර ඊශ්වරවාදී ආගමකින් විසඳිය නොහැකි ප්‍රශ්න බොහෝ ගණනක් විසඳා හමාරය. එසේම එමගින් මිනිසාට බොහෝ සුව පහසුවක්ද ඇති කරයි. ඔබට දෙවැනි අවස්ථාවක් නොමැති, වරද නිවරද කර ගැනීමට නොහැකි, ඔබ විසින් පෝෂණය කරන ලද දක්ෂතා සහ හැකියාවන් තවදුරටත් වර්ධනය කරගත නොහැකි, ජීවිතය පිළිබඳ කරනු ලබන විග්‍රහයකින් කුමන ප්‍රයෝජනයක් නම් ලැබේද? නමුත් බුදුන් වහන්සේට අනුව කෙනෙකුට මෙම භවයේදී නිවන් අවබෝධ කර ගත නොහැකි වී නම් ඊළඟ භවයේදී ඒ සඳහා අවස්ථාව ඇත. මෙම භවයේදී සිදු වූ අඩුපාඩු ඊළඟ භවයේදී නිවැරදි කර ගැනීමට අවස්ථාවක් ඇත. මෙම භවයේදී ළඟා කරගත නොහැකි වූ ජයග්‍රහන කරා ඊළඟ භවයේදී යා හැකිය. මොන තරම් පිළිගත හැකි ඉගැන්වීමක්ද?

## ප්‍රශ්නය - ඔබ මෙතෙක් කී බොහෝ දේ බුද්ධිගෝචරයි. එහෙත් මට තවමත් පුනරුත්තිය ගැන සැකයි.

**පිළිතුර** - එහි වරදක් නැත. බුද්ධාගම ඔබට කිසිවක් පිළිගත යුතු යයි බල කරන්නේ නැත. ඔබ විශ්වාස නොකරන යමක් පිළිගන්නැයි බල කිරීමේ අර්ථයක් නැත. පුනරුත්පත්තිය විශ්වාස නොකරතත් ඔබට පුළුවන් ඔබට පිළිගත හැකි දේ පුරුදු කරන්නට. සමහර විට අනුක්‍රමයෙන් ඔබ එයත් පිළිගන්නට ඉඩ ඇත. එය කාට නම් කිව හැකි ද?

# 6. භාවනාව

## ප්‍රශ්නය - භාවනාව යනු කුමක්ද?

**පිළිතුර** - භාවනාව යනු වැඩීමයි. එනම් මනසේ ක්‍රියාකාරිත්වය විමසා බැලීමට දරන නිරන්තර උත්සාහයකි - වැඩීමකි.

## ප්‍රශ්නය - භාවනාව යනු වැදගත් දෙයක්ද?

**පිළිතුර** - සත්තකින්ම එය ඉතා වැදගත්ය. අප කොයි තරම් හොඳ පුද්ගලයෙකු වීමට උත්සාහ කළත්, ක්‍රියා කිරීමට පොළඹවන ආශාව හඳුනාගෙන වෙනස් කිරීමට නොහැකි නම් හොඳ පුද්ගලයෙකු බවට පත් වීම දුෂ්කර වනු ඇත. අපි මෙසේ සිතමු. කිසියම් පුද්ගලයෙකු තම බිරිඳ සමග නිතරම කේන්ති යන කෙනෙකු නම් මෙම මොහොතේ පටන් එම තත්වයෙන් මිදීමට ඔහු ඉටා ගත්තේ යයි සිතමු. පැයකට පමණ පසු තම බිරිඳට තමා පිළිබඳ අවබෝධයකින් තොරව කටයුතු කරනු ඇතැයි කියා කේන්තියෙන් කෑ ගසනු ඇත. කේන්තිය ඔහුටත් නොදැනීම හටගෙන ඇත. භාවනාව මෙහිදී උදව් කරනුයේ මනස සිහියෙන් යුතුව තබා ගැනීමට අවශ්‍ය ශක්තිය සැපයීමටත්, සහජයෙන් පිහිටි මානසික පුරුදු කෙරෙහි එම ශක්තිය පතුරුවා හැරීමටත්ය.

## ප්‍රශ්නය - භාවනාව භයානක ප්‍රතිඵල ලබා දෙන බව මා අසා තිබේ. මෙහි සත්‍යයතාවයක් ඇත්ද?

**පිළිතුර** - ජීවත් වීමට ලුණු අවශ්‍යය. නමුත් ඔබ ලුණු කිලෝවක් කෑවොත්? එසේම නූතන අවශ්‍යතාවයන් සඳහා අපට මෝටර් රථයක් අවශ්‍යය. නමුත් නියමිත මාර්ග නීති උල්ලංගනය කරමින්, බීමතින් ඔබ එය පැදවුවහොත් මෝටර් රථ අන්තරාදායක යන්ත්‍රයක් බවට පත්වනු ඇත. භාවනාවද මෙවැනිය. භාවනාව මානසික නිරෝගිතාවය සහ යහපැවැත්ම උදෙසා අත්‍යවශ්‍යය. නමුත් එය අනුවණකාරී ලෙස වැරදි ආකාරයෙන් කරයි නම් එමගින් ප්‍රශ්න ඇති විය හැකිය. සමහර පුද්ගලයින්ට මානසික අවපීඩනය, අනියත බිය නොහොත් ස්ක්‍රොප්‍රේනියා වැනි රෝග පවතින විට භාවනාව ඔවුන්ට ක්ෂණික සහනයක් ලබා දෙනු ඇතැයි ඔවුහු සිතති. ඔවුන් භාවනා කළහොත් රෝගය තිබුණාටත් වඩා දරුණු තත්ත්වයට පත්වනු ඇත. කෙනෙකුට එවැනි රෝගී තත්ත්වයක් ඇත්නම් පළමුව කළ යුත්තේ විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබා ඉන් අනතුරුව භාවනාව ඇරඹීමයි. තවත් අය පමණ ඉක්මවා යති. ඔවුහු ක්‍රමානුකූලව ඉදිරියට නොගොස් එක් විටම දැඩි ආයාසයක් සහ ශක්තියක් යොදවා දැඩි වෙහෙසට පත්වෙති. නමුත් මෙහිදී ඇති විශාලම ප්‍රශ්නය "කැන්ගරු ක්‍රමයට" කරන භාවනාවයි. එක් ගුරුවරයෙකු යටතේ ටික කලක් භාවනාව පුරුදු වී පොත් පත්වල ඇති දේ කියවා වෙනත් දෙයක් පුහුණු

වීමට සිතති. ඒ අතරතුරදී ප්‍රසිද්ධ භාවනා ඇදුරුතුමෙකුගේ දේශනයක් අසා සමහර අදහස්වල සිරකරුවෙකු වීමට යාමෙන් ඉතාමත් අසහනයට පත්විය හැකිය. කැන්ගරුවෙකු මෙන් එක් ගුරුවරයෙකුගෙන් තවත් ගුරුවරයෙකුටත් එක අදහසකින් තවත් අදහසකටත් මාරු වීම ප්‍රධාන වරදකි. කෙනෙකුට කිව හැකි තරමේ මානසික ආබාධයක් නොමැති නම් නියමාකාරයෙන් භාවනාව පුහුණු විය හැකි නම් එය ඔබට ඔබ වෙනුවෙන්ම කළ හැකි මහඟු කටයුත්තක් වනු නොඅනුමානය.

## ප්‍රශ්නය - භාවනා ක්‍රම කීයක් ඇත්ද?

**පිළිතුර** - බුදුන් වහන්සේ භාවනා ක්‍රම බොහෝ ගණනක් දේශනා කළහ. එක් එක් ක්‍රම මගින් එක් එක් ආකාරවල මානසික තත්ත්වයන් පාලනය කිරීමත්, දියුණු කිරීමත් වෙනුවෙන් දේශිතය. නමුත් මෛත්‍රී භාවනාව සහ ආනාපානසති භාවනාව යනු ඉතාමත් බහුලව භාවිතා වන ප්‍රයෝජනවත් භාවනා ක්‍රම දෙකකි.

## ප්‍රශ්නය - ආශ්වාස ප්‍රශ්වාසයෙහි සිහිය පිහිටුවා සමාධිය ලබා ගන්නේ කෙසේද?

**පිළිතුර** - මෙය සඳහා පහත සඳහන් කරුණු ගැන දත යුතුයි. එනම් ස්ථානය, ඉරියව්ව, පුහුණුව සහ ඊට අදාළ ප්‍රශ්නයි. පළමුව සුදුසු ස්ථානයක් සොයා ගත යුතුයි. එය බොහෝ විට වැඩි ශබ්දයක් නොමැති භාවනාවට බාධා ඇති විය නොහැකි කාමරයක් වීම වඩාත් සුදුසුය. දෙවැන්න නම් සුදුසු ඉරියව්වයි. බද්ධ පර්යංකයෙන් වාඩි වීම වඩාත්ම සුදුසු ඉරියව්වයි. එනම් පාදයක් නවා අනෙක් පාදය ඒ මත සිටින පරිදි කොට්ටයක් මත හිඳගෙන කොන්ද කෙළින් තබා ගෙන අත්ළ නැමූ දෙපා අතර රඳවාගෙන දෙනෙත් පියාගෙන සිටීමයි. ඔබට කොන්ද කෙළින් තබාගෙන සිටිය හැකි නම් පුටුවක වාඩි වී භාවනා කිරීමද සුදුසුය. තෙවෙනි කරුණ නම් පුහුණුවයි. ඇස් පියාගෙන නිසළව සිටින ඔබ ඇතුළුවන සහ පිටවන හුස්ම ගැන සිහිය යෙදිය යුතුය. මෙය ආශ්වාස-ප්‍රශ්වාස ගණනය කිරීමෙන් හෝ උදරයේ පිම්බීම හැකිලීම නිරීක්ෂණය කිරීමෙන්ද කළ හැකිය. මෙසේ කරන කල්හි අනිවාර්යයෙන්ම නොයෙකුත් ප්‍රශ්න සහ අපහසුතා පැන නගිනු ඇත. ශරීරයේ නොයෙක් තැන්වල ඇතිවන කැසීම් හෝ දණහිස් අමාරු දැනිය හැකිය. මෙසේ සිදුවුවද සිරුර හැකිතාක් නිශ්චලතාවයට පත්කොට හුස්ම වෙතටම සිහිය ගෙන එන්න. නිසැකවම අනවසරයෙන් පැමිණෙන සිතිවිලි ඔබගේ සිත වෙනතකට යොමු කරනු ඇත. මෙම ප්‍රශ්නය විසඳාගත හැකි එකම ක්‍රමය නම් ඉවසීමෙන් යුතුව නැවත නැවතත් සිත ආශ්වාස-ප්‍රශ්වාසය වෙත ගෙන ඒමයි. ඔබ මෙසේ කරන විට අවසානයේදී සිතිවිලි දුර්වල වී ශක්තිමත්ව සමාධිය ලැබී මානසික නිශ්චලතාවයත්, සන්සුන් බවකුත් අත්දකිනු ඇත.

## ප්‍රශ්නය - කොතරම් වෙලාවක් භාවනා කළ යුතුද?

**පිළිතුර** - සතියක් විනාඩි 15 බැගින් භාවනාව කිරීම සුදුසුය. ඉන්පසුව සතියකට විනාඩි 5 බැගින් විනාඩි 45 ක් දක්වා භාවනාව කරන වෙලාව වැඩි කරන්න. සති කිහිපයකට පසුව නොකඩවා භාවනා කරන පුද්ගලයෙකුට ඔහුගේ සමාධිය ඉතා හොඳ තත්ත්වයකට පත්ව අනවසර සිතිවිළි අඩු වී සාමකාමී නිශ්චල මනසක් ලැබෙනු ඇත.

## ප්‍රශ්නය - මෛත්‍රී භාවනාව යනු කුමක්ද? එහි යෙදෙන්නේ කෙසේද?

**පිළිතුර** - ආනාපාන සති භාවනාව ක්‍රමානුකූලව කරන අතරම මෛත්‍රී භාවනාවද කළ හැකිය. එය සුමානයකට තෙවතාවක් හෝ සිව් වතාවක් ආනාපානසති භාවනාව කිරීමෙන් පසුව කළ හැකිය. පළමුව ඔබ ඔබගේ අවධානය ඔබ වෙතටම යොමු කර මෙසේ ප්‍රාර්ථනා කරන්න. "මම වෛර නැත්තෙක් වෙම්වා...මම ක්‍රෝධ නොකරන්නෙක් වෙම්වා...නිදුක් වෙම්වා...නීරෝගී වෙම්වා...සුවපත් වෙම්වා..."මේ අයුරින් ඔබ ප්‍රිය කරන, ඔබ කෙරෙහි මධ්‍යස්ථ වූ සහ අවසානයේදී ඔබ අකමැති යන සියලුම දෙනා වෙත මෛත්‍රිය පතුරුවා ඔවුන් සුවපත් වන ලෙස ප්‍රාර්ථනා කරන්න.

## ප්‍රශ්නය - මෙවැනි භාවනාවකින් ඇති ප්‍රයෝජනය කුමක්ද?

**පිළිතුර** - මෛත්‍රී භාවනාව නියම හැඟීමකින් පුරුද්දක් වශයෙන් කරන කල්හි ඔබ තුළ ඇති වන ගුණාත්මක වෙනස්කම් ඔබටම වැටහෙනු ඇත. බොහෝ දේ අනුමත කරන සහ සමාව දෙන පුද්ගලයෙකු බවට ඔබ ක්‍රමයෙන් පත්වනු ඇත. ඔබ ආදරය කරන අය ගැන ඇති හැඟීම් වඩාත් දියුණු වේ. ඔබට බොහෝ මිතුරන් ඇති වනු ඇත. යම් යම් අය කෙරෙහි අමනාපකම් සහ නුරුස්සන හැඟීම් තිබුණි නම් ඒවා ක්‍රමයෙන් අඩු වී ගොස් අවසානයේදී නැත්තටම නැතිව යනු ඇත. ඔබට හමුවන රෝගී, ප්‍රශ්න සහිත, අමාරුකම් ඇති පුද්ගලයන් වෙත පවා මෛත්‍රිය පතුරුවා හැර එමගින් පවා කිසියම් දියුණුවක් ලබනු ඇත.

## ප්‍රශ්නය - එය සිදු වන්නේ කෙසේද?

**පිළිතුර** - ඉතා සැළකිල්ලෙන් දියුණු කරන ලද මනස බලවත් උපකරණයකි. අපට අපේ මනස සමාධි ගත කර ගැනීමට හැකි නම් එය අන්‍යයන් කෙරෙහිද ප්‍රක්ෂේපණය කළ හැකිය. එමගින් ඔවුන් මත කිසියම් බලපෑමක් ඇති කිරීමට හැකිය. මෛත්‍රී භාවනාව තුළින් හොඳ මානසික ශක්තීන් අන්‍යයන් කෙරෙහි පතුරුවා හැරිය හැකිය.

## ප්‍රශ්නය - වෙනත් භාවනා ක්‍රම තිබේ ද?

**පිළිතුර** - ඔව්. අවසාන වශයෙන් දැක්විය හැකි, ඒ වාගේ ම ඉතා වැදගත් භාවනා ක්‍රමය විපස්සනා භාවනාවයි. එහි අදහස ඇතුළත බැලීම නැත් නම් ගැඹුරට එබී බැලීම යන්නයි. සාමාන්‍යයෙන් අන්තර් ඥාන භාවනාව නමිනුත් හඳුන්වනු ලැබේ.

## ප්‍රශ්නය - විපස්සනා භාවනාව යනු කුමක්ද?

**පිළිතුර** - විපස්සනා භාවනාවේදී භාවනා යෝගියා උත්සාහ කරන්නේ ඔහුට සිදුවන සියලු දෙය පිළිබඳවම වැඩි දුරටත් සිතීමෙන් හෝ ප්‍රතිචාර දැක්වීමෙන් තොරව අවධානයෙන් සිටීමටයි.

## ප්‍රශ්නය - එහි අරමුණ කුමක්ද?

**පිළිතුර** - බොහෝ විට අපගේ අත්දැකීම්වලට අප ප්‍රතිචාර දක්වන්නේ එයට කැමති හෝ අකමැති වීමෙන්ය. එසේත් නැතිනම් එයින් අපගේ සිතිවිලි, නිශ්චල ආශාවන් හෝ මතකයන් උත්තේජනය කිරීමට ඉඩ හැරීමෙනි. මෙම සියලුම ප්‍රතිචාරවලින් සිදුවන්නේ අපගේ අත්දැකීම් විවෘත කිරීම හෝ නොපැහැදිලි කිරීමයි. එවිට අපට එම අත්දැකීම අවබෝධ කරගත නොහැකි වේ.

ප්‍රතිචාර නොදක්වන වැටහීමක් වර්ධනය කරගැනීමෙන් අපට අපගේ සිතිවිලි, වචන හා ක්‍රියාවන් එසේ සිදු වන්නේ ඇයි දැයි දැනගැනීමට පුළුවන් වේ. එසේම ස්වයං අවබෝධය අපගේ ජීවිතවලට ඵලදායක ප්‍රතිඵල ලබා දෙයි. අනෙක් ප්‍රයෝජනය වන්නේ විපස්සනා භාවනාව කලක් ප්‍රගුන කිරීමෙන් අපගේ අත්දැකීම් හා අප අතර පවතින පරතරය අවබෝධ කරගැනීමට හැකිවීමයි. එවිට අපට අත්විඳීමට සිදුවන පෙළඹවීම් හා කුපිත කිරීම්වලට ක්ෂණිකව හා කල්පනාවෙන් තොරව ප්‍රතික්‍රියා නොදක්වා කල්පනාකාරීව සුදුසු ලෙස ක්‍රියා කිරීමට පුරුදු වේ. එලෙස අපට, අපගේ ජීවිතය වඩා හොඳින් පාලනය කරගැනීමට හැකියාව ලැබේ. දැඩි අධිෂ්ඨානයෙන් නොව නිවැරදි දැකීම මඟින් අපගේ ජීවිතය පාලනය කරගැනීමට මෙයින් හැකිවේ.

## ප්‍රශ්නය - එසේ නම් විපස්සනා භාවනාවෙන් අපට වඩා ගුණවත් හා ප්‍රීතිමත් පුද්ගලයින් බවට පත්විය හැකි බව පැවසීම නිවැරදිද?

**පිළිතුර** - ඇත්ත වශයෙන්ම එය ඉතා වැදගත් ආරම්භයක් ලෙස සැලකිය හැක. නමුත් විපස්සනා භාවනාවේ එයට වඩා උතුම් අරමුණක් ඇත. එනම් භාවනාව පරිණත වී එමගින් අපගේ අවබෝධය ගැඹුරු වූ විට, අපගේ අත්දැකීම් අපටම පෞද්ගලික නොවන බවත්, එසේම ඒවා "මා" විසින් සිදු කරන්නේ නැති බවත්, තවදුරටත් ඒ සියල්ල "මා" විසින් අත් නොවිඳින බවත් අවබෝධ වේ.

ආරම්භයේදී, භාවනා යෝගියාට මෙය වරින් වර ක්ෂණිකව සුළු මොහොතකට දැනෙන නමුත් කල්යත්ම එය වඩාත් හොඳින් අවබෝධ වේ.

## ප්‍රශ්නය - ඒ පිළිබඳව තරමක බියක් ඇති වෙනවා නේද?

**පිළිතුර** - ඔව්. එසේ හිතෙනවා නේද? ඇත්ත වශයෙන්ම සමහරුන්ට මෙම අත්දැකීම මුලින්ම දැණුන විට තරමක් දුරට බියක් ඇති වෙනවා. නමුත් ඉක්මනින් ගැඹුරු අවබෝධය මගින්, එනම් අපගේ අත්දැකීම් පිළිබඳව අප හැමවිටම සිතූ ආකාරය වැරදි බව වැටහීමෙන් මෙම බිය නැතිවෙනවා. ''මමය'', ''මාගේය'' යන හැඟීම් ටිකින් ටික දුර්වල වී, කාලයත් සමග සම්පූර්ණයෙන් නැතිවී යයි. මෙය බෞද්ධයෙකුගේ ජීවිතය හා ඔහුගේ දර්ශනය ඇත්ත වශයෙන්ම වෙනස්වන අවස්ථාව ලෙස ගත හැක.

කොපමණ පෞද්ගලික, සමාජීය මෙන් ජාත්‍යන්තර අරගලයන් මෙම දැඩි මමත්වය නිසා හටගෙන තිබෙනවාදැයි සිතා බලන්න. බුදු දහමට අනුව අපට නියම සාමය හා සතුට දැකිය හැකි වන්නේ අපගේ නියම ස්වභාවය අවබෝධ කරගැනීමෙනි. අප නිර්වානය වශයෙන් හඳුන්වන්නේ මෙයයි.

## ප්‍රශ්නය - එය ඉතා ආකර්ශනීය අදහසකි. නමුත් එය තරමක් තැතිගන්වන සුළුත් නොවේද? නිර්වානය අවබෝධ කරගත් අයෙකු මමය, මාගේය යන හැඟීමක් හා හිමිකම් පිළිබඳ හැඟීමක් නැතිව ක්‍රියා කරන්නේ කෙසේද?

**පිළිතුර** - එසේ නම්, නිර්වානය අවබෝධ කරගත් අයකු අපෙන් 'ඔබ මමත්වයෙන් හා හිමිකම් පිළිබඳ අදහස්වලින් යුතුව ක්‍රියා කරන්නේ කෙසේද' යැයි විමසිය හැක. එසේම ඔබ තුළ හා අන් තුළ ඇති සියලු බිය, ඊර්ෂ්‍යාව, කම්පාව හා මානය වැනි අප්‍රසන්න සිතිවිලි ඉවසන්නේ කෙසේද? වැඩි වැඩියෙන් රැස්කර ගැනීමට, අන් අයට වැඩියෙන් ඉදිරියෙන් සිටීමට හා සියල්ල නැතිවේය යන කරදරකාරී සිතිවිලිවලින් ඔබ කිසිවිටකත් හෙම්බත් නොවන්නේ දැයි ද අසාවි.

මේ අනුව බලන විට නිර්වානය අවබෝධ කරගත් පුද්ගලයෝ ජීවිතය හොඳින් ගතකරනවා. සියලු ප්‍රශ්න ඇත්තේද, ඇති කරන්නේද ඔබ හා මා වැනි ලෞකික පුද්ගලයන් විසින්ය.

## ප්‍රශ්නය - ඔබ කියන දෙය මට වැටහෙනවා. නමුත් ඔබට නිර්වානය අවබෝධ කරගැනීමට කොපමණ කාලයක් භාවනාව වඩන්නට සිදුවෙනවාද?

**පිළිතුර** - එය කොපමණ කාලයක් දැයි කීමට අපහසුය. එසේම එය එතරම් වැදගත් කාරණයක්ද නොවේ. භාවනා කිරීම ආරම්භ කර එයින් ඔබට ලැබෙන්නේ කුමක් දැයි නොබලන්නේ මන්ද?

අවංකව, සිහි බුද්ධියෙන් භාවනාව පුරුදු කළ විට ඔබගේ ජීවිතයේ සැලකිය යුතු දියුණුවක් ඇතිවන බව ඔබටම වැටහේවි. එසේම කාලයත් සමග ඔබට ධර්මය හා භාවනාව තවදුරටත් ගවේශනය කිරීමේ අදහසක් ඇතිවිය හැක. තව දුරටත් යනවිට, එය ඔබගේ ජීවිතයේ වැදගත්ම අංගය බවට පත්විය හැකිය. ගමන ආරම්භ කිරීමට පෙරම උසස් ඵල පිළිබඳව අනුමාන කිරීම හා වෙහෙස වීම නවතා පියවරෙන් පියවර භාවනාව දියුණු කරගන්න.

## ප්‍රශ්නය - භාවනාව ඉගෙන ගැනීමට ගුරුවරයෙකු අවශ්‍යද?

**පිළිතුර** - අත්‍යවශ්‍යම නැත. එහෙත් භාවනාව පුහුණු කරන ගුරුවරයෙකුගේ මාර්ගෝපදේශකත්වය ඔබට ඉතා උපකාරී වනු ඇත. අවාසනාවකට මෙන් බොහෝ භික්ෂූන් සහ පුද්ගලයෝ තමන් කරන දේ ගැන පූර්ණ අවබෝධයකින් තොරව තමන් ගුරුවරුන් යයි සිතා කටයුතු කරති. එබැවින් සමාජ ප්‍රසාදයක් සහිත, තුළනාත්මක පෞරුෂයක් හිමි, බුදුන් වහන්සේ ඉගැන්වීම්වල ස්ථිරව පිහිටි ගුරුවරයෙකු සොයා ගැනීමට වෙහෙස වීම වැදගත්ය.

## ප්‍රශ්නය - නූතන මනෝ වෛද්‍යවරයන් හා මනෝ චිකිත්සකයින් විශාල ලෙස භාවනාව යොදා ගන්නා බව මා අසා තිබේ. එය සත්‍යයක්ද?

**පිළිතුර** - ඔව් එය සත්‍යයක්ය. බෝහෝ මානසික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් භාවනාවෙන් මානසික විවේකය ඇති කිරීම, විවිධ භීතිකාවන් මැඩ පැවැත්වීම, සිහි කල්පනාව වැඩි කිරීම වැනි උසස් චිකිත්සීය ගුණයන් ඇති බව පිළිගනී. බුදුන් වහන්සේ මනස අවබෝධ කරගැනීමේ හැකියාව අතීතයේ මෙන්ම අදටත් අපට උපකාරී වේ.

# 7. ප්‍රඥාව සහ කරුණාව

**ප්‍රශ්නය - බෞද්ධයෝ නිතරම ප්‍රඥාව සහ කරුණාව ගැන කතා කරති. මෙමගින් සත්‍ය වශයෙන් කුමක් අදහස් වේද?**

**පිළිතුර** - සමහර ආගම් කරුණාව නැතිනම් ප්‍රේමය ගැන ඉතා වැදගත් කමක්දී කතා කළද ඔවුන් ප්‍රඥාව දියුණු කිරීමට අසමත්ය. මෙහි ප්‍රතිඵලය වන්නේ හොඳ හදවතක් ඇති මෝඩයකු බිහිවීම හෝ ඉතාමත් කරුණාවන්ත නමුත් යමක සත්‍ය ස්වභාවය තේරුම් ගත නොහැකි පුද්ගලයෙකු ඇති වීමයි. අනෙක් අතට විද්‍යාව දැනුම පරතෙරට දියුණු කිරීමට උත්සාහ දරන අතර ආදරය, දයාව, කරුණාව පසෙකින් තබයි. මෙහි ප්‍රතිඵලය වන්නේ විද්‍යාව මඟින් කලින් සැලසුම් කරන ලද මිනිසුන් බිහි කිරීමට වෙර දරන අතර විද්‍යාවේ පරමාර්ථය වන මිනිසාට සේවය කිරීම අමතක කර දැමීමයි. එය එසේ නොවන්නේ නම් විද්‍යාඥයින් තම දක්ෂතා න්‍යෂ්ඨික බෝම්බ, ජීව විද්‍යාත්මක අවි වැනි දේ නිපදවීමට යොදවන්නේ කෙසේද? බොහෝ ආගම් හේතුන් සහ ප්‍රඥාව ප්‍රේමයේ සහ විශ්වාසයේ සතුරන් ලෙස සලකයි. විද්‍යාව බොහෝ විට ප්‍රේමය සහ ආදරය වැනි හැඟීම් හේතූන් සහ විෂය මූලික කරුණුවල සතුරන් ලෙස සලකයි. ඇත්ත වශයෙන්ම විද්‍යාව දියුණු වන විට ආගම් පරිහානිය කරා යයි. අනෙක් අතට බුදු දහම සමබර පුද්ගලයෙකු වීමට ප්‍රඥාවත් (බුද්ධියත්), කරුණාවත් යන අංග දෙකම දියුණු කිරීමට උගන්වයි. බුදු දහම සිය මතයෙහිම එල්බ නොසිටින නමුත් අත්දැකීම් මත රඳා පවතින දහමක් නිසා විද්‍යාවෙන් එල්ල වන කිසිම තර්ජනයකට බිය වීමට බුදු දහමට අවශ්‍ය නොවේ.

**ප්‍රශ්නය - එසේ නම් බුදු දහමට අනුව ප්‍රඥාව යනු කුමක්ද?**

**පිළිතුර** - බුදු දහමට අනුව ප්‍රඥාව යනු සෑම ධර්මතාවයකටම පොදු වූ ත්‍රිලක්ෂණය - එනම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය - අවබෝධ කර ගැනීමයි. මෙම අවබෝධය කෙනෙකුව පරම සුන්දර නිර්වානය කරා යොමු කරවයි. කෙසේ වෙතත් බුදුන් වහන්සේ මේ ගැන කතා කරමින් කල් ගත කිරීම අනුමත කළේ නැත. මක්නිසාද යත් එය කෙනෙකු කියන නිසා පිළිගත යුත්තක් නොවන බැවිනි. මෙය කෙනෙකු තමා විසින්ම දැක අවබෝධ කරගත යුත්තකි. මෙහිදී වැදගත් වනුයේ අන්ධ ලෙස මතවාදවලට වහල් වීමට වඩා විවෘත මනසකින් විමසා බැලීමයි. අදානග්‍රාහී වීමට වඩා අන් මතවලට ඇහුම්කන් දීමයි. අපගේ හිස් වැල්ලේ සඟවා ගැනීමට වඩා අප විශ්වාස කරන කාරණා දෙස ප්‍රවේශමෙන් සළකා බැලීමයි. පාක්ෂිකයන් බවට පත්ව අගතියට යාමට වඩා කරුණු කාරණා සහිතව වටහා ගැනීමයි. පළමුව දැනෙන සහ හැගුම්බර දෙවල් විශ්වාස කරනවාට වඩා කාලයක් ගතකොට නිවැරදි දේ ගොනුකර අපේ අදහස් පැවසීමයි. නිවැරදි නම් අපට

එරෙහි වූ අය කියන දේ පවා පිළිගැනීමට තරම් නිහතමානී වීමයි. මේ අනුව ක්‍රියා කරන පුද්ගලයා සැබවින්ම ශ්‍රද්ධාවන්ත සහ අවසානයේදී නියම අවබෝධය ලබන්නෙකි. විශ්වාසය මත පදනම් වූ මාර්ගයක් පිළිපැදීමට ඉතා ලෙහෙසි වුවද බුදුන් වහන්සේ දේශනා කරන ලද මාර්ගයේ ගමන් කිරීමට නම් වීර්යය, ඉවසීම, නම්‍යශීලීබව සහ බුද්ධිය අත්‍යවශ්‍යය.

## ප්‍රශ්නය - මේ අනුව බුදු දහම ඉතා සුළු පිරිසකට පමණක් පුහුණු විය හැකි දහමක් බව පෙනේ එමගින් කවර නම් ප්‍රයෝජනයක් ලැබිය හැකිද?

**පිළිතුර** - බුදු දහම පිළිපැදීමට හැමදෙනාම සූදානම් නොමැති බව සත්‍යයකි. නමුත් ඒ නිසාම අප කළ යුත්තේ ඉගැන්වීමට ලෙහෙසි බොහෝ දෙනාට වැටහෙන මිත්‍යාවන් සහිත ආගමක් ප්‍රචාරය කිරීම නම් එය හාස්‍යයට සුදුසු කතාවක් නොවන්නේද? බුදු දහමට නිවැරදි ඉලක්කයක් ඇති අතර යමෙකුට මේ භවයේදී එය වටහා ගැනීමට නොහැකි නම් ඊළඟ භවයේදී ඒ සඳහා අවකාශ ඇත. නමුත් නියම තත්ත්වය වටහා දීමෙන් සහ උනන්දු කරවීමෙන් මෙම අවබෝධය ලබා දිය හැකි බොහෝ අය සිටිති. බෞද්ධයන් මහත් උනන්දුවකින් යුතුව බුදු දහමේ හරය අනෙක් අය සමග බෙදා හදා ගැනීමට සැදී පැහැදී සිටින්නේද මේ නිසාමය. බුදුන් වහන්සේ අප කෙරෙහි වූ පතළ මහා කරුණාවෙන් යුතුව මෙම දහම අපට දේශනා කළ අතර අපි අන් අය කෙරෙහි ඇත්තාවූ මහත් කරුණාවෙන් යුතුව බුදු දහම අන් අයට උගන්වමු.

## ප්‍රශ්නය - බුදු දහමට අනුව කරුණාව යනු කුමක්ද?

**පිළිතුර** - ප්‍රඥාව මගින් බුද්ධිය නැතිනම් තේරුම් ගැනීමේ ස්වභාවය ආවරණය කළ පරිද්දෙන් කරුණාව මගින් හැඟීම් ස්වභාවය වෙනුවෙන් සාධාරණයක් ඉටු කරයි. බුද්ධිය මෙන්ම කරුණාවත් මිනිසාටම ආවේණික ලක්ෂණයකි. කරුණාව දයාවේත්, අනුකම්පාවේත් සංකලනයක් ලෙස දැකිය හැකිය. යමෙක් ශෝකාකූලව සිටිනා විට ඔහුගේ ශෝකය අපි අපේම ශෝකයක් ලෙස දකිමු. එසේම එම ශෝකය තුනී කිරීමටත්, නැති කිරීමටත් අපි උත්සාහ ගනිමු. කරුණාව යනු මෙයයි. කරුණාවන්ත පුද්ගලයා අනුන්ට කරුණාව දැක්වීමට පටන් ගන්නේ පළමුව තමාටම කරුණාව දැක්වීමට පෙළඹීමෙනි. අන්‍යයන් ගැන වටහා ගැනීමට අපට හැකි වන්නේ අප ගැනම අවබෝධ කර ගැනීමෙනි. අන්‍යයන්ට සුදුසුම දේ අපට දැනගත හැකිවන්නේ අපට සුදුසුම දේ වටහා ගතහොත් පමණෙකි. අපට අන් අය කෙරෙහි හැඟීමක් ඇති කර ගත හැක්කේ අප ගැනම හැඟීමක් ඇති කර ගැනීමෙනි. එබැවින් බුදු දහමට අනුව කෙනෙකුට තම අධ්‍යාත්මය පුබුදුවා ගැනීමෙන් ඉතාමත් ස්වභාවික ලෙසින් අන්‍යයන්ගේ සැපත වෙනුවෙන්ද යමක් කළ හැකිය. බුදුන් වහන්සේගේ ජීවිතය තුළින්ම මෙය උන්වහන්සේ අපට පහදා දුන් සේක.

උන්වහන්සේ තමාගේ යහපත වෙනුවෙන් අවුරුදු හයක් වැය කළහ. එහි ප්‍රතිඵලය වූයේ මුළු මහත් මානව සංහතියේම යහපත වෙනුවෙන් උන්වහන්සේට කටයුතු කළ හැකි වීමයි.

## ප්‍රශ්නය - බුදු දහම තුළ විශ්වාසයන්ට ක්‍රියාත්මක වීමට භූමිකාවක් තිබේද?

**පිළිතුර** - සමහර ආගම්වලට අනුව පුද්ගලයා විශ්වාසයන්ට අනුව ගැලවීම ලැබේ. එනම්, ඔවුහු යම් දේවවාදී අදහස් කිහිපයක් සත්‍ය ලෙස පිළිගනිති. මෙය උත්තරීතර සත්වයා සතුටු කරයි. මෙම සත්වයා සමග සබඳතාවයක් ඇති කරන අතර ඔහු පුද්ගලයා ගලවා ගනිමින් ප්‍රතිචාර දක්වයි. බුදු දහමේ විශ්වාසය (සද්ධාව) වෙනස් ආකාරයකට අවබෝධ කරනු ලැබේ. අපි මෙසේ උදාහරණයක් ගනිමු. මම ලෙඩ වී යැයි සිතමු. මම මෙය මිතුරකුට පැවසූ අතර ඔහු මාව වෛද්‍යවරයකුට යොමු කළේය. මෙම වෛද්‍යවරයා හොඳදැයි මම නොදනිමි. එහෙත් මගේ මිතුරා කෙරෙහි ඇති විශ්වාසය හා පැහැදීම නිසා මගේ මිතුරාගේ නිගමනයට එකඟ වී වෛද්‍යවරයා හමුවීමට වේලාවක් වෙන් කරවා ගෙන වෛද්‍යවරයාගේ සායනයට යමි. එහිදී වෛද්‍යවරයා හමුවන තුරු රැඳී සිටින කාමරයේ දී ඔහු පිළිබඳව බැම්මේ එල්ලා ඇති සහතික පරීක්ෂා කරමි. මම මෙම වෛද්‍යවරයා දේශීය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිය හදාරා ඇති බවත් ඊට පසුව උසස් අධ්‍යාපනය සඳහා ලන්ඩනයට ගොස් ඇති බව දැනගතිමි. ඇතැම්විට මෙම සහතික බොරු එවා විය හැකිය. නමුත් මම මේවා සත්‍ය එවා ලෙස පිළිගනිමි. සෞඛ්‍ය අමාත්‍යාංශය හා වෛද්‍ය සභාව මනාව සුදුසුකම් ලත් අය පමණක් වෛද්‍ය වෘත්තියේ සේවයේ යෙදවීමට කටයුතු කරනු ඇතැයි විශ්වාස කරමි. මම අවසානයේ දී වෛද්‍යවරයා දැකීමට යමි. එහිදී ඇය දැනුමෙන් පිරි ප්‍රසන්න සහ සැලකිලිමත් වෛද්‍යවරියක් බව දැනගතිමි. ඇය නියම කරන ලද බෙහෙත් වලින් මම ඉක්මණින්ම සුවය ලදිමි. මෙම වෛද්‍යවරයා හොඳදැයි අත්දැකීමෙන් මාහට නොතිබිණි. නමුත් දැන් එම අත්දැකීම වෛද්‍යවරිය පිළිබඳ විශ්වාසය වැඩි කිරීමට හේතුවිය. පසුව ඇය නැවත දෙවතාවක් රෝග වලට ප්‍රතිකාර ගැනීමට හමුවූ අතර ඇය හොඳ වෛද්‍යවරියක් බව දනිමි. දැන් ඇය පිළිබඳ තවදුරටත් විශ්වාසයක් නොමැති අතර ඇය හොඳ බව අත්දැකීමෙන්ම දනිමි. නමුත් කිසිදිනක එම දැනුම ලැබ ගැනීමට මට ඇය පිළිබඳ යම් ආකාරයක විශ්වාසයක් ඇතිකර මිතුරාගේ අවවාදය පිළිබඳ විශ්වාසය තබා නොගත්තේ නම් එම දැනුම ඇති නොවනු ඇත.

## ප්‍රශ්නය - අපට අන් අයට උදව් කළ හැක්කේ අප, අපහටම උදව් කරගතහොත් පමණක්ද? එය ආත්මාර්ථකාමී අදහසක් නොවේද?

**පිළිතුර** - අපි නිතරම පරමාර්ථ ගැන අසමු. දකිමු. එනම් තමන්ට පෙර අන්‍යයන්ට සැළකීමයි. එහි විරුද්ධ ස්වභාවය නම් ආත්මාර්ථයයි. එනම් අනුන්ට පෙර තමාටම සළකා ගැනීමයි. බුදු දහම මේ එකක්වත් අනෙකට වඩා වැදගත් යයි නොසිතන අතර මෙම අදහස් දෙකේම මනා මුසුවක් පිළිගනියි. නියමාකාරයෙන් යමෙක්

තමාව දකින විට එම හැඟීම් ක්‍රමයෙන් මුහුකුරා ගොස් තමා සහ අන්‍යයන් අතර වෙනසක් නොමැති බව වටහා ගනියි. මෙය නියම කරුණාවයි. කරුණාව බුදු දහම නැමැති ඔටුන්නෙහි පැළඳු අගනාම මාණික්‍යයයි.

## ප්‍රශ්නය - ඔබ කරුණාව සහ සෙනෙහස එක සමාන බව කලින් පැවසුවා. එසේ නම් ඒවා වෙනස් වන්නේ කෙසේද?

**පිළිතුර** - කරුණාව හා සෙනෙහස එකිනෙක හා සම්බන්ධ බව පැවසීම වඩාත් උචිතය. ඉංග්‍රීසි භාෂාවේ 'Love' යන වචනය පුළුල් හා විවිධ හැඟීම් සමූහයක් විස්තර කිරීමට භාවිතා වේ. අපට දෙමව්පියන්ට, බිරිද හෝ සැමියාට, දරුවන්ට අපගේ මිතුරන්ට සහ අසල්වාසීන්ට සෙනෙහස දැක්විය හැක. නමුත් මේ සියලු දෙනාම කෙරේ ඇති හැඟීම්වල විවිධ වෙනස්කම් තිබුණද ඒ සියල්ලටම පොදුවේ 'සෙනෙහස' (Love) යැයි පැවසීමට තරම් ප්‍රමාණවත් සමාන ලක්ෂණ තිබේ. මේ සමාන ලක්ෂණ මොනවාද? අපි කිසිවෙකුට සෙනෙහස දක්වන විට අපි ඔවුන්ගෙන් සමීපත්වයක් බලාපොරොත්තු වීම, ඔවුන් තුළින් සිත්ගන්නා සුළු බවක් දැනීම, ඔවුන්ගේ යහපත කෙරේ උනන්දු වීම, ඔවුන්ගේ ඇති අන්‍යයන් තුළ කෝපය ඇති කරන ගති සිරිත් අපට කරදරයක් නොවීම, ඔවුන්ට ස්වභාවයෙන්ම කාරුණික වැනි ලක්ෂණ වේ.

අන් අය කෙරේ ඇති බැඳීම, කරුණාව, තැකීම හා හැඟීමක් දැක්වීම යන සියල්ලටම සෙනෙහස (Love) යන වචනය භාවිතා කරයි. බොහෝ විට අපට සෘජුවම සම්බන්ධ අය කෙරේ මෙවැනි හැඟීම් ඇති වේ. බුදුන් වහන්සේ විසින් ලොව සිටිනා සියලුම සත්වයන් කෙරේ සෙනෙහස දැක්වීමට උත්සාහ කළ ආකාරය මෙසේ දක්වා තිබේ.

*"මවක් තම එකම දරුවා දිවි හිමියෙන් රකිනවා සේම, ලොව වෙසෙන සියලු සතුන් කෙරේ අප්‍රමාණ සෙනෙහස වැඩිය යුතු වේ." සු.නි. 150*

බුද්ධ ධර්මයේ මෙම මිනිය නොහැකි සෙනෙහස 'මෛත්‍රිය' ලෙසින් හඳුන්වනු ලැබේ. යමෙක් දුකින් හෝ පීඩාවෙන් සිටිනවා දකින විට, අපට ඔවුන් පිළිබඳව ඇති සෙනෙහසේ තැකීම ප්‍රධාන තැන ගනී. එය කරුණාව ලෙසින් ප්‍රකාශ වේ. මේ අනුව කරුණාව (Compassion) යනු අන්‍යයන් දුකට පත්වී ඇති විට ඇතිවන සෙනෙහස වේ.

## ප්‍රශ්නය - ඔබ කරුණාවෙන් හා මෘදු බවින් සිටිනා විට අන් අය ඔබව පාගා දැමීමට උත්සාහ කරනවා යැයි මට සිතෙයි.

**පිළිතුර** - බොහෝ විට එය එසේ විය හැක. නමුත් ඔබ ආත්මාර්ථකාමී හා කලහකාරී පුද්ගලයෙකු වුවත්, හැමවිටම ඔබටත් වඩා නිර්දය පුද්ගලයන් සිටින

බැවින් එසේ සිදු නොවන බවට සහතිකයක් නැත. සමහර පුද්ගලයන් ඔබගේ ගුණවත් බවින් අයුතු ප්‍රයෝජන ගැනීමට උත්සාහ කළත්, තවත් බොහෝ අය ඔබගේ ගුණවත්කමට ප්‍රශංසා කරන අතරම එය ගරු කරයි. හැමවිටම, ඔබට ඔබෙන් අයුතු ප්‍රයෝජන ගන්නන්ට වඩා වැඩි මිතුරන් හා උදව්කරන්නන් පිරිසක් ඇතිවේවි. එසේම, ඔබ අන් අය තුළ දැකීමට අපේක්ෂා නොකරන ලක්ෂණ, ඔබ තුළ වර්ධනය කරගැනීමට උත්සාහ කරන්නේ මන්ද?

# 8. නිර්මාංශ ආහාරය

## ප්‍රශ්නය - බෞද්ධයෝ අවශ්‍යයෙන්ම ශාක භක්ෂකයෝම විය යුතුද?

**පිළිතුර -** එය අත්‍යවශ්‍යම නොවේ. බුදුන් වහන්සේ පවා මාංශ භක්ෂණයෙන් සපුරා වැළකී සිටි කෙනෙකු නොවේ. උන්වහන්සේ තමාගේ අනුගාමිකයෝ නිර්මාංශකයන් විය යුතු බව දේශනා නොකළ අතර නිර්මාංශකයන් නොවන හොඳ බෞද්ධයෝ ඇත්තාහ.එය බෞද්ධ ග්‍රන්ථවල මෙසේ සඳහන්වේ.

*රළුවීම,අකාරුණවීම,අනුන්ගේ දොස් කියන, මිතුරන්ට නොසලකන, ලතෙත් නොවන, මානාධික, පහත්, කිසිවකුට කිසිවක් නොදෙන, යන මේවා අපිරිසිදු කුණු මස් ආහාර වැනිය. මස්කෑම නොවේ.*

*දුසිල්වීම, ගත් ණය නොගෙවන, අන් අයට ද්‍රෝහීවන, කූට ව්‍යාපාර පවත්වාගෙන යන හා මිනිසුන් අතර භේද භින්නතා ඇතිකරන යන මේවා අපිරිසිදු කුණු මස් ආහාර වැනිය. මස්කෑම නොවේ.*

*සතුන් මැරීම, සොරකම් කිරීම, අන් අයට හිංසා කිරීම, දුසිල්වීම, කුරිරු, දරුණු හා අන්‍යයන් කෙරෙහි අගෞරවණීය බව යන මේවා අපිරිසිදු කුණු මස් ආහාර වැනිය. මස්කෑම නොවේ. (සු.නි., චූ.ව,**244,245,246**)*

## ප්‍රශ්නය - නමුත් ඔබ මාංශ භක්ෂණය කරන විට වක්‍රාකාරයෙන් සත්ව ඝාතනයට හවුල් වෙනවා නොවේද? එය පළමු සිල් පදය කඩ කිරීමක් නොවන්නේද?

**පිළිතුර -** එමගින් ඔබ යම් තරම් දුරට හෝ සත්ව ඝාතනයට හවුල් වෙන බව සැබෑය. නමුත් ශාක ආහාර ගැනීමෙන්ද එවැනි දෙයක් සිදුවන්නේය. කුඩා කෘමීන් වනසන විෂ ද්‍රව්‍ය ගොවි මහතුන් විසින් භාවිතා කරන අතර එමගින් පවා ප්‍රාණ ඝාතයට අප හවුල් වනවා නේද? එසේම ඔබ භාවිතා කරන අත් බෑගය, බඳ පටිය, ඇඳුම් පිරිසිදු කරගන්නා සබන් වැනි දහසකුත් එකක් දේ වෙනුවෙන් සත්ව ඝාතනය සිදුවේ. එබැවින් මොනම ආකාරයෙන් හෝ වක්‍රාකාරයෙන් සිදුවන සත්ව ඝාතනයකට හවුල් නොවී ජීවත් වීම අසීරු කරුණකි. මෙමගින් පැහැදිළි වන සත්‍ය කරුණ නම් පළවෙනි ආර්ය සත්‍යයෙන් කියවෙන දුක්ඛ සතයයි. පළමු සිල්පදය සමාදන් වීමෙන් වක්‍රාකාරයෙන් නොව කෙළින්ම සිදුවන සත්ව ඝාතනයකට හවුල් වීමෙන් ඔබ වළකිනු ඇත.

## ප්‍රශ්නය - මහායාන බෞද්ධයෝ මාශ ආහාර ගැනීමෙන් වළකිනවා නොවේද?

**පිළිතුර** - මෙය සත්‍යයක් නොවේ. චීනයේ මහායාන බෞද්ධයෝ බොහෝ වෙහෙසක් දරා ශාක භක්ෂකයින් මෙන් සිටියත්, ජපානයේ සහ ටිබෙටයේ භික්ෂූහු සහ භික්ෂුණීහු මාංශ ආහාර අනුභව කරති.

## ප්‍රශ්නය - නමුත් මා තවදුරටත් විශ්වාස කරනුයේ බෞද්ධයන් ශාක පමණක් භක්ෂණය කළ යුතු බවයි.

**පිළිතුර** - ශාක ආහාර පමණක් භක්ෂණය කරන නමුත් ආත්මාර්ථකාමී, නපුරු සහ වංක අය සිටිති. මාංශ ආහාර ගත්තද පරාර්ථකාමී, කරුණාවන්ත සහ අවංක අය සිටිති. මෙම අයගෙන් වඩා හොඳ බෞද්ධයෝ කවරහුද?

## ප්‍රශ්නය - පරාර්ථකාමී, කරුණාවන්ත සහ අවංක අයයි.

**පිළිතුර** - ඇයි?

## ප්‍රශ්නය - එවැන්නන්ට සැබැවින්ම හොඳ අවංක හදවතක් ඇති බැවිනි.

**පිළිතුර** - ඔබ නිවැරදියි. සැබැවින්ම මාංශ ආහාර ගත්තද යමෙකුට හොඳ හදවතක් තිබිය හැකිවාක් මෙන්ම ශාක ආහාර පමණක් ගන්නා අය තුළ අපිරිසිදු හදවතක් තිබිය හැකිය. බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව වැදගත් කාරණය වන්නේ ඔබගේ හදවතේ වටිනාකම මිස ඔබ ගන්නා ආහාරයේ අඩංගු ද්‍රව්‍ය නොවේ. බොහෝ බෞද්ධයෝ මාංශ ආහාර නොගැනීමට දැඩි වෙහෙසක් දරන අතර ආත්මාර්ථකාමී, වංක, නපුරු සහ ඊර්ෂ්‍යා සහගත හැඟීම් ගැන වැඩි තැකීමක් නොකරති. ඔවුන් තම ආහාරය වෙනස් කරන්නේ එය ලෙහෙසි කාරණයක් නිසාත්, ඔවුනගේ හදවත ගැන සැලකිල්ලක් නොදක්වන්නේ එය අසීරු කරුණක් නිසාත්ය. එබැවින් බුදු දහමේ උතුම් පරමාර්ථය වන්නේ තම තමන්ගේ සිත පිරිසිදු කර ගැනීමයි.

## ප්‍රශ්නය - නමුත් බුද්ධාගමට අනුව, හොඳ අවංක හදවතක් ඇති නිර්මාංශ ආහාරය ගන්නා පුද්ගලයෙකු හොඳ අවංක හදවතක් ඇති මාංශ ආහාර ගන්න පුද්ගලයෙකුට වඩා හොඳ නැත්ද?

**පිළිතුර** - අවංක හදවතක් ඇති නිර්මාංශිකයෙකුගේ මාංශ ආහාරයට නොගැනීමට පෙලඹීමේ හේතුව සතුන් කෙරේ දක්වන සැලකිල්ල හා නූතන මහා පරිමාණයේ සත්ව ගොවිපලවල අකමැත්ත නම් ඔහු ඒකාන්තයෙන් අන් අය කෙරේ දක්වන සැලකිල්ල හා කරුණාව, මාංශ ආහාරයට ගන්නා පුද්ගලයන්ට වැඩියෙන් දියුණුකර ඇත. බොහෝ අය ධාර්මික ප්‍රතිපත්ති දියුණු කරනා විට නිර්මාංශ ආහාරයට යොමු වීමද වැඩිවන බව දැක තිබේ.

**ප්‍රශ්නය - බුදුන් වහන්සේ පිරිනිවන් පෑවේ පිලුණු වූ ඌරු මස් ආහාරයට ගැනීම නිසා බව යමෙකු මට කියා ඇත. මෙය සත්‍යයක්ද?**

**පිළිතුර** - නැත. එය එසේ නොවේ. බුදුන් වහන්සේගේ අවසාන ආහාර වේලෙහි 'සූකර මද්දව' තිබූ බව ත්‍රිපිටකයේ සඳහන් වෙයි. නමුත් මෙහි අර්ථය තවමත් නිවැරදිව අවබෝධ කර නැති අතරම, 'සූකර' යනු ඌරා බැවින් එය ඌරු මසින් පිළියෙල කළ ව්‍යාංජනයක් විය හැකි වුවත්, එය එළවළු වර්ගයක්, පස් තැලක් හෝ වෙන යමක්ද විය හැක. බුදුන් වහන්සේ පිරිනිවන් පානා විට උන්වහන්සේ රෝගීව සිටියේය. සත්‍යය නම් බුදුන් වහන්ස් වයසට පත්වීමෙන් පිරිනිවන් පෑ බවයි.

# 9. වාසනාව සහ දෛවය

## ප්‍රශ්නය - ශාස්ත්‍ර කීම, පේන කීම වැනි දේ ගැන බුදුන් වහන්සේ කියන ලද්දේ කුමක්ද?

**පිළිතුර** - ශාස්ත්‍ර කීම, ආරක්ෂාව සඳහා යන්ත්‍ර පැළඳීම, ගොඩනැගිලි සෑදීම සඳහා නැකැත් මත යැපීම, හොඳ දවස් නරක දවස් යැයි වෙන් කර ගැනීම යනාදී දේවල් යමෙක් තම ගෝල පරපුරට පුහුණු කරන්නේ නම් ඔහු වංචා කාරයෙකි. බුදුන් වහන්සේට අනුව මේවා පහත් කලාවන්ය.

*"සමහර ආගම් නිසා යැපෙන්නන් තම අනුගාමිකයන්ගේ ආහාර ආදියෙන් යැපෙමින් ඔවුන් උදෙසා ශාස්ත්‍ර කීම, පේන කීම, සිහින නිර්වචනය කිරීම යනාදී පහත් කලාවන්ගෙන් සේවය කරති. ගෞතම බුදුන් වහන්සේ මෙවැනි දේ වැරදි දිවි පැවැත්මක් ලෙසින් බැහැර කළහ." (දී.නි I,9-12)*

## ප්‍රශ්නය - එසේ නම් මිනිසුන් සමහර අවස්ථාවන්හිදී එවැනි දේවල් ගැන විශ්වාසය තබන්නේ ඇයි?

**පිළිතුර** - ඊට ඇති ප්‍රධාන හේතූන් නම් ආශාව, භය සහ අවිද්‍යාවයි. යමෙකුට බුදුන් වහන්සේගේ ඉගැන්වීම අවබෝධ වුණු වහාම මෙවැනි ජීවන් කළ තුණ්ඩු කෑලි, ලෝහ කැබැලිවලට වඩා තමා රක්නා ශීලයම තමාව ආරක්ෂා කරන බව වටහා ගනු ඇත. බුදු දහමට අනුව අවංකකම, කරුණාව, අවබෝධය, ඉවසීම, සමාවදීම, පරිත්‍යාගය, නීතිගරුක භාවය සහ එවනි හොඳ ගුණාංග සත්‍ය ලෙසින්ම ඔබව ආරක්ෂාකර ඔබට නියම සෞභාග්‍යය ළගා කරනු ඇත.

## ප්‍රශ්නය - නමුත් සමහර විට එවැනි මන්ත්‍ර ගුරුකම්වලින් ප්‍රයෝජනයක් අත්වෙනවා නේද?

**පිළිතුර** - මෙවැනි දෙවල් ජීවිකාව වශයෙන් කරගෙන යන පුද්ගලයෙකු මම දනිමි. ඔහුගේ මන්ත්‍ර ගුරුකම් මගින් වාසනාවත්, සෞභාග්‍යයත් උදාවෙන බවටත්, ලොතරැයි ටිකට් පතක අංක තුනක් නිවැරදිව කියන බවටත් ඔහු සහතික වෙයි. එය එසේ නම් ඔහු තවමත් කෝටිපතියෙක් නොවූයේ ඇයි? ඔහුගේ එකම වාසනාව නම් එම දේවල් මිළට ගන්නා මෝඩ මිනිසුන් සිටීමම පමණෙකි.

## ප්‍රශ්නය - ඉරණමට බලපාන කිසිවක් නැත්ද?

**පිළිතුර** - ශබ්ද කෝෂයට අනුව ඉරණම යනු මෙයයි. එනම් කෙනෙකුට සිදුවන හොඳ හෝ නරක ඕනෑම දෙයක් සිදුවන්නේ අහම්බෙන් නිසා හෝ දෛවය නිසා හෝ වාසනාව නිසා හෝ බවට ඇති බලවත් විශ්වාසයයි. බුදුන් වහන්සේ මෙම මතය

තරයේම ප්‍රතික්ෂේප කළහ. ඕනෑම දෙයක් සිදුවීමට හේතු එකක් හෝ වැඩි ගණනක් ඇති අතර එම හේතූන්ගේ සහ ඒවා නිසා ඇතිවන ප්‍රතිඵල අතර සම්බන්ධයක් පවතී. උදාහරණයක් වශයෙන් රෝගී වීමට අදාළ හේතූන් ඇත. කෙනෙකුගේ ශරීරය හා විෂබීජ ගැටී ඒවාට ක්‍රියාකාරී වීමට තරම් ශරීරය දුර්වල වූ විට රෝග ඇතිවේ. එබැවින් හේතුව වන විෂ බීජ සහ ප්‍රතිඵලය වන දුර්වල රෝගී ශරීරය අතර පැහැදිලි සබඳතාවක් ඇත. විෂබීජ ශරීරයේ නොයෙක් තැන්වලට පහර දී රෝග ඇති කරයි. නමුත් මන්ත්‍රයක් ලියූ කඩදාසි කැබැල්ලක් පැළඳීමෙන් පොහොසත් බවට පත්වීම හෝ විභාග සමත් වීම අතර කිසිදු සබඳතාවක් නොමැතිය. සැම දෙයක්ම හේතු එකක් හෝ බොහෝ ගණනක ප්‍රතිඵල මත සිදුවනවා හැර ඉබේ හෝ ඉරණම හෝ දෛවය මත සිදු නොවන බවට බුදු දහම අපට උගන්වයි. ඉරණම ගැන මනා සැලකිල්ලක් දක්වන හැමෝම එමගින් යමක් බලාපොරොත්තු වෙති. එනම් මුදල් සහ ධනය වැනි දේයි. බුදුන් වහන්සේ සඳහන් කළේ ඊට වඩා තම සිත දියුණු කර ගැනීමේ වැදගත්කමයි. බුදුන් වහන්සේ මෙසේ කීහ.

*"බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවද, ශිල්ප දැනීමද, මැනවින් හික්මුණු බවද, යහපත් වචන ඇති බවද උතුම් මඟුල්ය."*

*"මා පියන්ට උපස්ථාන කිරීමද, අඹු දරුවන්ට සංග්‍රහ කිරීමද, නිරවුල් කර්මාන්තයක යෙදීමද උතුම් මඟුල්ය."*

*"ත්‍යාගශීලි බව, යහපත් හැසිරීම, නෑයන්ට සංග්‍රහ කිරීම, නිරවුල් කටයුතුද උතුම් මගුල්ය."*

*"පවෙහි නොගැළීම, පවෙන් වෙන් වීම, මත් පැනින් වෙන් වීම, කුසල් කිරීමෙහි ප්‍රමාද නොවීම උතුම් මඟුල්ය."*

*"ගෞරවයද, යහපත් පැවතුම් ඇති බවද, ලද දෙයින් සතුටු බවද, කළගුණ සැලකීමද, සද්ධර්මය ඇසීමට ලැබීමද උතුම් මංගල්ලයන්ය." (සු.නි. 261-6)*

# 10. භික්ෂු භික්ෂුණී දෙපිරිස

## ප්‍රශ්නය - පැවිද්ද බුද්ධාගමේ වැදගත් අංශයක්. භික්ෂු භික්ෂුණී දෙපක්ෂයේ අරමුණ කුමක් ද? ඔවුන් ඉටු කරන සේවය කුමක් ද?

**පිළිතුර** - භික්ෂු භික්ෂුණී පිරිසක් ඇති කිරීමෙන් බුදුන් වහන්සේ අදහස් කළේ ආධ්‍යාත්මික වර්ධනය පහසු වන වාතාවරණයක් ඇති කර ලීමට යි. ගිහියන් උන්වහන්සේලාට අවශ්‍ය දේ, එනම් ආහාර පාන, වාසස්ථාන. ඖෂධ යන මේවා සපයා දෙනවා එයින් තමන්ගේ කාලය අධ්‍යයනයටත් ආධ්‍යාත්මික වර්ධනයටත් යොදවන්නට ඔවුන්ට පහසුවක් ලැබෙනවා. පැවිදි දිවියේ ඇති සංවිධානාත්මක සරල පැවතුම අභ්‍යන්තර සාමයටත් භාවනාවටත් හිතකරයි. තමන්ට ලැබෙන සත්කාරවලට ප්‍රතිචාර වශයෙන් පැවිද්දන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ ඔවුන් දන්නා දේ ගිහියන්ට බෙදා දීමත්, යහපත් බෞද්ධ ජීවිතයක් ගත කිරීම පිළිබඳ ආදර්ශයක් දීමත් ය. බුදුන් විසින් අනුමත කරන ලද මේ මූලික කාර්ය භාරය දැන් බොහෝ දුරට වෙනස් වී ඇත. දැන් භික්ෂුහු සහ භික්ෂුණීහු පාසල් ගුරුවරුන් හැටියටත්, සමාජ සේවකයන්, කලාකරුවන්, වෛද්‍යවරුන් සහ දේශපාලකයන් වශයෙනුත් ක්‍රියා කරන්නෝය. එබඳු කටයුතුවල නියැළීම හිතකර බවටත් එමගින් බුදු දහම වැඩිදියුණු කිරීමටත් රුකුලක් ලැබෙන බවට සමහරු තර්ක කරති. තවත් අය කියන්නේ ඒ නිසා භික්ෂු භික්ෂුණී පිරිස තමන් පැවිදි වූ අරමුණ අමතක කර ගිහියන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වන බව ය.

## ප්‍රශ්නය - භික්ෂුවක් හෝ භික්ෂුණියක් වන්නේ කොයි විදියේ පුද්ගලයෝ ද?

**පිළිතුර** - බොහෝ දෙනාට කාම දිවියේ අවශතා ගණනාවක් ඇත. පවුල, වෘත්තිය, විනෝදාංශ, දේශපාලනය, ආගම වැනි දේ. මේ අතරින් පවුල නැත්නම් වෘත්තිය වාගේ එකක් මුල් තැනට එන්නට පුළුවන්. අනෙක් ඒවාට අඩු වැදගැම්මක් ලැබෙනවා ඇති. බුදු දහම ඉගෙනීමත් පුරුදු පුහුණු කිරීමටත් පූර්වතාව දෙන විට එසේ කරන්නා භික්ෂුවක් හෝ භික්ෂුණියක වීමට අදහස් කළ හැකියි.

## ප්‍රශ්නය - නිවන් අවබෝධ කර ගැනීමට භික්ෂුවක් හෝ භික්ෂුණියක් වීම අවශ්‍ය ම ද?

**පිළිතුර** - අවශ්‍ය නැත. බුදුන්ගේ ප්‍රධාන අනුගාමිකයන් අතර ගිහි ගැහැනු පිරිමි දෙපක්ෂය ම සිටියහ. සමහරුන් පැවිදි දිවිය වඩා හිතකර ලෙසින් සලකන අතර

තවත් කෙනෙක් ගිහි දිවිය වඩා සුදුසු යයි සිතති.

## ප්‍රශ්නය - භික්ෂූන් හා භික්ෂුණීන් කහ සිවුරු පොරොවන්නේ ඇයි?

**පිළිතුර** - පැරණි ඉන්දියානුවන් වනය දෙස නෙත් යොමු කළ විට හැම විට ම දුටුවේ හැළෙන්නට ආසන්න කොළ ය. ඒවා කහ පාටින් හෝ දුඹුරු නැත හොත් දම්පාටින් දක්නට තිබිණ. ඒ නිසා ඉන්දියාවේ ගිහි ගෙය හැර යාමේ ලක්ෂණයක් වශයෙන් කහ පාට සලකන්නට පටන් ගැනිණ. ඒ වර්ණය ඔවුන් යමකට ඇලී නොසිටීම නොහොත් අත් හැරීම සංකේත කරන්නක් බවට පත් විය.

## ප්‍රශ්නය - භික්ෂූන් හා භික්ෂුණීන් හිස මුඩු කිරීමේ වැදගත්කම කුමක් ද?

**පිළිතුර** - සාමාන්‍යයෙන් අපි අපේ පෙනුම ගැන බොහොම සැලකිලිමත් වෙමු. විශේෂයෙන් අපේ කෙස් කළඹ ගැන.  ගැහැනු කේශ කලාපය ගැන විශේෂ අවධානයක් යොමු කරන්නෝය. පිරිමි තට්ටය පෑදීම ගැන කැමැත්තක් නො දක්වති. හිස මුඩු කිරීමෙන් පෙන්වනු ලබන්නේ අවශ්‍යයෙන් ම සිත යොමු කළ යුතු දේ කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම ය. එනම් බාහිර පෙනුමට වඩා අභ්‍යන්තර වෙනස් වීම හා වර්ධනය කෙරෙහි යොමු වීම ය.

## ප්‍රශ්නය - පැවිදි වීම හොඳ බව පිළිගත හැකිය. එහෙත් සියලු දෙනා ම පැවිදි වුව හොත් සිදු වන්නේ කුමක් ද?

**පිළිතුර** - ඔය ප්‍රශ්නය ම කවර වෘත්තියක් ගැන වුවත් ඇසිය හැකිය. දන්ත වෛද්‍යවරයකු, ගුරුවරයකු, හෝ අන් කවර හෝ වෘත්තියක් සම්බන්ධයෙන් මේ ප්‍රශ්නය නැගිය හැකිය. බුදුන් වහන්සේ හැම කෙනකු ම මහණ විය යුතු යයි දේශනා කළේ නැත. මහණ දම් පුරන්නට යොමු වන්නේ ඒ පිළිබඳ නැඹුරුවක් සහිත සීමිත පිරිසක් බව කිව යුතුය. එබන්දන්ටත් අනෙක් වෘත්තිකයන්ට මෙන් සිය කාර්යය මගින් සමාජයට සේවයක් කිරීමට සුදුසු දක්ෂතා තිබිය හැකිය.

## ප්‍රශ්නය - ගුරුවරුන් වෛද්‍යවරුන් බඳු අය ගැන එය සැබෑ විය හැකිය. එහෙත් භාවනාව හැර අන් කිසිවක් නොකරන භික්ෂු භික්ෂුණීන් ගැන කියන්නේ කුමක් ද? ඔවුන්ගෙන් සමාජයට සිදු වන සේවය කුමක් ද?

**පිළිතුර** - භාවනාව සංසන්දනය කරන්න පුළුවන් පර්යේෂණ කාර්යයට. පරීක්ෂණාගාරයට වී පර්යේෂණයේ නිරත වන පර්යේෂකයාට සමාජය අනුග්‍රහය

දක්වයි. එසේ කරන්නේ ඔවුන් කරන පර්යේෂණවල ප්‍රතිඵල වශයෙන් සොයා ගන්නා දේ සමාජයේ යහපත සඳහා ඉවහල් වන බවට පිළිගැනීමක් ඇති නිසා යි. එබඳු ප්‍රතිඵල නැතත් භාවනා කරන පැවිද්දාගෙන් ඉටු වන මෙහෙවරක් ඇත. අද සමාජයේ විවිධ පුද්ගලයෝ අතිසුඛෝපභෝගී ජීවිතවලට පුරුදු වී ඒ ජීවිත අනෙක් අයට ආදර්ශයක් හැටියට පෙන්වන්නට උත්සාහ කරති. මේ හානිකර තත්ත්වය මග හැර ගත යුතුයි. අන්න ඒ කාර්යය සඳහා ආදර්ශයෙන් ම වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට භාවනාවේ යෙදෙන පැවිද්දාට පුළුවන්. එය පිටතට නොපෙනුණත් හෙමිහිට සමාජයට සේන්දු වන බල පෑමක් තිබිය හැකියි.

## ප්‍රශ්නය - මා අසා ඇත්තේ දැන් බෞද්ධ භික්ෂුණීන් නැති බවයි. ඒ ඇත්ත ද?

**පිළිතුර** - භික්ෂුණී ශාසනය බුදුන් වහන්සේ විසින් ම පිහිටුවන ලද්දක්. අවුරුදු පන්සියයක් පමණ කාලයක් පුරා භික්ෂුණීන් විසින් වටිනා මෙහෙවරක් බුදු දහම පැතිරවීම සඳහා ඉටු කරන ලදී. කෙසේ හෝ භික්ෂූන්ට තරම් පිළිගැනීමක් වත් අනුග්‍රහයක් වත් භික්ෂුණීන්ට ලැබුණේ නැත. එසේ වීමට හේතු පැහැදිලි වශයෙන් දැක්විය නො හැකිය. ටිබෙටය, ජපානය, බඳු මහායාන රටවල භික්ෂුණී ශාසනය දිගට ම පවැතුණත් ථෙරවාදී රටවල එය බිඳ වැටුණේය. මෑතක කොරියාවේ භික්ෂූන්ගේ සහාය ලබා ගෙන ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය යළි පිහිටුවා ඇත.

# 11. බෞද්ධ ධර්ම ග්‍රන්ථ

**ප්‍රශ්නය - සියලුම ආගම්වල බයිබලය නොහොත් ශුද්ධ වූ ග්‍රන්ථය වශයෙන් ගත හැකි පොතක් ඇත. බුද්ධාගමට ඇත්තේ කුමක් ද?**

**පිළිතුර** - බෞද්ධයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය හඳුන්වනු ලබන්නේ ත්‍රිපිටකය නමින් ය. එය ලියා ඇත්තේ පාලි නමින් හැඳින්වෙන පැරණි ඉන්දියානු භාෂාවකිනි. එය බුදුන් භාවිත කළ භාෂාවට සමාන වූවකි. ත්‍රිපිටකය අතිවිශාල ග්‍රන්ථයකි. එහි ඉංග්‍රීසි පරිවර්තනය කාණ්ඩ හතළිහකින් පමණ යුක්තය.

**ප්‍රශ්නය - ත්‍රිපිටකය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?**

**පිළිතුර** - එය පාලි වචනයකි. ත්‍රි යනු තුන ය. පිටකය යන්නෙන් අදහස් වනුයේ පෙට්ටිය නොහොත් කූඩය යන්නය. බුදු වදන කොටස් තුනකින් සමන්විත බව ත්‍රි යන්නේන් කියැවෙයි. පිටක සූත්‍රය නම් වූ පළමු පිටකයට ඇතුළත් වන්නේ බුදුන්ගේ දේශනා සහ ප්‍රධාන අර්හත් ශ්‍රාවකයන්ගේ දේශනාය. මේ සූත්‍ර දේශනා විවිධාකාර ය. විවිධ පුද්ගලයන්ට උපදෙස් දීමට දේශනා කරන ලද මේවායින් සමහරක් දේශනා විලාසයෙන් ද සමහරක් දෙබස් නොහොත් සංවාද ලෙසින් ද පවත්වා ඇත. ධම්මපදය බඳු කොටස්වල ඇත්තේ ගාථා ය. ජාතක කතාවල එන්නේ රසවත් කතන්දරය. බොහෝ කතන්දර සතුන් ගැන ය.

විනය පිටකය නමින් හැඳින්වෙන කොටසට අයත් වනුයේ භික්ෂූන්ටත් භික්ෂුණීන්ටත් පිළිපැදිය යුතු නීති රීති ය. ඔවුන් විසින් පවත්වනු ලබන චාරිත්‍ර විධි සහ ශාසනයේ පැරණි තත්ත්වය ද එමගින් ඉදිරිපත් කැරෙයි. තුන් වැනි කොටස වන අභිධර්මයෙන් දැක්වෙනුයේ පුද්ගලයා පිළිබඳ සියුම් විග්‍රහයකි. එහෙත් එහි එන කිසිවකින් අනෙක් පිටකයන්හි ඇති අදහස් නිෂේධනය වන්නේ නැත.

මෙහි එන පිටකය යන පදකය ගැන කිව යුතු කරුණක් ඇත. පුරාණ ඉන්දියාවේ ගොඩනැගිලිවල වැඩ කරන්නෝ ගොඩනැගිලි ද්‍රව්‍ය අතිනත යැවීම සඳහා භාවිත කළ ක්‍රමය වූයේ ඒවා කූඩවල දමා එකිනෙකාට දීම ය. බුදු වදනත් රැක ගෙන ඉදිරියට ගෙන යාමේ කාර්ය භාරය එකිනෙකාට පැවරීම කරන ලද්දේ කට වචනයෙනි. එය පාඩම් කර ගත් භික්ෂූන් විසින් ඊ ළඟ පරපුරට බාර දීමේ පිළිවෙතක් පැවතිණි. අකුරු ලිවීම බුදුන්ගේ කාලයේ තිබුණත් මෙසේ දේශනාව රැකගැනීම වඩා විශ්වාසදායක ලෙසින් සලකන ලදී. තිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ ක්‍රි. පූ. 100 පමණ ශ්‍රී ලංකාවේ දී ය.

**ප්‍රශ්නය - බුදුන් දෙසූ දහම ඒ තරම් කාලයක් කට වචනයෙන් පවත්වා ගෙන ආවා නම් එය පිළිගත හැකි තත්ත්වයක තිබිය නොහැකිය. කොතරම් වෙනස්කම් සිදු වන්නට අද්ද? කෙතෙක් දුරට මුල් අදහස් නැති වී යන්නට ඇද්ද?**

**පිළිතුර** - බුදු වදන රැක ගැනීම භික්ෂු සමාජයේ පොදු වගකීමක් ලෙසින් සලකන ලදී. භික්ෂූන් වහන්සේලා වරින් වර එකතු වී ඒ දහම් සජ්ඣායනා කිරීමට ද පුරුදු ව සිටියහ. එක් එක් ධර්ම කොටස රැකීමේ වගකීම එක් එක් කණ්ඩායමට පැවරීමෙන් එක් එක් කොටස පිළිබඳ විශේෂ හැකියාවක් හා ළැදියාවක් ඒ ඒ භික්ෂු පිරිසට ඇති වීම ද මෙසේ ධර්මය නොවෙනස් ව ආරක්ෂා කර ගැනීමට රුකුලක් විය. කට පාඩම් කිරීම භික්ෂූන් විසින් දීර්ඝ කාලයක් තිස්සේ පුරුදු කරන ලද්දක් බව කිව යුතු ය. ධර්ම කොටස් බොහෝ ගණනක් කට පාඩමෙන් කිව හැකි භික්ෂූන් අද පවා දක්නට ඇත. හොඳ ම නිදසුන බුරුමයේ මෙන්ගොන් සයදෙව් නම් භික්ෂූන් වහන්සේ ය. ත්‍රිපිටකය සම්පූර්ණයෙන් කට පාඩමෙන් කිව හැකි නිසා උන් වහන්සේ ගිනස් වාර්තා පොතටත් ඇතුළත් ව ඇත.

**ප්‍රශ්නය - ඔබ පාලි ගැන සඳහන් කළා. ඒ කුමක් ද?**

**පිළිතුර** - මුල් ම බෞද්ධ දේශනා ආරක්ෂා කරන ලද්දේ පාලි භාෂාවෙනි. බුදුන් වහන්සේ දේශනා කළ භාෂාව ගැන හරියට ම කීම අපහසු ය. එය පාලි වන්නටත් ඉඩ ඇත. පාලි නොවේ නම් ඊට සමාන භාෂාවක් විය යුතුය. උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක සංචාරය කරමින් ධර්ම දේශනා කළ බුදුන් වහන්සේ භාෂා ගණනාවකින් ඒ දේශනා කරන්නටත් ඇත.

**ප්‍රශ්නය - බෞද්ධ ග්‍රන්ථ බෞද්ධයන්ට කොතරම් වටින්නේ ද?**

**පිළිතුර** - මේ පොත්වල එන හැම දෙයක් ම දේව භාෂිතයක් විදියට පිළිගත යුතු යයි බෞද්ධයෝ විශ්වාස නො කරති. ඒවා සලකනු ලබන්නේ තමන්ගේ ශාස්තෘවරයා විසින් දේශනා කරන ලද ධර්මයේ වාර්තාවක් හැටියට ය. ඒවා හොඳින් කියවා වටහා ගත යුතු අතර ඒ ගැන විමසා බැලීමේ අයිතිය ද බෞද්ධයන්ට ඇත. අප විසින් කළ යුත්තේ ඒ කියවා වටහා ගැනීම ය. අපගේ අත්දැකීම් අනුව එහි සත්‍යාසත්‍යතාව පිළිගැනීම ය. අවබෝධයක් සහිත බෞද්ධයකු ධර්මය කෙරෙහි දක්වන ආකල්පය විද්‍යාඥයකු පර්යේෂණ ප්‍රතිඵල කෙරෙහි දක්වන ආකල්පයට සමාන වූවකැයි කිව හැකිය.

## ප්‍රශ්නය - ඔබ කලින් ධම්මපදය ගැන සඳහන් කළා. ඒ කුමක් ද?

**පිළිතුර** - එය ත්‍රිපිටකයේ එන ඉතා කුඩා කොටසක්. එය සත්‍යයේ මාර්ගය නැත්නම් සත්‍යයේ ගීත යනුවෙනුත් හඳුන්වන්නට පුළුවනි. එයට ගාථා 423 ක් ඇතුළත් වෙයි. සමහරක් බොහොම අරුත්බරයි. ගැඹුරු දහම් පද සහ සිත් ගන්නා උපමා සහිත අදහස් බහුල ව ඇත. බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද දහම් කොටස් සහිත ධම්මපදය ඉතා ම ජනප්‍රිය පුස්තකය වශයෙන් ගත හැකිය. එය ලෝකයේ ප්‍රධාන භාෂා ගණනාවකට පරිවර්තනය කරනු ලැබ ඇත.

## ප්‍රශ්නය - ත්‍රිපිටකයේ එන තවත් ජනප්‍රිය පොතකි ජාතක පොත් වහන්සේ. මෙම පොතට බෝධිසත්වයන් වහන්සේ සමහර පෙර භව වළ අලියෙක්,අශ්වයෙක්,කුරුල්ලෙක් සහ වෘක්ෂ දේවතාවෙක් ලෙස උපත ලබා ඇත. මෙය ඇත්තටම සිදුවිය හැකි ද ?

**පිළිතුර** - සමහර ජාතක කථා සත්‍ය වන අතර බොහෝ ඒවා උපමා කථා වේ. පැරණි භික්ෂුව ජනප්‍රිය ජන කථා ගෙන ඒ සෑම කථාවකම ප්‍රධාන චරිතය බෝධි සත්වයන් ලෙස දැක්වූහ. මෙම කථා භාවිතා කරමින් වටිනා බෞද්ධ සාර ධර්ම,ධෛර්ය, අවංකභාවය, ඉවසීම, පරිත්‍යාගශීලී බව දෙමාපියන්ට සැලකීම හා ආදරය දැක්වීම ආදී වටිනාකම් ගෙන හැර දැක්වූහ. සමහර විට මිනිසුන් දීර්ඝ ධර්ම දේශනාවකට සවන් දෙනවාට වඩා හොඳ කථාවකට සවන්දීමට අවධානය යොමු කළ හැකිය. ජාතක කථා වල බොහෝ රසවත් වර්ණවත් හා රිද්මය දනවන කථා වලින් පිරී ඇත. ශතවර්ෂ ගණනාවක් ජාතක කථා සාමාන්‍ය සරලව ජීවත් වන ජනයාට හා ළමයින්ට ධර්මය බෙදා දුන් අතර උගත් ජනයා ද ඒවා අගය කළහ. ජාතක කථා උපමා කථා වූ පමණින් එයට මිනිසුන් ධර්මයට යොමු කළ නොහැකි යැයි අදහස් නොකෙරේ. 1945 දී සුප්‍රකට ගත් කතුවරයකු වූ ජෝර්ජ් ඕවල් සෝවියට් සමාජ වාදය විවේචනය කරමින් " සත්ව ගොවිපළ" උපමා කථාවක් ලියා ඇත. සත්තුවුවත් ඔවුන් එකිනෙකාට කථා කරමින් සැලසුම් කල බවත් සංවිධානය කළ බවත් ඒවා සත්තුන්ට සත්‍ය ලෙස කළ නොහැකි දෙය වුවත් එම පොත මඟින් මිනිසුන්ට සමාජ වාදයට සහයෝගය දැක්වීම පිළිබඳ නැවත සිතා බැලීමට එම උපමා කථා පොත හේතු පාදක වුණි. එමනිසා ජාතක කථා උපමා කථා වූ පමණින් මිනිසුන්ට යහපත් දෙය කිරීටම පෙළඹවීම එයින් ඉඩක් නැතැයි අදහස් නොකළ යුතුය.

## ප්‍රශ්නය් බෞද්ධ ග්‍රන්ථ බිම නොතබා උස් තැනක තැබිය යුතු බවයි, මා

**අසා ඇත්තේ. ඒ සැබෑවක් ද?**

**පිළිතුර** - මෑතක් වන තුරු මධ්‍ය කාලීන යුරෝපයේ වාගේ ම බෞද්ධ රටවලත් පොත පත තිබුණේ සීමිත සංඛ්‍යාවක්. ඒ නිසා ම ඒ වටිනා වස්තුවට බෙහෙවින් ගරු කරන ලදී. ඔබ සඳහන් කරන විදියේ සැලකිල්ලක් පොත්වලට ලැබුණේ ඒ නිසා යි. චාරිත්‍ර සම්ප්‍රදාය කෙසේ වුවත් බෞද්ධ ග්‍රන්ථවලට ගරු කිරීමේ හොඳ ම පිළිවෙළ ඒවා හදාරා ප්‍රායෝගික වශයෙන් ප්‍රයෝජන ගැනීම ය. පුරුදු පුහුණු කිරීම ය.

**ප්‍රශ්නය - බෞද්ධ දේශනා කියවීම දුෂ්කර කාර්යයක්. ඒවා බොහොම දිගයි. ඒකාකාරයි.**

**පිළිතුර** - ආගමික ග්‍රන්ථයක් කියවන විට අප බලාපොරොත්තු වන්නේ උත්කර්ෂයක් සහිත, අපේ උද්‍යෝගය නංවා ලන, ප්‍රීතිදායක දේවල්. එහෙත් බෞද්ධ දේශනාවල බොහෝ විට ඇත්තේ සවිස්තර තර්ක විතර්ක, අනුශාසනා, දාර්ශනික අදහස් ආදිය නිසා ඒවායේ ඇති සිත් ගන්නා කොටස්වලට වඩා එක් වර ම ආකර්ෂණය කර ගන්නා දේ අඩුයි. ඒවායේ ඇති අධ්‍යාත්මික පක්ෂය ගැන අවධානය යොමු කළ හොත් අගය වැටහෙනවා ඇති. ඉතාමත් සිත් අලවන දේශනා ඇතත් ඒ සීමිත වශයෙනි. බෞද්ධ ග්‍රන්ථවල වටිනාකම මනින්නට නම් ඒවා අනෙක් ආගම්වල පොත් සමග නොසසඳා සැලකිය යුතුය.

**ප්‍රශ්නය - බුද්ධ දේශනා මුලින් ම ලියා තැබුවේ තල් කොළවල බව කියැවෙයි. ඇයි එසේ කළේ?**

**පිළිතුර** - බුදුන් වැඩ සිටි අවදියේ ඉන්දියාවේ හෝ ශ්‍රී ලංකාවේ කඩදාසි නිෂ්පාදනය පටන් ගෙන තිබුණේ නැත.  කඩදාසි සොයා ගෙන තිබුණේ ද නැත. පනිවුඩ බඳු ලිපි ලේඛන ලිවීමට භාවිතා කරන ලද්දේ සතුන්ගේ සම්, ලී පොතු නැත් නම් ලෝහමය ද්‍රව්‍යයක්. සතුන්ගේ සම් භාවිතයට බුදු දහම ඇදහුවන් අකැමති වූ නිසා කොළ යොදා ගත්තේ ලෝහ පත්‍ර භාවිතය අධික වියදමක් යන දෙයක් වූ නිසා යි. තල් පත්වල ලියූ පසු ඒවා නූල්වලින් එකට බැඳ ලීයෙන් තැනූ කවර තුළ බහා ආරක්ෂිත ආකාරයට තබා ගත හැකි විය. බුදු දහම චීනයට ගෙන ගිය පසු එහි සිල්ක් රෙදිවල ධර්මය ලියා තබන ලදී. ලෝකයේ පළමු මුද්‍රිත පොත වනුයේ බුද්ධ දේශනාවක චීන පරිවර්තනයකි. එය මුද්‍රණය කරන ලද්දේ ක්‍රි. ව. 828 දී ය.

**ප්‍රශ්නය - මංගල සූත්‍රය හෝ කරණීය මෙත්ත සූත්‍රය වැනි සූත්‍ර සජ්ඣායනා කිරීම තුළින් ලෙඩ වූ විට ලෙඩ සුව කර ගැනීමටත් දුක්**

**කරදර විනාශයන් වලක්වා ගැනීමටත් හැකියැයි මම අහලා තියෙනවා. මෙය සත්‍යයක් ද ?**

**පිළිතුර** - සූත්‍ර දේශනාවන් දේශනා කරන විට ලෙඩ වූ අය සුව විමටත් මිනිසුන්ට ධෛර්ය ලබා දීමටත් අධිෂ්ඨානය හා ආත්ම විශ්වාසය තුළින් ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න වලට මුහුණ දීමට හැකියාව ලබා දෙන බවට සාක්ෂි ප්‍රමාණයක් ලැබී ඇත. බොඣඡංග සූත්‍ර දේශනාවන් ශ්‍රවණය කිරීමෙන් බුදු රජාණන් වහන්සේ හා ශ්‍රාවකයන් ලෙඩ වූ විට සුවපත් වූ බව සූත්‍ර දේශනා වල දැක්වේ. පිරිත් සූත්‍ර දේශනා කිරීමේ බලය කිහිප ආකාරයකින් ඇතිවේ. ශබ්දය තුළ ශක්තිය ගැබ් වී ඇත. සත්‍ය මත පදනම් වී ඇති පිරිත් බිහිවී ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ නිකෙලෙස් හදවත තුළයි. එම නිසා එය තුළ සත්‍ය ගැබ් වී ඇති අතර සත්‍ය තුළ ද ශක්තිය ඇත. එමෙන්ම පිරිතේ ශක්තිය පරිත් දේශනාක කරන්නාගේ සිතේ මෛත්‍රිය පෙරටුකරගෙන පිරිත් දේශනා කිරීම තුළිනුත් ශ්‍රවණය කරන්නාගේ සද්ධා සහිත සිතේ යන උභය ශක්තිය එකතුවීමෙන් ගොඩ නැගේ. එයින් ඔබට ධනාත්මක බලපෑමක් ලබා ගත හැකිය. ඔබ මංගල හා මෙත්ත සූත්‍ර වල අර්ථය දන්නේ නම් එනම් මෛත්‍රිය හා ශීලයේ ප්‍රතිඵල ඔබගේ සිත තුළ තැම්පත් කිරීමට හේතු වන අතර එය ඔබ තුළ යහපත් මානසිකත්වයක් ඇති කිරීමට හේතු වේ.

විද්‍යාත්මක සාක්ෂි වලට අනුව යමක් විශ්වාස කිරීම ශරීරයට හා මනසට ධනාත්මක බලපෑමක් ඇති කරයි. විද්‍යාත්මක පරීක්ෂණ වල නිරත වන පරීක්ෂකයෝ රෝගීනීට සීනි අඩංගු කරල් ලබා දී ඒවා නින්ද යෑමට ලබා දෙන බෙහෙත් කරල් බව පැවසූ විට එයින් රෝගීන්ට නින්ද ලැබී ඇත. එමෙන්ම රෝගීන් හට වතුර අඩංගු එන්නත් ලබා දී ඒවා ඔවුන්ගේ වේදනාවන් අඩු කරන බලවත් එන්නත් බව පැවසූ විට ඒවාගෙන් ඔවුන්ගේ වේදනාවන් අඩු විය. " මනස සියල්ලටම මුල බවත් මනසේ සියල්ලේම ප්‍රධානියා බවත් මනස සියල්ලම මනසින් නිර්මිත බවත් ධමම පදයේ මුල්ම ගාථාවෙන් දේශනා කර ඇත. එම නිසා පිරිත් දේශනාවන් වල බලය ක්‍රියාත්මක වීමට මෙම සත්‍ය හේතු බලපා ඇත.

# 12. ඉතිහාසය සහ සංවර්ධනය

## ප්‍රශ්නය - විවිධ රටවල වෙසෙන විශාල පිරිසකගේ ආගම බවට නූතනයේ බුද්ධාගම පත්වී තිබෙනවා. මෙය සිදු වූයේ කෙසේද?

**පිළිතුර** - බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 150 ඇතුළත කාලයේ බුද්ධාගම උතුරු ඉන්දියාව පුරා බොහෝ සෙයින් පැතිරිණි. ඉන් පසු ක්‍රි.පූ. 262 දී පමණ, එවකට ඉන්දිය අධිරාජයා වූ අශෝක අධිරාජයා බුද්ධාගම වැළඳ ගැනීමෙන් පසුව, ඔහුගේ මුලු අධිරාජ්‍යය පුරාම බුද්ධාගම ප්‍රචලිත කළේය. බුද්ධාගමේ ඇති උසස්, සදාචාරාත්මක බවත්, විශේෂයෙන්ම හින්දු කුල භේදයට පිටු දැකීමත් බොහෝ පිරිසක් බුදු දහම වැළඳ ගැනීමට තවත් හේතූන් විය.

එසේම අශෝක අධිරාජයාගේ රාජ්‍ය අනුග්‍රහයෙන් පැවැත්වූ තුන්වන ධර්ම සංඝායනාවෙන් අනතුරුව අසල්වැසි රටවලට මෙන්ම ඈත යුරෝපයටද ධර්ම දූත සේවා පිටත්කර හැරියේය. ඒ අතරින් සාර්ථකම දූත මෙහෙය ශ්‍රී ලංකාවට යැවූ දූත මෙහෙයයි. එවක පටන් අද දක්වාම ශ්‍රී ලංකාව ලොව ප්‍රධානතම බෞද්ධ රටක් වේ. අනෙක් දූත මෙහෙයන් යැවූ රටවල් අතරට දකුණු බුරුමය හා තායිලන්ත අර්ධද්වීපය ඇතුළත් වේ.

ඉන් සියවසකට පමණ පසු ඇෆ්ගනිසථානය හා උතුරු ඉන්දියාවේ කඳුකර ප්‍රදේශවල බුදු දහම පැතැරිණි. එම ප්‍රදේශවල සිට භික්ෂූන්වහන්සේලා හා වෙළෙන්දන් මගින් ක්‍රම ක්‍රමයෙන් මධ්‍යම ආසායාවටත් ඉන් අනතුරුව චීනයටත් බුදු දහම පැතිර ගියේය. පසුව චීනයේ සිට කොරියාවට හා ජපානයට පැතිරිණි.

ශ්‍රී ලාංකික භික්ෂූන්ගේ පරිශ්‍රමයෙන්, 12 වන ශත වර්ෂයේ පමණ බුදු දහම බුරුමය, තායිලන්තය, ලාඕසය හා කාම්බෝජය ආදී රටවල ප්‍රධාන ආගම බවට පත්විය.

## ප්‍රශ්නය - ටිබෙටය බෞද්ධ රටක් වූයේ කෙසේද? කොයි වකවානුවේද?

**පිළිතුර** - ක්‍රි.ව. 8 වන ශත වර්ෂයේ පමණ, එවකට සිටි ටිබෙට් අධිරාජ්‍යයා ඉන්දියාවෙන් සංඝයා වහන්සේ හා ධර්ම ග්‍රන්ථ පිටපත් ටිබෙටයට රැගෙන ඒමට රාජ්‍ය දූතයෙක් යැවීය. එතැන් පටන් ටිබෙටයේ බුද්ධාගම පැවතුනමුත්, ප්‍රධාන වශයෙන්ම එවකට ප්‍රචලිතව පැවති දේශීය 'බොන්' ආගමික පූජකවරුන්ගේ විරෝධය නිසා ප්‍රධාන ආගම බවට පත්නොවිය.

පසුව ක්‍රි.ව. 11 වන ශතවර්ෂයේ පමණ ඉන්දියාවේ සිට සංඝයා වහන්සේ මෙන්ම ධර්මාචාර්ය්‍යවරුන් විශාල ප්‍රමාණයක් ටිබෙටයට පැමිණි අතර එහි ප්‍රතිඵලයක්

ලෙස බුද්ධාගම ටිබෙටයේ ශක්තිමත් ලෙස ස්ථාපිත විය. එතැන් පටන් අද දක්වාම ටිබෙටය ප්‍රධාන බෞද්ධ රටක්ය.

## ප්‍රශ්නය - එසේ නම් බුද්ධාගම ඉතා පුළුල් ලෙස ලොව පුරා පැතුරුණා නේද?

**පිළිතුර** - ඔව්. එපමණක් නොව, බුද්ධාගම විවිධ රටවලට පැතිරෙන විටදී ඒ නිසා ඒ රටවල එවකට පැවති ආගම් පීඩාවට පත්කිරීම හෝ යුධ ජයග්‍රහණ මඟින් බලයෙන් බුදු දහම පැතිරීම වැනි අවස්ථා තිබේ නම් ඒවා ඉතාම අල්පය. බුදු දහම සැමවිටම සාමකාමී පිළිවෙතක් අනුගමනය කරන අතර බලයෙන් හෝ පීඩාවෙන් අන්‍යයන් බුද්ධාගමට හරවා ගැනීම බෞද්ධයාගේ පිළිවෙත නොවේ.

## ප්‍රශ්නය - බුදු දහම පැතිරුණ රටවලට ඉන් සිදු වූයේ කුමන අන්දමේ බලපෑමක්ද?

**පිළිතුර** - විවිධ රටවලට ගිය ධර්ම දූත භික්ෂූන් වහන්සේ බෞද්ධ දර්ශනයට අමතරව, එවකට ඉන්දියාවේ පැවති උසස් ශිෂ්ටාචාරයේ අංගයන්ද ඒ රටවලට රැගෙන ගියේය. සමහර අවස්ථාවල වෛද්‍ය විද්‍යාව ප්‍රගුණ කර භික්ෂූන් වහන්සේලා එම රටවලට නව වෛද්‍ය ක්‍රම හඳුන්වා දෙනු ලැබීය.

ඉන්දියානු භික්ෂූන් වහන්සේලා පැමිණෙන තුරා ශ්‍රී ලංකාව, ටිබෙටය හා සමහර මධ්‍යම ආසියානු රටවල ලේඛන කලාවක් නොපැවතිනි. ලේඛනය ප්‍රචලිත වීමත් සමගම නව අදහස් හා නව දැනීම්ද ඇති විය.

බුද්ධාගම පිළිගැනීමට පෙර ටිබෙට් හා මොංගෝලියා වැසියන්ගේ පැවති නොහික්මුන හා රුදුරු ගති බුද්ධාගම වැළඳ ගැනීමෙන් පසුව මෘදු හා ශිෂ්ට සම්පන්න බවට පත්විය. එපමණක් නොව බුද්ධාගමේ ආරම්භයත් සමගම එවකට ඉන්දියාවේ ප්‍රචලිතව පැවති සත්ව බිලි පූජා අඩුවූ අතරම කුල භේදයද තාවකාලික වශයෙන් හෝ යටපත් විය. එසේම නූතනයේ බටහිර රටවල හා ඇමෙරිකාවේ බුද දහම ප්‍රචලිත වීමත් සමගම එයින් බටහිර මනෝ විද්‍යාවේ මිනිසාගේ මනසේ පැවැත්ම පිළිබඳව අදහස්වල විශාල බලපෑමක් සිදු වී ඇත.

## ප්‍රශ්නය - ඉන්දියාවේ බුදු දහම මැකී ගියේ කෙසේද?

**පිළිතුර** - මේ දක්වාම කවරෙකු හෝ විසින් මෙම අභාග්‍ය සම්පන්න සිදුවීමට පැහැදිලි පිළිතුරක් ලබා දී නැත. සමහර ඉතිහාසඥයන්ගේ මතය නම් පසු කාලීනව බුදු දහම දූෂිත වූ අතර එනිසා පොදු ජනයා එය ප්‍රතික්ෂේප කළ බවය. තවත් මතයක් නම් හින්දු ආගමෙන් වෙන් කොට සැලකීම අපහසු වූ බවයි. රාජ්‍ය අනුග්‍රහය ලැබූ ප්‍රධාන ආරාමවලට සංඝයා වහන්සේලා එක්රැස් වූ අතර එනිසා

ඔවුන් පොදු ජනයාගෙන් ඈත් වූ බවය. මේ කුමන හේතුවක් නිසා හෝ ක්‍රි.ව. 8 වන හා 9 ශත වර්ෂය පමණ වන විට බුදු දහම ඉන්දියාවේ දැඩි පරිහානියකට පත් වී සිටියේය. ක්‍රි.ව 13 වන ශත වර්ෂයේ සිදු වූ ඉස්ලාමීය ආක්‍රමණයෙන් ඇති වූ ප්‍රචණ්ඩකාරී හා අවුල් සහගත තත්ත්වයත් සමගම බුදු දහම ඉන්දියාවෙන් මැකී ගියේය.

## ප්‍රශ්නය - එසේ නමුත්, තවමත් ඉන්දියාවේ බෞද්ධයන් සිටිනවා නේද?

**පිළිතුර** - ඇත්ත වශයෙන්ම ඔව්. ක්‍රි. ව 20 වන ශත වර්ෂයේ මැද භාගයේ සිට නැවතත් ඉන්දියාවේ බුද්ධාගම වර්ධනය වීමට පටන්ගෙන තිබේ. ඉන්දියාවේ පවතින කුල භේදය නිසා හරිජනයන්ට සිදු වූ දරුණු අසාධාරණකම්වල ප්‍රතිඵලයක් ලෙස 1956 දී හරිජන නායකයා බුද්ධාගම වැලඳ ගත්තේය. එවක පටන් මිලියන 8 කට ආසන්න ප්‍රමාණයක් බුද්ධාගම වැලඳගත් අතර එම සංඛ්‍යාව තවත් ඉහළ යමින් පවතී.

## ප්‍රශ්නය - බුද්ධාගම මුලින්ම බටහිර ප්‍රචලිත වූයේ කුමන කාලයේද?

**පිළිතුර** - ක්‍රි.පූ 3 වන සියවසේ ඇලෙක්සැන්ඩර් අධිරාජයා ඉන්දියාව ආක්‍රමණය කිරීමෙන් පසුව ඉන්දියාවට සංක්‍රමණය වූ ග්‍රීක වැසියන් මුල්ම බටහිර බෞද්ධයන් ලෙස සැලකේ. ඉතා වැදගත් පුරාණ බෞද්ධ ග්‍රන්ථයක් වන "මිලින්ද ප්‍රශ්නය" නැමැති පොත ඉන්දියානු භික්ෂුවක වූ නාගසේන හිමි හා ඉන්දු-ග්‍රීක මිලින්ද රජු අතර සිදු වූ දෙබස්වලින් සමන්විත වේ. නමුත් නූතන බටහිර බෞද්ධ පිබිදීම 19 වන ශත වර්ෂයේ අග භාගයේ පමණ සිට විවිධ විද්වතුන් බෞද්ධ ත්‍රිපිටකය හා ලේඛන බටහිර භාෂාවන්ට පරිවර්ථනය කිරීමත් සමග ආරම්භ වූවකි. 20 වන ශත වර්ෂයේ මුලදී බටහිර ජාතිකයන් සුළු පිරිසක් ඔවුන් බෞද්ධයා ලෙස හඳුන්වාගත් අතර කිහිප දෙනෙකු භික්ෂු සාසනයටද ඇතුළු විය. 1960 දශකයේ පටන් බටහිර රටවල බෞද්ධයන් සැලකිය යුතු සුළු ප්‍රමාණයක් දක්නට ලැබේ.

## ප්‍රශ්නය - බුද්ධාගමේ ඇති විවිධ ස්වරූප ගැන ඔබට යමක් කිව හැකිද?

**පිළිතුර** - බුද්ධාගමේ ස්වර්ණම යුගයේදී එය මොංගෝලියාවේ සිට මාලදිවයින දක්වාද,(උතුරු ඇෆ්ගනිස්ථානයේ) බෝල්කන් සිට (ඉන්දුනීසියාවේ) බාලි දක්වාද පැතිර ගිය අතර විවිධ රටවල, විවිධ සංස්කෘතීන්වලට අයත් ජන කොට්ඨාශවලට ආකර්ශනීය හා ගැලපෙන අයුරින් හැඩ ගැසිනි. තවද ශත වර්ෂ ගණනාවක් ගතවෙද්දී වෙනස්වන සමාජීය හා බුද්ධිමය තත්ත්වය පිළිගැනීමටත් එසේම ඒ අනුව හැඩ ගැසීමටත් බුදු දහමට සිදු විය. මෙම කරුණුවල ප්‍රතිඵල වශයෙන් සාරය නොවෙනස්ව එලෙසම පැවතුණි. බුද්ධාගමේ බාහිර ස්වරූපය විශාල

වශයෙන් එකිනෙකට වෙනස් විය. නූතන බුද්ධාගම ථේරවාද, මහායාන හා වජ්‍රයාන වශයෙන් ප්‍රභේද තුනක් පවතී.

## ප්‍රශ්නය - ථේරවාදය යනු කුමක්ද?

**පිළිතුර -** ථේරවාද හෝ ස්ථවිරවාද යන්නෙහි අර්ථය 'වැඩිහිටියන්ගේ ඉගැන්වීම' ලෙස ගත හැකි අතර එය පාලි ත්‍රිපිටකයේ එන ධර්ම කරුණු පදනම් කරගත්තකි. පාලි ත්‍රිපිටකය පුරාණතම හා පරිපූර්ණම බෞද්ධ ඉගැන්වීම්වල එකතුව ලෙස සැලකේ. ධර්මයේ මූලික කරුණු අවධාරණය කරන, මධ්‍යස්ථ, භික්ෂූන් කේන්ද්‍රකරගත් ථේරවාදය සරල හා චාම් මගක් අනුගමනය කරයි.

## ප්‍රශ්නය - මහායාන බුද්ධාගම යනු කුමක්ද?

**පිළිතුර -** ක්‍රි.පූ 1 වන සියවසේදී පමණ, බුද්ධාගමේ එන සමහර ධර්ම කරුණු වැඩිදුරටත් ගැඹුරින් අධ්‍යයනය කිරීම ඇරඹින. එසේම සමාජයේ වර්ධනය වීමත් සමගම ධර්ම කරුණුවලට වඩාත් ප්‍රත්‍යගමනය වූ අර්ථ දැක්වීමේ අවශ්‍යතාවයද මතුවිය. මේ වර්ධනයත් සමගම බොහෝ ගුරු කුල සංඛාවක් බිහිවූ අතර එම නව විකාශන හා අර්ථකථන සාමූහිකව 'මහායාන' එනම් 'ප්‍රධාන මාර්ගය' ලෙස හැඳින්වීම ඇරඹිනි. එලෙස හැඳින්වීමට හේතුව එම දර්ශනයන් ගිහිගෙය හැර ගිය භික්ෂු, භික්ෂුණීන්ට පමණක් නොව හැමදෙනාටම උචිත නිසා යැයි අදහස් කෙරේ. කාලයත් සමගම මහායාන බුද්ධාගම ඉන්දියාවේ ප්‍රධාන බෞද්ධ දර්ශනය බවට පත්විය. නූතනයේ චීනය, කොරියාව, තායිවානය, වියට්නාමය හා ජපානය යන රටවල මහායාන බුද්ධාගම ප්‍රචලිතව පවතී. සමහර ථේරවාදීන් මහායාන යනු සද්ධර්මය විකෘති කිරීමක් ලෙස හඳුන්වයි. කෙසේ නමුත්, මහායානීන් කරුණු දක්වන අන්දමට බුදුන් වහන්සේ වෙනස් වීම මූලික සත්‍යයක් ලෙස පිළිගත් බවත්, ඔවුන්ගේ බුදු දහම පිළිබඳ අර්ථ කථනය ඕක් ගසේ ගෙඩිය සහ ඕක් ගස අතර ඇති වෙනස මෙන් බවත් පවසයි.

## ප්‍රශ්නය - බොහෝ අවස්ථාවල මා 'හීනයාන' යන වචනය දැක තිබේ. එහි අර්ථය කුමක්ද?

**පිළිතුර -** මහායාන දර්ශනය දියුණු වෙමින් පවතින වකවානුවේ එය මුල් බෞද්ධ දර්ශනයෙන් වෙන් කර දැක්වීමට එය 'මහායාන' එනම් 'උතුම් ක්‍රමය/මාර්ගය' ලෙසත්, මුල් බෞද්ධ දර්ශනය 'හිනයාන' එනම් 'සුලු/අල්ප ක්‍රමය/මාර්ගය' ලෙසත් හැඳින්වීමට පටන්ගත්තේය. එබැවින් 'හීනයාන' යනු 'ථේරවාදය' බුද්ධාගමට මහායානී අනුගාමිකයන් විසින් දුන් යම් ප්‍රමාණයකට පක්ෂග්‍රාහී නමක් ලෙස හැඳින්විය හැක.

## ප්‍රශ්නය - එසේ නම් 'වජ්‍රයාන' යනු කුමක්ද?

**පිළිතුර** - ක්‍රි.ව 6 වන හා 7 වන ශතවර්ෂවල ඇති වූ හින්දු දර්ශනයේ නව පුබුදුවත් සමගම මතු වූවක් ලෙස 'වජ්‍රයාන' දර්ශනය හැඳින්විය හැක. සමහර බෞද්ධයන් මෙම හින්දු ආභාසය, විශේෂයෙන්ම එහි දක්නට ලැබෙන දේව වන්දනාව හා විවිධ පූජා විධිවල ආභාසය ලැබීය. 11 වන ශත වර්ෂයේදී, ටිබෙටයේ ස්ථිර ලෙස ස්ථාපිත වීමෙන් පසු 'වජ්‍රයාන' දර්ශනය එහිදී තවදුරටත් වර්ධනය විය. වජ්‍රයාන යන වචනයේ අර්ථය 'වජ්‍ර'(දියමන්ති) ක්‍රමය/හෝ මාර්ගය වන අතර, එයින් වජ්‍රයාන අනුගාමිකයන් විසින් ඔවුන්ගේ සමහර අදහස්වල නිවැරදි බව ආරක්ෂා කිරීමට යොදා ගන්නා නොබිඳිය හැකි තර්කයන් වලින් කියවේ.

වජ්‍රයානීන් 'තන්ත්‍ර' නැමැති ශාස්ත්‍රීය කොටස් සාම්ප්‍රදායි බෞද්ධ ත්‍රිපිටකයට වඩා විශ්වාසට රඳවා ඇති අතර, එනිසාම එය 'තන්ත්‍රයාන' වශයෙන්ද හඳුන්වයි. නූතනයේ මොංගෝලියාව, ටිබෙටය, ලඩක්, නේපාලය, භූතානය හා ටිබෙට් ජාතිකයන් ජීවත් වෙන ඉන්දියාවේ ප්‍රදේශවල පැතිර පවතී.

## ප්‍රශ්නය - සමහර විට මෙය බොහෝ පැටලිලි සහිත විය හැක. මට බුද්ධාගම පිළිපැදීමට අවශ්‍ය නම්, මෙයින් කුමක් තෝරා ගන්නේ දැයි මා සිතාගන්නේ කෙසේද?

**පිළිතුර** - මෙය අපට ගංගාවකට උපමා කිරීමට හැකිය. ඔබ පළමුව ගංගාව පටන් ගන්නා ස්ථානයටත්, ඉන්පසුව ගංගා මෝයටත් ගියේ නම් එම ස්ථාන දෙකෙහි විශාල වෙනසක් පෙනේවි. නමුත් ඔබ ගංගා ආරම්භවන ස්ථානයේ සිට ගංගාවත් සමගම කඳු ශිකර හරහා, දිය ඇලි උඩින්, ගංගාවට මගදී එකතුවන අතු ගංගාවල් පසු කරමින් අවසානයේ ගංගාවේ මුල සහ මෝය අසල විශාල වෙනසක් ඇත්තේ මන්දැයි අවබෝධ වේවි.

ඔබට බුද්ධාගම ඉගෙන ගැනීමට අවශ්‍ය නම්, බුද්ධාගමේ මූලික ඉගැන්වීම් එනම් චතුරාර්ය්‍ය සත්‍යය, ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගය, බුද්ධ චරිතය ආදියෙන් පටන් ගන්න. ඉන් අනතුරුව ධර්ම කරුණු හා අදහස්වල විකාශයත්, අනතුරුව ඔබට වඩාත් සුදුසු යැයි හැගෙන ප්‍රභේදයට අවධානය යොමු කරන්න. එවිට ගංගාවේ අරම්භය ගංගාවේ මෝයට වඩා හීන බව හෝ ගංගා මෝය එහි ආරම්භයේ විකෘති කිරීමක් ලෙසත් පැවසීමට නුපුලුවන් වේ.

# 13. බෞද්ධයෙකු බවට පත්වීම

## ප්‍රශ්නය - ඔබ මෙතෙක් කී දේ බොහෝ රසවත් බව සැබෑය. ඉතිං මා බෞද්ධයෙකු බවට පත් වන්නේ කෙසේද?

**පිළිතුර** - උපාලි පිරිවැජියා බුදුන් වහන්සේ කරා පැමිණියේ උන් වහන්සේව වාදයෙන් පරදා තම මතයට හරවා ගන්නා අදිටනින්ය. නමුත් දෙදෙනා අතර සිදුවූ වාදයේ ප්‍රතිඵලය වූයේ උපාලි පිරිවැජියා බුදුන් වහන්සේ සරණ යාමය. නමුත් බුදුන් වහන්සේ ඔහුට කියා සිටියේ මෙයයි.

*"පළමුව ඔබ හොඳින් විමසා බලන්න. ඔබ වැනි වැදගත් පුද්ගලයෙකුට විමසා බැලීම ඉතා අවශ්‍යය." (ම.නි II, 379)*

*"බුදුන් වහන්සේ පළමුව හොඳින් විමසා බලන්න යයි කී බැවින් දැන් පෙරටත් වඩා ඔබවහන්සේ ගැන පැහැදීමට පත් වුනෙමි. අනෙක් ලබ්ධිකයන් මම ඔවුන්ගේ ආගමට බැඳුනා යයි කියමින් නගරය පුරා ඇවිද ගියත්, ඔබ වහන්සේ කියා සිටියේ මා වැනි පුද්ගලයෙකුට හොඳින් විමසා බැලීමේ ඇති වැදගත්කමයි."*

බුදු දහමෙදී වැදගත් වනුයේ අවබෝධය වන අතර ඒ සඳහා කාලයක් ගතවේ. එබැවින් හිටි ගමන් බුදු සමය වැළඳ ගැනීම සුදුසු නොවේ. ඔබ ඔබේ කාලය ගෙන ප්‍රශ්න කරමින්, හොඳින් විමසා බැලීමෙන් අනතුරුව ඔබේ තීරණයට එළඹෙන්න. බුදුන් වහන්සේට තම අනුගාමිකයන් සංඛ්‍යාත්මකව වැඩි කර ගැනීමට අවශ්‍ය නොවීය. උන්වහන්සේ වඩාත් සැලකිල්ලක් දැක්වූයේ හොඳින් කරුණු විමසා බලා උන්වහන්සේගේ ධර්මය පිළිපදින සමාජයක් ඇති කිරීමටයි.

## ප්‍රශ්නය - කියන ලද ආකාරයට මා විසින් කටයුතු කරන ලද්දේ නම් බෞද්ධයකු වීමට අදාළව මා විසින් වෙන කළ යුත්තේ කුමක්ද?

**පිළිතුර** - මේ සඳහා හොඳම ක්‍රමය නම් හොඳ පන්සලකට හෝ බෞද්ධ සමාජයකට බැඳී ඔවුන්ගෙන් උදව් ලබා ගැනීමෙන් සහ ඔවුන්ටත් උදව් දීමෙන් බුදුන් වහන්සේගේ ධර්මය ගැන තව දුරටත් හැදෑරීමයි. මෙසේ කිරීමෙන් ක්‍රමයෙන් ඔබට තෙරුවන් සරණ යාමට හැකිවනු ඇත.

## ප්‍රශ්නය - තෙරුවන් සරණ යනු කුමක්ද?

**පිළිතුර** - යමෙක් අභාග්‍ය සම්පන්න අවස්ථාවක සිටින විට හෝ ආරක්ෂාව අවශ්‍ය විටක කිසියම් සරණක් (පිහිටක්) අයදියි. පිහිට විය හැකි ක්‍රම බොහෝ ගණනකි. මිනිසුන් අසන්තෝසයෙන් සිටින විට තම මිතුරන්ගේ සරණ අයදියි. ඔවුන්ට කරදර සහ භය ඇතිවන විට මිථ්‍යා බලාපොරොත්තු සහ විශ්වාසයන්හි සරණ යති. නමුත්

බුදුන් වහන්සේට අනුව මෙම කිසිවක් සරණ නොවන්නේ ඒ කිසිවකින් නියම ආරක්ෂාවක් හෝ සහනයක් නොසපයන බැවිනි.

*"යමෙක් වනාහි බුදුන්ද, දහම්ද, සඟුන් ද සරණ ගියේ දුකත්, දුක් හේතුවත්, දුක් දුරු කිරීමට කරුණු වූ නිවනත්, දුක් ඉක්මවීමට පමුණුවන මගත් යන සතර ආර්ය සත්‍යයන් මග නුවණින් දන්නේද, ඒකාන්තයෙන්ම මෙය නිවන ට පිහිට වේ. මෙය උතුම් පිහිට වේ. තෙරුවන් සරණ යෑම හා චතුස්සත්‍යාවබෝධය යන මේ සරණ නිසා දුකින් මිදේ." (ධ.ප. 189-192)*

නිර්වාණාවබෝධය ලබා සියලු දුකින් මිදුණු බුදුන් වහන්සේ පිළිබඳ සැක හැර පිළිගැනීම බුදුන් සරණ යාමෙන් චතුරාර්ය්‍ය සත්‍ය වටහාගෙන ආර්ය්‍ය අෂ්ඨාංගික මාර්ගයට අනුව ජීවිතය ගෙන යාම සිදු වේ. එසේම සංඝ රත්නයේ සරණ යාමෙන් මෙම මඟෙහි ගමන් කිරීමට අවශ්‍ය උදව්, අවබෝධය සහ මඟ පෙන්වීම ලබා ගැනීමත් අදහස් වෙයි. මෙසේ කිරීමෙන් කෙනෙකු බෞද්ධයෙකු බවට පරිවර්තනය වන අතර මෙය නිර්වානය කරා යන ගමනේ ප්‍රථම පියවරයි.

## ප්‍රශ්නය - ප්‍රථම වරට තෙරුවන් සරණ යාමේ සිට ඔබගේ ජීවිතය සිදු වූ වෙනස්කම් මොනවාද?

**පිළිතුර** - වසර 2500 ක් තිස්සේ ගණන් කළ නොහැකි තරමක් මිනිසුනට බුදු දහමෙන් පිහිටක් ලැබී ඇත. මටද එය එසේමය. මෙම කරදරකාරී ලෝකයේ අර්ථයක් නොමැති ජීවිත බුදු දහමෙන් අර්ථ ගන්වා ඇත. මටද එය එසේමය. මානුෂිකත්වය යනු කුමක්දැයි එමගින් මට හඳුන්වා දී ඇත. මෛත්‍රී සහගත සදාචාරාත්මක ජීවිතයක අගය මම දකිමි. එමගින් මේ භවයේ නොවුවහොත් මතු භවයේදී හෝ මගේ ජීවිත පිරිසිදු භාවයටත්, පූර්ණත්වයටත් පත් කර ගන්නා අයුරු මට පෙන්වා දී ඇත.

ඉන්දියාවේ ජීවත් වූ එක් කවියෙක් මෙසේ කියා ඇත.

*"උන්වහන්සේ සරණ යාමට, උන්වහන්සේගේ ගුණ ගැයීමට, උන්වහන්සේට ගරු කිරීමට සහ උන්වහන්සේගේ ධර්මයට අනුව අචලව සිටීමට අවශ්‍ය වනුයේ අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමයි."*

මම මෙම අදහස සමඟ සපුරාම එකඟවෙමි.

## ප්‍රශ්නය - මගේ මිතුරෙක් නිතරම මා ඔහුගේ ආගමට හරවා ගැනීමට වෙහෙසෙයි. එම ආගමට මාගේ කැමැත්තක් නැති අතර ඔහුගෙන් ගැළවී සිටීමද තරමක් අසීරුය. මා කුමක් කළ යුතුද?

**පිළිතුර -** ඔබ අවබෝධ කරගත යුතු පළමු කාරණය නම් ඔහු සැබෑ මිතුරෙකු නොවන බවයි. සැබෑ මිතුරෙකු නම් ඔබ ඔබම ලෙස බාරගන්නා අතර ඔබේ අදහස්වලට ගරු කරයි. මා සිතන විදියට මොහු ඔබට මිතුරු වෙසක් පෙන්වා ඔහුගේ ආගමට හරවා ගැනීමට සිතන තැනැත්තෙක් බවයි. යමෙක් ඔහුගේ මතය තවත් අය මත බලෙන් පටවයි නම් සැබැවින්ම ඔහු සැබෑ මිතුරෙක් නොවේ.

## ප්‍රශ්නය - නමුත් ඔහු කියා සිටින්නේ ඔහුගේ ආගමික අදහස් මාත් සමග බෙදා ගත යුතු බවයි.

**පිළිතුර -** ඔබගේ ආගමික අදහස් අන් අය සමඟ බෙදා හදා ගැනීම හොඳ දෙයකි. නමුත් මට හිතෙන ආකාරයට ඔබගේ මිතුරා අදහස් බෙදා හදා ගැනීම සහ බලෙන් පැටවීම අතර වෙනස නොදකියි. ඔබ ළඟ ඇති ඇපල් ගෙඩියකින් අඩක් මා ඔබට දුන් විට මම එය පිළිගනියි නම් එය බෙදා හදා ගැනීමකි. නමුත් මා ඔබට "බොහෝම ස්තූතියි. මම දැන් කෑවා" යනුවෙන් කියද්දීත්, ඉතා බලෙන් මෙන් මා හට එය දෙයි නම් මෙවැනි දෙයක් බෙදා හදා ගැනීම යයි කීමට තරමක් අසීරුය. ඔබගේ යහළුවන් වැනි අය ඔවුන් තුළ ඇති නරක පුරුදු බෙදා හදා ගැනීම, ප්‍රේමය හෝ පරිත්‍යාගය යනුවෙන් හඳුන්වයි. කුමන නමක් භාවිතා කළද ඔවුන්ගේ හැසිරීම ග්‍රාම්‍යය.

## ප්‍රශ්නය - මා ඔහුව වළක්වන්නේ කෙසේද?

**පිළිතුර -** එය ඉතා සරල දෙයකි. පළමුව ඔබේ සිතට අවශ්‍ය දේ පිළිබඳව නිරවුල්ව දැන ගන්න. දෙවනුව කෙටියෙන් පැහැදිළිව ඒ ගැන ඔහුට කියන්න. තෙවනුව ඔහු ඔබෙන් මෙසේ අසනු ඇත. "ඔබ මාත් සමග එකඟ නොවන්නේ ඇයි?" නැතිනම් "මේ ගැන ඔබට ඇති විශ්වාසය කුමක්ද?" වැනි ප්‍රශ්න අසනු ඇත. එවිට පැහැදිළිවත් විනීත ලෙසත් ඔබගේ අදහස් වෙනස් නොකර මෙසේ කියන්න. "ඔබගේ ආරාධනාවට බොහෝම ස්තූතියි. නමුත් මට එය කළ නොහැකියි."

"ඇයි ඒ?"

"එය මට අයත් වැඩකි. ඒ නිසා මට එය කළ නොහැකි දෙයකි."

"නමුත් එහි බොහෝ ප්‍රිය ජනක පුද්ගලයන් ඉන්නවා."

"එය සත්‍යය විය හැකියි. නමුත් මට එය කළ නොහැකි දෙයකි."

"මම ඔබට ආරාධනා කරන්නේ ඔබගේ ආරක්ෂාව සහතික කරමිනුයි."

"ඔබ මා ආරක්ෂා කරන බව සතුටට කරුණක්. නමුත් මට එය කළ නොහැකියි." ඉවසීමෙන් සහ ස්ථිර අදිටනින් නැවත නැවතත් ඔබ එය ප්‍රතික්ෂේප කළ විට ක්‍රමයෙන් ඔහු ඔබ සමඟ මේ පිළිබඳව සාකච්ඡාවෙන් මග හැර සිටිනු ඇත. මෙසේ කිරීම ඔබට ලජ්ජාවට කරුණක් වුවත් කෙනෙකුට බලහත්කාරයෙන් තම මතයක් අනුන් වෙත පැටවීමට නොහැකි බවට ඔවුන්ට තේරුම් ගැනීමට ඉඩ ප්‍රස්ථාවක් ලැබීම හොඳ දෙයකි.

## ප්‍රශ්නය - බෞද්ධයෝ ධර්මය අන් අය සමග සාකච්ඡා කිරීමට, බෙදාගැනීමට උත්සාහ ගත යුතුද?

**පිළිතුර** - සත්තකින්ම එය කළ යුතුය. මා සිතන අයුරින් බොහෝ බෞද්ධයෝ අන් මතයන් යමෙකු හට බලෙන් පැටවීමටත්, සාකච්ඡා කොට අදහස් බෙදා හදා ගැනීමත් අතර වෙනස හොඳින් හඳුනති. යමෙක් බුදු දහම ගැන ඔබෙන් විමසා සිටියහොත් ඒ ගැන කියන්න. ඔවුන් නැසුවද බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ගැන ඔබට ඕනෑම කෙනෙකුට කිව හැකිය. නමුත් වචනයකින් හෝ ඉරියව්වකින් හෝ ඔවුන් ඊට එකඟතාවයක් නොදක්වයි නම් ඔබ ඔවුන්ගේ අදහස්වලට විරුද්ධ නොවී ඊට ගරු කරන්න. කෙනෙකුට ධර්ම දේශනා කරනවාට වඩා ඔබගේ හැසිරීම ධර්මයට අනුකූල කර ගැනීම වඩා වැදගත් වන්නේ ඊට ප්‍රබල මෙහෙවරක් කළ හැකි බැවිනි. ධර්මය යනු අනුන්ගේ සුව පහසුව සලසන, කාරුණික, අන් මතයන්ට විරුද්ධව ක්‍රියා නොකරන, සෘජු සහ අවංක දෙයක් බව අන් අයට පෙන්වන්න. ඔබගේ කතාවෙන් සහ ක්‍රියාවෙන් ධර්මය බබලවන්න. ඔබත් මමත් සමග අප හැමෝම ධර්මය හොඳින් දන්නේ නම් එය හොඳින් පුහුණු වන අතරම අන් අය සමග නොමසුරුව බෙදා හදා ගැනීමටද කටයුතු කරනු ඇත. අපේම ජීවිතවලටත් අන් අයටත් පිහිට වීමට එමගින් ඉඩ සැලසෙනු ඇත.

# 14. දහම පිළිබඳ බුදුන් වහන්සේගේ කියමන්

''ප්‍රඥාව සීලයෙන් පවිත්‍ර වේ. සීලය ප්‍රඥාවෙන් පවිත්‍ර වේ. මින් එකක් ඇති තැන හැම විටම අනෙකද ඇත. සීලවන්තයා තුළ ප්‍රඥාවත්, ප්‍රඥාවන්තයා තුළ සීලයත් ඇත. මේ දෙකේ එකතුව ලොවේ ඇති අග්‍රගණ්‍යම දෙය ලෙස සැලකේ.'' (දී.නි I,84)

''සියලු චෛතසික ධර්මයෝ හිත පෙරටු කොට පවතී. සිත විසින් පාලනය කරයි. සිතෙන්ම උපදියි. කිසිවෙකු පිරිසිදු සිතින් කියන්නේ හෝ කරන්නේ නම්, සිරුර අතහැර නොයන සෙවනැල්ල සේ සතුට ඔහු පසු පස යයි.'' (ධ.ප 2*

''කුමන හේතුවක් නිසාවත්, කුමන අවස්ථාවකදීවත් කිසිවෙකු විසින් අන් කෙනෙකුට නින්දා හෝ අවමන් නොකළ යුතුය. ක්‍රෝධය නිසා හෝ විරෝධය නිසා, අන් කෙනෙකුට වේදනාවක් ප්‍රාර්ථනා නොකළ යුතුය.'' (සු.නි 149*

''මහා සාගරය පුරාම ඇත්තේ එකම රසකි. එනම් ලුණු රසයයි. එසේම ධර්මය පුරාම ඇත්තේ එකම රසකි, එනම් විමුක්ති රසයයි.'' (උදාන 56)

''අනුන්ගේ වරද පහසුවෙන් දකින මුත්, තමාගේ වරද දැකීම අපහසුය. අනුන්ගේ වරද දහයියා මෙන් පොළමින්, දක්වන අතර තමාගේ වරද දඩයම්කරුවෙක් මුවාවී සිටිනවා මෙන් සඟවා ගනී. අනුන්ගේ වැරදි සොයන එවැනි පුද්ගලයන් අප්‍රිය ජනක වන අතර, ඔවුන්ගේ ආශ්‍රව වැඩිවේ. නිවන් මාර්ගයෙන් ඈත් වේ.'' (ධ.ප 252-3)

''මල් ගොඩකින් මල් දම් රැසක් සෑදිය හැකි සේ මිනිසත් බව ලැබූ සත්වයෙකුට බොහෝ කුසල් කළ හැක.'' (ධ.ප 53)

''ඔබ සුදුසු කල්හි හෝ නොකල්හිද, දත්තානුකූලව හෝ නැතිවද, මෘදුව හෝ පරුෂවද, කාරණාවට අනුකූලව හෝ නැතිවද, දයාබර සිතින් හෝ නපුරු සිතින්ද අන් අය හා කතා කළ හැක. එනිසා, ඔබ මෙලෙස පුරුදු පුහුණු විය යුතුය. 'අපගේ සිත් මුලා නොවිය යුතුය. අප අයහපත් වචන කතා නොකළ යුතුය. අපගේ සිත වෛරයෙන් මිදී සෙනෙහසින් පිරි සිතින් කරුණාවෙන් හා මෛත්‍රියෙන් දිවි ගෙවිය යුතුය. අප පළමුව එක් අයෙකු වෙත මෛත්‍රිය වඩන්නට පටන්ගෙන ඉන්පසුව සියලු ලෝක සත්වයන් වෙතම ද්වේෂයෙන් හා වෛරයෙන් සම්පූර්ණයෙන්ම තොර වූ අප්‍රමාණ මෛත්‍රිය පැතිරිය යුතුය. ඔබගේ සිත පුරුදු පුහුණු කරගත යුත්තේ මෙලෙසය'' (ම.නි I,126)

"ප්‍රඥාවන්තයා කරුණු තුනක් නිසා හැඳිනගත හැක. එම කරුණු තුන නම්, ඔහු තම දුර්වලකම් ඇති සැටියෙන්ම දකියි. එසේ දැකීමෙන් ඒවා නිවැරදි කරගනී. අනෙක් පුද්ගලයන් තම දුර්වලතා පිළිගත් විට ඔවුනට සමාව දෙයි." (අ.නි I,103)

"සියලු අකුසලින් වැලකෙන්න, ගුණ ධර්මයන් දියුණු කරගන්න, චිත්ත පාරිශුද්ධිය ඇති කරගන්න. මෙය සියලු බුදු වරුන්ගේ අනුශාසනාවයි." (ධ.ප 183)

"කුඩා දොළ පහර කඳු හිඩැස් අතරින් ශබ්ද නගිමින් ගලා බසිත්, මහා ගංගාවෝ නිසොල්මන ගලා බසියි. හිස් දෙය ඝෝෂාකාරී වුවත්, පිරුණු දෙය හැමවිටම නිහඬය. අඥානයා අඩක් පිරුණ කලයක් වැනි අතර ප්‍රඥාවන්තයා නිසල පොකුණක් වැනිය." (සු.නි 720-1)

"නීච සාහසිකයන්, පලු කියතකින් ඔබගේ අත් පා එකිනෙක කපා වෙන්කරන විටකදී, ඔබගේ සිත ක්‍රෝධයෙන් පිරෙයි නම්, ඔබ මාගේ ධර්මය පුහුණු කරන්නෙකු නොවේ." (ම.නි 1,126)

"මෛත්‍රිය ඔස්සේ ඇති කරනු ලබන චිත්ත සාමය නොහොත් නිදහස් සිත පුරුදු පුහුණු කොට, වර්ධනය කර ගන්නේ නම්, තමාගේ පදනම හා වාහනය බවට පත් කර ගන්නේ නම්, සව්මත් කොට ගෙන නිසි පරිදි හසුරුවා ලන්නේ නම්, මතු දැක්වෙන එකොළොස් ආකාරයෙන් ඒ පුද්ගලයාට ආශිර්වාද ලැබෙන්නේය. ඔහු හෝ ඇය සතුටින් නිදා ගනියි. සතුටින් අවදි වෙයි. නරක සිහින නො දකියි. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. දෙවියන්ගේ බැල්ම ලබයි. ගින්නෙන්, විසෙන් හා ආයුධවලින් ආරක්ෂා වෙයි. පහසුවෙන් සිත එකඟ කර ගනියි. පැහැපත් මුහුණක් සහිත වෙයි. සාමකාමී ව පර ලොව යයි. මරණින් පසු යටත් පිරිසෙයින් දෙව් ලොව උපදියි." (අ.නි 342)

"තමාගේ හික්මීම, ආත්ම දමනය හා ඉඳුරන් සන්සිඳු වීම කර නොමැති කෙනෙකුට, අන් අයට හික්මීම, ආත්ම දමනය හා ඉඳුරන් සන්සිඳුවීම පුහුණු කිරීම අපහසුය. නමුත් තමාගේ හික්මීම, ආත්ම දමනය හා ඉඳුරන් සන්සිඳුවීම කර ඇති අයෙකුට, පහසුවෙන් අන් අයට එසේ කිරීමට කියා දිය හැක."(ම.නි I,45)

"සන්තුෂ්ටිය උතුම්ම ධනය වේ." (ධ.ප 204)

"අන්‍යයෝ මා (බුදුන් වහන්සේ), ධර්මය හෝ සංඝයා විවේචනය කරයි නම්, ඔබ එය පිළිබඳව අමනාප හෝ උරණ නොවන්න. එසේ වුවොත්, එයින් ඔබගේ විචාර බුද්ධිය අඳුරු වෙයි. එවිට ඔබට ඔවුන් පවසන දෙයෙහි වැරදි හෝ නිවැරදි බව වටහා ගැනීමට අපහසුය. කිසිවෙකු මෙසේ (තෙරුවන්) විවේචනය කළහොත් එවිට ඔබ එහි ඇති සදොස් බව හා අපගේ නිවැරදි පිළිවෙත පිළිබඳව ඔවුනට වටහා දෙන්න.

අන්‍යයෝ මා (බුදුන් වහන්සේ), ධර්මය හෝ සංඝයා වර්ණනා කරන්නේ නම්, එවිට ඔබ එය පිළිබඳව ආඩම්බර හෝ උඩඟු නොවන්න. එසේ වුවොත් එයින් ඔබගේ විචාර බුද්ධිය අඳුරු වෙයි. එවිට ඔබට ඔවුන් පවසන දෙයෙහි වැරදි හෝ නිවැරදි බව වටහා ගැනීමට අපහසුය. කිසිවෙකු මෙසේ (තෙරුවන්) වර්ණනා කළහොත් එවිට ඔබ එහි ඇති නිදොස් බව මෙන්ම අපගේ නිවැරදි මාර්ගය හා නිවැරදි පිළිවෙත පිළිබඳව ඔවුනට වටහා දෙන්න.'' (දී.නි I,3)

''පවසන වදනෙහි ගුණ පහක් තිබේ නම් එවිට එය නිදොස්, නිවැරදි, ප්‍රශංසනීය හා නුවනැත්තන් විසින් ප්‍රශංසාවට ලක්කරන්නේ වේ. එම ගුණ පහ නම්, පවසන වදන් නිවැරදි කාලයේ පැවසීම. සත්‍යය වීම. මෘදු සිතින් යුතුව පැවසීම. නියමිත කරුණට අදාළ වීම හා මෛත්‍රියෙන් යුතුව පැවසීමයි.'' (අ.නි III,243)

''ගැඹුරු විල නිසසල හා පැහැදිලි වේද, එලෙසම නුවනැත්තෝ සද්ධර්මය ශ්‍රවනය කර මුලුමනින්ම නිවුනා වේ.'' (ධ.ප 82)

''අනාවරණයක් නිසා නොපිළිගන්න. සම්ප්‍රදාය නිසා හෝ අසන්නට ලැබුණු නිසා, පොත්වල කියැවෙන නිසා, තර්කානුකූල නිසා, අනුමානයෙන් ගත හැකි නිසා, ගුරුවරයාගේ අධිකාරය නිසා නොහොත් 'මේ අපගේ ගුරුවරයා යයි සිතන නිසා හෝ නොපිළිගන්න. එසේ නොව යමක් හොඳ යයි, අගය කළ යුතු යයි, ප්‍රඥාවන්තයින් විසින් පසසන ලද්දේ යයි, බාර ගෙන පිළිපැද්ද හොත් ඔබගේ සැපතට හා ශුභ සිද්ධියට හේතු වන බව ඔබට ම වැටහෙන්නේ නම් එට බාර ගත යුතුය.'' (අ.නි I,190)

''වරක් දබර කරන භික්ෂූන් පිරිසකට බුදුන් වහන්සේ මෙසේ අවවාද කළහ. 'එකිනෙකාට විනීත ලෙස සැලකීමට, ගරු කිරීමට, ආචාර සම්පන්න වීමට, සතුන්ට පිළිවන් නම් ඔබටත් එසේ කළ හැකි විය යුතුය.'' (වි II,162)

''ධනය විනාශ වීම එතරම් අලාභයක් නොවූවත් ප්‍රඥාවට හානි වීම විශාල හානියකි. ධනය ලැබීම එතරම් සැලකිය යුතු නොවූවත්, ප්‍රඥාව ලැබීම ඉතා අගනාය.'' (අ.නි I,15)

''ප්‍රමාදී භික්ෂුවක්, සද්ධර්මය හඬ නගා කියතත්, ඒ අනුව පිළිපදින්නේ නැති නම්, හෙතෙම අනුන්ගේ ගවයන් රකින ගොපල්ලෙකු මෙන් මහණකමේ ඵල නොලබයි.'' (ධ.ප 19)

''මවක් තම එකම දරුවා, දිවි හිමියෙන් රකිනවා සේම ලොව වෙසෙන සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රිය වඩන්න.'' (සු.නි 149)

"අන්‍යයන්ට අවවාද කිරීමට සැරසෙන කෙනෙකු, පළමුව සිහි බුද්ධියෙන් මෙසේ සිතා බැලිය යුතු වේ. 'මා කයේ හා වචනයේ පිරිසිදු බව හොඳින් පුහුණු කර තිබේද නැතිද?' එසේ නොමැති නම් 'ඔබ පළමුව කයේ සහ වචනයේ පිරිසිදු බව වඩන්න' යැයි අන්‍යයෝ පැවසීම පුදුමයක් නොවේ. එසේම අන්‍යයන්ට අවවාද කිරීමට සැරසෙන අයකු එයට පළමුව මෙසේද සිතා බැලිය යුතුවේ. 'මා ව්‍යාපාදය නැති කර, අන් අය කෙරේ මෛත්‍රිය දියුණු කර තිබේද? මා තුළ මේ ගුණ තිබේද හෝ නොතිබේද? එසේ නොමැති නම්, 'පළමුව ඔබ මෛත්‍රිය දියුණු කරන්න' යැයි අන්‍යයෝ පැවසීම පුදුමයක් නොවේ. කවරෙකු හෝ උදයේ, දහවලේ හා රාත්‍රියේ යන තුන් කල්හිම දැහැමි බව වැඩි දියුණු කරගනී නම්, ඔහු තුන් කල්හිම සතුටින් වාසය කරයි." (අ.නි V,79)

"උදේ, දහවල සහ හැන්දෑවේ ධාර්මිකව ජීවත්වෙන කවුරු වුවත් ප්‍රීතිමත් උදයක්, ප්‍රීතිමත් දහවලක් සහ ප්‍රීතිමත් හැන්දෑවක් ගත කරන්නෝය." (අ.නි I,294)

"කවරෙකු විසින් හෝ ඔබට පරිභව කරයි නම්, පහර දෙයි නම්, ගල් මුගුරුවලින් ගසයි නම්, පොල්ලකින් හෝ කඩුවකින් පහර දෙයි නම් එවිට ඔබ කළ යුත්තේ සිතේ ඇති සියලුම ලෞකික අපේක්‍ෂාවන් පසෙකට දමා මෙසේ සිතීමයි. 'මාගේ හදවත නොසැලෙන්න. මාගේ මුවින් නපුරු වදන් පිට නොවන්න, මාගේ සිතේ අමනාපයක් ඇති නොවන්න. එසේම සියලු සතුන් කෙරෙහි කරුණාව හා මෛත්‍රිය ඇතිවන්න." (ම.නි I,126)

"දියාලුවෝ ඇවැසි තැනට ජලය ගෙනයති. හී වඩුවෝ ඇවැසි පරිදි හී දඬු නවති. ලී වඩුවෝ ඇවැසි පරිදි දැව හැඩ ගස්වති. එසේම නුවණැත්තෝ සිත දමනය කරති." (ධ.ප 80)

"තමන්ගේ සහෝදර භික්ෂූන් සමග සාමයෙන් වාසය කරන්නට සමත් වන්නේ කෙසේ දැයි අනුරුද්ධ තෙරුන්ගෙන් බුදු හිමියෝ විචාළහ. උන් වහන්සේ පිළිතුරු වශයෙන් පැවසුවේ අධ්‍යාත්මික ජීවිතයේ එබඳු සහායකයන් සමග සිටින්නට ලැබීම කොතරම් ආශිර්වාදයක් දැයි කල්පනා කරන බව ය. ඔවුන් සමග පෞද්ගලික වත් ප්‍රසිද්ධියේත් මෛත්‍රියෙන් කතා කරන බව ය. මගේ අපේක්ෂා ඉවත ලා ඔවුන්ගේ අපේක්ෂා අනුව ක්‍රියා කරන බව ය. එසේ හෙයින් අපි සිරුරු වශයෙන් බොහෝ දෙනකු වුවත් මනසින් එක් කෙනෙක් වන්නෙමුයි ද කීහ." (ම.නි III,156)

"මේ ලෝකයේ කොටස් හතරක් දැකිය හැකිය. එනම්, තමන්ගේ මෙන්ම අනුන්ගේත් අභිවෘද්ධිය පිළිබඳව නොසිතන පුද්ගලයෝ. තමාගේ නොව් අනුන්ගේ අභිවෘද්ධි පමණක් සිතන පුද්ගලයෝ. අනුන්ගේ නොව, තමාගේ අභිවෘද්ධිය පමණක් සිතන පුද්ගලයෝ හා තමාගේ මෙන්ම අනුන්ගේත් අභිවෘද්ධිය පිළිබඳව සිතන පුද්ගලයෝ.

මේ පුද්ගලයන් කොටස් හතර අතරින් තමාගේ මෙන්ම අනුන්ගෙත් අභිවෘද්ධිය සිතන පුද්ගලයෝ ප්‍රධාන වේ. උසස් වේ හා ඉහලින්ම සිටියි." (අ.නි ෂෂල94)

"ඔබ බුදුන්, දහම්, සඟුන් යන තෙරුවන් සරණ යන්නේ නම්, එවිට ඔබ බියෙන් හා තැති ගැනීමෙන් මිදුනා වේ." (ස.නි ෂ,220)

"ක්‍රෝධී පුද්ගලයා මෛත්‍රියෙන්ද, අයහපත් පුද්ගලයා යහපතින්ද, ලෝභී පුද්ගලයා දානයෙන්ද, අසත්‍යවාදී පුද්ගලයා සත්‍යයෙන්ද ජය ගත හැකිය." (ධ.ප 223)

"මෛත්‍රිය හා ගෞරවය, සහයෝගය හා එකඟතාව, සාම්‍යය හා එකමුතුව වර්ධනය කරන්නා වූ කරුණු සයක් ඇත. ඒ සය කෙසේ ද? කෙනකු සිය අධ්‍යාත්මික ජීවිතයේ සහායකයන් කෙරෙහි පෞද්ගලික වත් ප්‍රසිද්ධියේත් මෛත්‍රියෙන් ක්‍රියා කිරීම එකකි. කෙනකු ඔවුන්ට ප්‍රසිද්ධියේත් පෞද්ගලික මෛත්‍රියෙන් කතා කිරීම තවෙකකි. ඔවුන් පිළිබඳ ව ප්‍රසිද්ධියෙත් පෞද්ගලික මෛත්‍රියෙන් සිතීම එකකි. තමන් විසින් සාධාරණව ලබා ගත් පාත්‍රයට ලැබුණු තමාගේ දිනය පමණක් වුව කවර දෙයක් හෝ කිසි පිරිමැස්මක් නැතිව ඔවුන් සමග බෙදා ගැනීම තවෙකකි. ප්‍රාඥයන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූත්, චිත්තේකග්‍රතාවට අනුරූප වූත්, සාමයට නැඹුරු වූත්, අඛණ්ඩ වූත් පරිපූර්ණ වූත්, ගුණධර්ම අනෙක් අය සමග හිමිකර ගෙන සිටීම එකකි. කෙනකු සිය උත්තම දිවියේ සගයන් සමග පෞද්ගලික වත් ප්‍රසිද්ධියේත් නිදහස කරා යොමු වූත් දුක සම්පූර්ණ යෙන් නැසීමට තුඩු දෙන්නාවූත් උදාර අවබෝධයක් තිබීම තවත් එකකි. එසේ කල්හි මෛත්‍රිය හා ගෞරවය, සහයෝගය හා එකඟතාව, සාම්‍යය හා එකමුතුව හට ගනු ඇත." (ම.නි I,322)

"උතුම් දහමට ගරු කරන්නාවූත්, වචනයෙන් ක්‍රියාවෙන් හා සිතින් පිරිසිදු වූත් නිරන්තරයෙන් සාමකාමී වූත් නිසි අවධානයෙන් හා සංවරයෙන් යුතු වූත් මුදු ගුණයෙන් යුතු පුද්ගලයෝ නිසි ලෙස ලොව දිවි ගෙවන්නෝය." (ජා. III,442)

"සිතින්, වචනයෙන් හා ක්‍රියාවෙන් යහපත් පුද්ගලයෙක් වේ නම් ඔහු තමාගේ ම කල්‍යාණ මිත්‍රයෙක් වන්නේය. ඔවුන් 'අපි අප ගැන නොතකන්නෙමු' යයි කියන්නටත් ඉඩ ඇත. එසේ වුවත් ඔවුහු ඔවුන්ගේ කල්‍යාණ මිත්‍රයෝ වන්නාහ. එසේ කියන්නේ ඇයි ? තුන් වැනි පක්ෂයකින් තමාට කරන විදියට ම ඔවුන් තමා ගැන ක්‍රියා කරන හෙයින්ය."(**ස.නි** I,71)

"කිසි විටෙකත් කුසලය පිළිබඳව 'එය එසේ සිදුවිය නොහැක' යැයි සුළුවෙන් නොසිතන්න. බිඳුවෙන් බිඳුව වැටීමෙන් දිය බඳුනක් පිරෙන්නා සේම, නුවණැත්තා ටිකින් ටික කුසලයෙන් තමා පුරවා ගනී." (ධ.ප 122)

"එකල්හි, අතීසාරය වැලඳුන එක්තරා භික්ෂුවක් තම අසූචි මතම වැටී වැතිර සිටියේය. විහාර චාරිකාවේ යෙදුන බුදුන් වහන්සේ, ආනන්ද හිමි සමගින් එම භික්ෂූන් වහන්සේ සිටි කුටියට පැමිණියහ. එහිදී බුදුන් වහන්සේ හා එම භික්ෂුව අතර මෙම සංවාදය ඇති විය.

"භික්ෂුව ඔබට කුමක් සිදු වී ඇතිද?"

"හිමියනි, මට අතීසාරය වැළඳී ඇත"

"ඔබට උපස්ථාන කිරීමට කිසිවෙකු නැත්ද?"

"නැත ස්වාමීනි"

"අනෙක් භික්ෂූන් ඔබට උපස්ථාන නොකරන්නේ කුමක් නිසාද?"

"ඔවුනට මගෙන් කිසි ප්‍රයෝජනයක් නොමැති නිසා."

එවිට ආනන්ද හිමියන් ඇමතූ බුදුන් වහන්සේ මෙලෙස පැවසීය.

"ආනන්ද, මෙම භික්ෂුව සේදීමට ජලය ගෙන එන්න."

එලෙස ආනන්ද හිමි ගෙනා ජලයෙන් බුදුන් වහන්සේ ආනන්ද හිමි හා එක්ව, එම භික්ෂුව පිරිසිදු කර ඔසවාගෙන ගොස් ඇඳක් මත තැබූහ. පසුව රැස්ව සිටි භික්ෂූන් ඇමතූ බුදුන් වහන්සේ එම භික්ෂුවට උවටැන් නොකළේ මන්දැයි විමසීය. එයට පිළිතුරු වශයෙන් "ඔහුගෙන් අපට ප්‍රයෝජනයක් නැති නිසා" යැයි රැස්ව සිටි භික්ෂූහු පැවසූහ. එවිට ඔවුන් ඇමතූ බුදුන් වහන්සේ "මහණෙනි, ඔබව උවටැන් කරන්නට දෙමව්පියන් නොමැතිය. ඔබ එකිනෙකාට එසේ උවටැන් නොකරයි නම්, ඔබට කවරෙක් සිටීද?" යැයි පැවසීය. බුදුන් වහන්සේ තව දුරටත් මෙසේ පැවසූහ. 'යමෙක් ගිලනුන්ට උපස්ථාන කරයිද, එය මට උපස්ථාන කිරීම හා සමානය.' (වි. IV,301)

"උතුම්ම ආමිස දානය ධර්ම දානයයි." (ධ.ප 354)

"තමන්ට ලැබෙන ලාභයක් පිළිබඳ ව සතුටට ප්‍රමෝදයට පත් වන්නාක් මෙන් ම අනෙකකුට ලැබෙන ලාභය සම්බන්ධයෙන් ද සතුටට හා ප්‍රමෝදයට පත් විය යුතු ය." (ස.නි. II,198)

"මා ධර්මය දේශනා කොට ඇත්තේ විවෘත හෝ සැඟවුණු ඉගැන්වීම් කිසිවක් ගැන කල්පනා කර නො වේ. මා විසින් තබා ගත් ගුරු මුෂ්ටි කිසිවක් නැත." (දී.නි II,100)

"මගේ ඇවෑමෙන් පසු ධර්මය ඔබගේ ගුරුවරයා කර ගන්න." (ධ.ප II,154)

"විටින් විට තමන්ගේ දුර්වලතා මෙනෙහි කිරීම යහපතකි. විටින් විට අන් අයගේ දුර්වලතා මෙනෙහි කිරීම යහපතකි විටින් විට තමාගේ ගුණ දම් මෙනෙහි කිරීම යහපතකි විටින් විට අන් දයගේ ගුණ දම් මෙනෙහි කිරීම යහපතකි" (අ.නි 160)

"කුසල් වැඩූ පුද්ගලයා මෙලොවදී සතුටු වෙයි. පරලොවදීත් සතුටු වෙයි. මෙලොව, පරලොව යන දෙලොවදීම සතුටු වෙයි. තමා කළ කුසල් මෙනෙහි කිරීමෙන් බොහෝ ලෙස සතුටු වෙයි." (ධ.ප 16)

"අකුසලින් මිදෙන්න. එසේ අකුසලින් මිදිය හැක. එසේ මිදීමට නොහැකි නම්, අකුසලින් මිදෙන ලෙස මා ඔබට දේශනා කරන්නේ නැත. නමුත් අකුසලින් මිදිය හැක. එනිසා 'අකුසලින් මිදෙන්න' යැයි දේශනා කරමි. අකුසලින් මිදීම දුකට හා හානියට හේතු වේ නම් එලෙස කරන ලෙස දේශනා නොකරමි. නමුත් එය සතුටට හා ශුභ සිද්ධියට හේතු වන බැවින් 'අකුසලින් මිදෙන්න' යැයි දේශනා කරමි. කුසල් වඩන්න. එසේ කිරීමට පුළුවන. එසේ කිරීමට නොහැකි නම් 'කුසල් වඩන්න' යැයි දේශනා නොකරමි. අකුසලින් මිදීම දුකට හා හානියට හේතු වේ නම් එලෙස කරන ලෙස දේශනා නොකරමි. නමුත් එය ඔබගේ සතුටට හා ශුභ සිද්ධියට හේතුවන බැවින් 'කුසල් වඩන්න' යැයි දේශනා කරමි." (අ.නි I,58)

"සියලු සත්වයෝ දඬුවමින් තැති ගනිති. සියල්ලන්ටම ජීවිතය ප්‍රියය. එබැවින්, තමා උපමාවට ගෙන කිසිදු සත්වයෙක් නොමරන්න. අනුන් ලවාද නොමරවන්න." (ධ.ප 130)

"සත් පුරුෂයා හිමවත් කන්ද සේ දුරටත් ප්‍රකට වේ. අසත් පුරුෂයා රාත්‍රියේ විදිනා ලද ඊයක් මෙන් අප්‍රකට වේ."(ධ.ප 304)

"කැඩපතකින් ඇති ප්‍රයෝජනය කුමක්ද? ඒ ගැන ඔබ කුමක් සිතන්නේද? යැයි බුදුන් වහන්සේ රාහුල හිමිගෙන් විමසීය. 'පිළිඹිබුව බැලීම' යැයි රාහුල හිමි පැවසීය. එවිට බුදුන් වහන්සේ 'එසේම, සිත, කය හා වචනයෙන් ක්‍රියා කළ යුත්තේද, හොඳින් කල්පනා කොට සිතා බැලීමෙන් පසුව යැයි දේශනා කළහ." (ම.නි I,415)

"දුන්නක් මෙන් නැමෙන්න. උණ ගසක් මෙන් නැමෙනසුලු වන්න. එවිට ඔබ කිසිවකු සමග නොගැටෙනු ඇත."(ජා VI,295)

"ගංගානම් නදිය පෙරදිගට යොමුව, නැඹුරුව ගලා යනවා සේම ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනා පුද්ගලයා නිවන් මගට යොමුව, නැඹුරුව එදෙසට ගලායයි." (ස.නි V,40)

"යහපත් පුද්ගලයෝ සැබැවින් ම කෘතවේදී වන්නාහ." (විනය IV,55)

"ඔහු මට අපවාද කළේය, පහර දුන්නේය, මා පැරදවිය, මා සතු දෙය පැහැර ගත්තේය යැයි නිතර සිතමින් සිටිනා පුද්ගලයාගේ වෛරය කෙදිනකවත් නොසංසිදෙයි. නමුත් යමෙකු එවැනි සිතිවිලිවලින් මිදෙයි නම්, ඔහුගේ වෛරය සංසිදෙයි. මේ ලෝකය තුළ, වෛරය වෛරයෙන් නැතිකල නොහැකිය. වෛරය නැති කළ හැක්කේ මෛත්‍රියෙනි. මෙය සනාතන සත්‍යයකි." (ධ.ප 3-5)

"දැහැමි පුද්ගලයාට හැම දිනයක් ම විශේෂ දිනයක් වන්නේය. හැම දිනයක් ම ශුද්ධ වූ දිනයක් වන්නේය."(ම.නි I,39)

"මනාව හැඳ පැළඳ සිටියත්, පුද්ගලයෙක් සාමකාමී වන්නේ ද, සංවර වන්නේ ද, ශුද්ධ වූ ජීවිතයට කැප වූයේ ද, සකල සත්වයන්ට හානියක් නොකරන්නේ ද, ඒ පුද්ගලයා ශ්‍රමණයෙක් වන්නේය. සැබැවින් ම පැවිද්දෙක් වන්නේය." (ධ.ප 142)

"අනෙකුන් විනිශ්චය කරන්නෙක් නො වන්න. අනෙකුන් විනිශ්චයට නො යන්න. කවුරුන් හෝ අනෙකුන් විනිශ්චය කරන්නේ නම් ඔවුහු තමන්ට ම වළක් කපා ගන්නෝය." (අ.නි හIII,351)

බුදුරජාණන් වහන්සේ අනුරුද්ධ මහරහතන් වහන්සේගෙන් මෙසේ ඇසූ සේක. කෙසේ සහෝදර භික්ෂූන් සමග සමගිව සිටින්නේදැයි විමසූහ. ණීමම හැමවිටම මෙය කෙතරම් ආශිර්වාදයක් ද? මම මාගේ ආගමික ජිවිතය මෙබදු වු මිතුරු කැලක් සමග ගත කරන්නට ලැබීම කොතරම් ආශිර්වාදයක් ද? මම ඔවුන් සමග කතාව හා ක්‍රියාවන් පුද්ගලිකව හා ප්‍රසිද්ධියේ ආදරය පෙරටු කොටගෙන පවත්වමි. මම සැමවිටම මාගේ අවශ්‍යතා පසෙකට දමා ඔවුන්ගේ අවශ්‍යතා සොයා බලා ඒවා ඉටු කරමි. අපි බොහෝ දෙනා ශරීරයෙන් වෙනස් වුවත් මනසින් එකසිත්ව වාසය කරමු." (ම.නි -III-155)

ගැටුම් භයානක දෙයක් ලෙස දැක සමගියෙන් හා සාමයෙන් සහ කරුණාවන්ත හදවතින් වාසය කරමු. මෙය බුදුවරයන් වහන්සේලාගේ ඉගැන්වීමයි. (ච.පි 3,15,13)

ඔබ යමක් විශ්වාස කිරීමට පෙර මෙම කරුණ ගැන සැලකිලිමත් වන්න,දෙවියන් විසින් හෙලිදරව් කරන ලද නිසාවත් පරම්පරාවෙන් පරම්පරාවට ආ නිසාවත් කටකථා නිසාවත්, ආගමික ග්‍රන්ථවලින් නිසාවත් න්‍යායට ගැලපෙන නිසාවත් ගුරුවරයාගේ අධිකාරි බලය නිසා ඔහු අපගේ ගුරුවරයා නිසාවත් යමක් විශ්වාස නොකළ යුතුය. යම් මොහොතක ඔබම ඔබටම වැටහෙන්නේ නම් යමක් හොඳයි අගය කළහැකියි. මෙය නුවණැත්තන් විසින් වර්ණනා කරන ලදී. එසේම එය පිළිගෙන පුරුදු පුහුණු කරන්නේ නම් යම් විශ්වාසයක් ඔබේ යහපත හා සතුට සලසන්නේ නම් එම දහම පිළි ගැනීම සුදුසුයි.(අ I, 190)

වරෙක බුදුන් වහන්සේ කලහකාරි භික්‍ෂු පිරිසක් දැක මෙසේ දේශනා කල සේක. තිරිසන් ගත සත්වයෝ ආචාරශීලීව එකිනෙකාගේ වෙනස්කම් හඳුනාගෙන එකිනෙකා වෙත ආචාරශීලීව වෙසෙන්නේ නම් ඔබත් එසේ හැසිරිය යුතුය.(විII 162)

මනසේ නිදහස් ආදරය මෛත්‍රීය වැඩීමෙන් ගෙනඒමට වගා කිරීමෙන් දිගු කිරීමෙන් නිතර පුරුදු පුහුණු කිරීමෙන් ආදරය යමකුගේ වාහනය හා පදනම කරගන්නේ නම් ශක්තිමත් කරන්නේ නම නිවැරදි හුරු පුරුදු කරන්නේ නම් ඔහුට පහත දැක්වෙන එකොළොස් ආකාර ආශිර්වාද ලැබීමට හේතුවෙයි. ඔහු සුවසේ නිදයි, සුවසේ පිබිදෙයි, නරක සිහින නොදකියි, මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයන්ට ද ප්‍රිය වෙයි, දෙවියො ආරක්‍ෂා කරති, ඔහු ගින්නෙන් වසවිස වලින් තියුණු ආයුධවලින් ආරක්‍ෂා වෙයි, හිත පහසුවෙන් එකග වෙයි. දීප්තිමත් සමක් ලැබේ. සිහි මුලා නොවී මියයනු ලබයි, අවසන් වශයෙන් බ්‍රහ්ම ලෝකයේ උපත ලබයි.(අV,342)

මෙහි සියලුම ආශ්‍රේය ග්‍රන්ථ පාලි ග්‍රන්ථ සමිතිය මගින් ප්‍රකාශිත (Pali Text Society) ත්‍රිපිටකයයි.

# කතුවරයා ගැන

**1951දී** ඕස්ට්‍රේලියාවේදී ක්‍රිස්තියානි පවුලක උපත ලද පූජ්‍ය සාවත්තියේ ධම්මික හිමි **18** වන වියේදී බුදු දහම වැළඳගත්තේය. පැවිදිවීමේ අපේක්ෂාවෙන් යුතුව තායිලන්තය,ලාඕසය හා බුරුමය යන රටවල සංචාරය කළ උන්වහන්සේ අවසානයේ ඉන්දියාවට පැමිණියහ. එහිදී ඊළඟ වසර තුන ඇතුළත යෝග අභ්‍යාස හා භාවනා හදාරමින් ඉන්දියාවේ සංචාරය කළ අතර අනගාරික ධර්මපාල තුමන් විසින් ඉංදියොවේ ධර්මප්‍රචාරය සඳහා තෝරාගත් භික්ෂු පිරිසේ අන්තිම භික්ෂූන් වහන්සේ වූ මැටිවැල්ලේ සංඝරතන නා හිමියන්ගේ පැවිදි ශිෂ්‍යවරයෙකු ලෙස ඉංදියාවේ සාවත්තියේ දී පැවිදි බිමට ඇතුළත් විය. **1976** දී ශ්‍රී ලංකාවට වැඩමකොට මරදානේ ශ්‍රී ලංකා විද්‍යාල මහ පිරිවෙණෙන් පාලි භාෂාව හැදෑරූ අතර, මහනුවර නිල්ලඹේ භාවනා මධ්‍යස්ථානයේ සම ආදි කර්තෘ බවටද පසුව එහි ආචාර්ය වරයෙකු බවටද පත්වූහ. එතැන් සිට උන්වහන්සේ බොහෝ කාලයක් ගතකර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ හා සිංගප්පූරුවේය.

උන්වහන්සේ බුදු දහම හා සම්බන්ධ විෂයයන් අළලා ග්‍රන්ථ විසි පහකට වඩා වැඩි ප්‍රමාණයක්ද ඒ හා සම්බන්ධ ශාස්ත්‍රීය ලිපි රාශියක් ද ලියා ඇත. ඒ අතරින් *Good Question Good Answer* නම් කෘතිය භාෂා 31ට පරිවර්තනය කෙරිණ. ප්‍රකට ධර්ම කථිකයෙකු ද වන උන්වහන්සේ ථේරවාද බුදු දහම නියෝජනය කරමින් වර්ෂ **2000**දී ජර්මනියේ බාර්ලින් නුවර පැවති යුරෝපීය බෞද්ධ සහශ්‍රක සමුළුවද ඇමතූහ. බෞද්ධ දර්ශනය හා භාවනාව හැරුණු විට වන්දනා ගමන් පිළිබඳව ද ඉතා උනන්දුවක් දක්වන උන්වහන්සේ ඒ පිළිබඳව කෘති කිහිපයක් රචනා කළහ.

මහනුවර බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය මගින් ප්‍රකාශිත දඹදිව වන්දනාකරුන්ගේ මාර්ගෝපදේශනය සඳහා වූ කෘතිය දඹදිව වන්දනාව (*Middle Land Middle Way*) සිංහල හා ඉංග්‍රීසි යන දෙබසින්ම මුද්‍රිතය. ශ්‍රී ලංකාවේ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් *Sacred Island* කෘතිය හා බුද්ධගයා මාර්ගෝපදේශනය *Guide to Bodh Gaya* යන කෘති ඉංදියාවේ මහා බෝධි සමාගම මගින් ප්‍රකාශිතය. ඉන්දුනීසියාවේ ජාවා හි පිහිටි ශ්‍රේෂ්ඨ බෞද්ධ විහාරය පිළිබඳ තොරතුරු ඇතුළත් *Guide to Borobudur* යන කෘති ඒ අතර වේ..ඉංදියානු ඉතිහාසය,කලාව හා තෘණ විද්‍යාව පිළිබඳව ද උනන්දුවක් දක්වන උන්වහන්සේ දැනට සිංගප්පූරුවේ බුද්ධ ධම්ම මණ්ඩල සමිතියේ ආධ්‍යාත්මික අනුශාසකවරයෙකු ලෙස කටයුතු කරති.